# කාර්යසාධන වාර්තාව

# 2015

**විදේශ සම්පත් දෙපාර්තමේන්තුව**

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

©2015 විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
මහලේකම් කාර්යාලය (3 වැනි මහල)
තැ.පෙ 277
කොළඹ 00100
ශ්‍රී ලංකාව

info@erd.gov.lk
http://www.erd.gov.lk

# අන්තර්ගතය


සමස්ත විග්‍රහය 01

සංවිධාන ව්‍යූහය 03

විදේශ මූල්‍යයනය 06


# එක් එක් අංශයන්හි කාර්යසාධනය


ආසියානු සංවර්ධන බැංකුව 15

ජපානය, කොරියාව, තායිලන්තය, වියට්නාමය, මැලේසියාව සහ සිංගප්පූරුව අංශය 20
- ජපානය
- කොරියාව

ප්‍රාග්ධන වෙළඳපොළ, ලෝක බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් අංශය 31
- ප්‍රාග්ධන වෙළඳපොළ
- ලෝක බැංකුව

චීනය 38

මැදපෙරදිග රටවල් සහ සාර්ක් කලාපයේ රටවල් අංශය 41
- මැදපෙරදිග රටවල්
- සාර්ක් කලාපයේ රටවල්

රුසියාව, ඕස්ට්‍රේලියාව සහ බටහිර රටවල් අංශය 48

එක්සත් ජාතීන්ගේ සංවිධාන, ශිල්පීය ආධාර සහ රාජ්‍ය නොවන සංවිධාන අංශය 53
- එක්සත් ජාතීන්ගේ සංවිධාන
- ශිල්පීය ආධාර

ණය කළමනාකරණ අංශය 60

ප්‍රතිපත්ති සැලසුම් අංශය 63

මූල්‍ය විග්‍රහය 65

# දැක්ම

ඉහළ මධ්‍යම ආදායම් මට්ටමට ශ්‍රී ලංකාව ළඟා වීමේදී අවශ්‍ය වන ආර්ථික වර්ධනය උදෙසා විදේශ මූල්‍ය සම්පත් ඒකරාශී කිරීම හා කළමනාකරණයට උචිත දැනුමෙන් හා නිපුණත්වයෙන් මනාව පරිපූර්ණ වීම.

---

# මෙහෙවර

රටේ දිගුකාලීන ණය පිළිබඳ තිරසාරභාවය පවත්වාගෙන යමින් ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංවර්ධන වැඩසටහන් සඳහා අවම පිරිවැයක් දරා විදේශ මූල්‍ය ඒකරාශී කිරීම.

# අපේ සේවාවන්

- සංවර්ධන ව්‍යාපෘති හිතකර කොන්දේසි හා නියමයන් මත අවම පිරිවැයකින් හා අඩු අවදානමකින් යුතුව මූල්‍යයනය කිරීමට විදේශ මූල්‍ය සම්පත් ඒකරාශී කිරීම.

- විදේශ සම්පත් ඵලදායි අන්දමින් හා කාර්යක්ෂම ලෙස වැයයෝජනය කිරීමට පහසු වීම.

- දිගුකාලීන විදේශ ණය තිරසාරභාවයෙන් පවත්වා ගැනීමෙහිලා දායක වීම.

- විදේශ පුහුණු අවස්ථා ඵලදායී ලෙස උපයෝගී කර ගැනීම තුළින් රාජ්‍ය අංශයේ මානව සම්පත් සංවර්ධනය සඳහා දායක වීම.

- දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති වගකීම් සම්භාරය ඵලදායි ලෙස මෙන්ම සාර්ථක ලෙස ඉටු කිරීම උදෙසා දෙපාර්තමේන්තුවේ හැකියාවන් තවදුරටත් සවිමත් කිරීම.

# අපේ සාරධර්ම

- සියලුම අණ පනත්වලට අවනත වෙමින් හෘද සාක්ෂියට අනුකූලව කටයුතු කිරීම, ඉතා උසස් මට්ටමේ යහපාලනය, විනිවිදභාවය හා අනාවරණය පිළිබඳ ප්‍රතිපත්තීන් පිළිපදිමින් ආචාරශීලීව කටයුතු කිරීම.

- උසස් මට්ටමේ පුද්ගල එකමුතුභාවයට අනුකූලතාවයන් දක්වමින් පෞද්ගලික අභිලාෂයන්ට වඩා දෙපාර්තමේන්තුවේ අභිලාෂයන්ට ප්‍රමුඛස්ථානය දීම.

- කාර්ය මණ්ඩලයට ස්වකීය උපරිම කාර්යසාධන මට්ටම කරා ළඟාවීමට හැකිවන පරිදි සහ එම කාර්ය ප්‍රදර්ශනය කිරීමට හැකිවන ලෙස අන්‍යෝන්‍ය ගෞරවයෙන් හා විශ්වාසයෙන් කටයුතු කළ හැකි පරිසරයක් බිහිකිරීම.

- සත්‍ය හා සාධාරණවූත්, ගණුදෙනු තුළින් සංවර්ධනය කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්වකරුවන් සමඟ දිගුකාලීන යහපත් සබඳතා ප්‍රවර්ධනය කිරීම.

- සෑම මට්ටමකම කාර්ය මණ්ඩලය සවිබලකරණය හා ඔවුන්ගේ කටයුතුවලට මැදිහත්වීම අවම කිරීම තුළින් ස්වකීය රාජකාරී සම්බන්ධව වගකිව යුතු බව ඒත්තු ගැන්වීම.

# සමස්ත විග්‍රහය

රාජ්‍ය ආදායම හා වියදම අතර පරතරය දේශීය මූලාශ්‍ර මඟින් පමණක් පියවා ගැනීමට අසීරු බැවින් විදේශ මූල්‍යයනය රාජ්‍ය ආයෝජනයේදී වැදගත් කාර්යභාර්යක් ඉටු කරයි. එබැවින් රටේ ණය බර දැරිය හැකි මට්ටමක පවත්වාගෙන යමින් අවම පිරිවැයක් යටතේ රටට අවශ්‍ය විදේශ මූල්‍යයනය සපයා ගැනීම රාජ්‍ය ණය කළමනාකරණය පිළිබඳ උපායමාර්ගයේ වැදගත් අරමුණක් වේ. ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාළ පාර්ශ්ව අතර තරඟකාරීත්වය වර්ධනය වන අයුරින් අපනයන ණය පහසුකම් ලබාගැනීමේ කාර්යය පටිපාටිය විධිමත් කිරීම සඳහා නව රජය විසින් අවශ්‍ය පියවර ගෙන තිබේ.

සාමාන්‍යයෙන් අඩු ආදායම් සහිත රටවල් සඳහා ලබාදෙන ප්‍රදාන ආධාර ලැබීම අඩුවීමත් සමඟම, ද්විපාර්ශ්වීය හා බහුපාර්ශ්වීය ණයදෙන ආයතන/රටවල් මඟින් ශ්‍රී ලංකාවට ලැබෙන සහනදායී මූල්‍ය පහසුකම් පූර්ණ වශයෙන් උපයෝජනය කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගෙන ඇත. විවිධ විදේශ මූල්‍යයන මූලාශ්‍රයන් පිළිබඳව සොයා යාමේදී රජය විසින් පුළුල් පරාසයක පැතිරුණු මූල්‍ය නියමයන් හා කොන්දේසි පිළිබඳ සලකා බැලීම අවශ්‍ය වේ. මේ අතර මූල්‍ය අර්බුද වැනි පුරෝකතනය කළ නොහැකි ගෝලීය ආර්ථික තත්ත්වයන් ලෝකයේ ප්‍රධාන ආර්ථිකයන්හි වර්ධන වේගය අඩාල වීම, විනිමය අනුපාත හා ලන්ඩන් අන්තර් බැංකු අර්පිත අනුපාතය (LIBOR) හා යුරෝපීය අන්තර් බැංකු අර්පිත අනුපාතය (EURIBOR) වැනි විචල්‍යය පොලී අනුපාත උච්ඡාවචනය ආදී හේතූන් විසින් ණය ලබාගන්නා රටවල් කෙරෙහි ණය පිරිවැය, ණය පරිමාව හා ණය සේවාකරණ ගෙවීම් ඉහළ යාම ඇතුළු නව අභියෝග එල්ල කර ඇත.

2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂය තුළ විදේශ ණය හා ප්‍රදාන වලට අදාළ නව එකඟතාවල හා විදේශ ණය හා ප්‍රදාන උපයෝජනයන්හි සැලකිය යුතු අඩුවීමක් වාර්තා විය. සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් සම්බන්ධ ණය හා ප්‍රදාන නව එකඟතාවන් පෙර වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂය තුළ සියයට 70ක පමණ අඩුවීමක් පෙන්නුම් කොට ඇති අතර විදේශ මූල්‍යයන උපයෝජනයන්හි සියයට 18ක පමණ අඩුවීමක් 2015 තුළ පෙන්නුම් කොට ඇත. 2015 වර්ෂය තුළ පැවති ජනාධිපතිවරණය හා පාර්ලිමේන්තු මැතිවරණය තුළින් රටේ දේශපාලන අධිකාරියේ සිදු වූ වෙනස්වීමට සමඟාමීව ඇති වූ වෙනස්කම් මේ සඳහා බලපෑ එක් හේතුවක් වශයෙන් දැක්විය හැක. අළුතින් පත්වූ රජය ඒ වන විට එළඹ තිබූ ණය ගිවිසුම් අධ්‍යයනය සඳහා මෙන්ම සාකච්ඡා මට්ටමේ පැවති ණය ගිවිසුම් නැවත සමාලෝචනය කිරීම කෙරෙහිද වැඩි අවධානයක් යොමු කරන ලදී. එසේම ක්‍රියාත්මක වෙමින් පැවති ව්‍යාපෘති සමීප අධීක්ෂණයට ලක්කළ අතර වඩාත් පාරදෘශ්‍ය ක්‍රමවේදයක් අනුගමනය කරමින් ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාමාර්ග ගන්නා ලදී. මිල නොකැඳවූ (Unsolicited) ව්‍යාපෘති යෝජනා තවදුරටත් ධෛර්යමත් නොකරන බවට රජය ගත් ප්‍රතිපත්තිමය තීරණයත් සමඟම මිල නොකැඳවූ යෝජනා නැවත සමාලෝචන ක්‍රියාවලියක් සඳහා යොමු කෙරිණි. 2015 වර්ෂය තුළ පැවති අවාසිදායක ගෝලීය තත්ත්වයන් සමඟ ලන්ඩන් අන්තර් බැංකු අර්පිත අනුපාත ඉහළ යාමේ ප්‍රවණතාවයන් පැවති බැවින් සාකච්ඡා මට්ටමේ පැවති විචල්‍යය පොලී අනුපාතිකයන් සහිත ණය ගිවිසුම් වඩාත් ප්‍රවේශම් සහගතව පරිපූර්ණව සලකා බැලීම අවශ්‍ය විය. 2015 ජනවාරි මාසයේ සිට සියයට 10කින් පමණ

රුපියල අවප්‍රමාණ වීම මඟින් එම බාධාවන් වඩාත් උත්සන්න වූ අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් පොලී සඳහා වන වියදම ඉහළ ගොස් ඇත.

අප රටට ප්‍රධාන වශයෙන් ණය ලබාදෙන රටක් බවට පත්වී ඇති චීනය 2014 වර්ෂයේදී අත්විඳි වාසිසහගත ගෝලීය තත්ත්වයන්ට වෙනස් ආකාරයෙන් 2015 වර්ෂය තුළ චීන ආර්ථික වර්ධන වේගය මන්දගාමී වීම නිසා චීනය මඟින් පළකරනු ලබන මූල්‍ය එකඟතාවයන්හි හා දැනටමත් ලබාදී ඇති ණය උපයෝජනයන්හි අඩුවීමක් පෙන්නුම් කිරීමට හේතු විය. මෙම තත්ත්වය ගෝලීය ආර්ථික වර්ධනය කෙරෙහිද අහිතකර බලපෑමක් ඇතිකිරීමට හේතුවිය. එසේ වුවද ශ්‍රී ලංකාව විසින් තම සංවර්ධන පාර්ශ්වකරුවන් සමඟ දැනට එළඹ ඇති ණය ගිවිසුම් මඟින් ඉදිරියේදී උපයෝජනය කිරීමට නියමිත මෙතෙක් උපයෝජනය නොවූ ඇ.ඩො. බිලියන 8කට ආසන්න වූ විදේශ අරමුදල් පවතින බැවින් ඊළඟ වසර 3-5 ක කාලය තුළ සංවර්ධන ව්‍යාපෘති බාධාවකින් තොරව ක්‍රියාත්මක කළ හැකි වනු ඇතැයි අපේක්ෂා කළ හැක.

# සංවිධාන ව්‍යුහය

විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, අධ්‍යක්ෂ ජනරාල් ප්‍රමුඛ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයකුගෙන් හා අධ්‍යක්ෂවරු අට දෙනෙකුගෙන් සමන්විත වේ. අධ්‍යක්ෂවරුන් අංශ ප්‍රධානීන් ලෙස කටයුතු කරනු ලබන අතර, එම අංශයන් පහත පරිදි වේ.

- ආසියානු සංවර්ධන බැංකුව
- ජපානය, කොරියාව, තායිලන්තය, වියට්නාමය, මැලේසියාව සහ සිංගප්පූරු අංශය
- ප්‍රාග්ධන වෙළඳපොළ, ලෝක බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් අංශය
- චීනය අංශය
- මැදපෙරදිග හා දකුණු ආසියානු රටවල් අංශය
- රුසියාව, ඕස්ට්‍රේලියාව සහ බටහිර රටවල් අංශය
- එක්සත් ජාතීන්ගේ සංවිධාන, ශිල්පීය ආධාර සහ රාජ්‍ය නොවන සංවිධාන අංශය
- ණය කළමනාකරණ අංශය
- ප්‍රතිපත්ති සැලසුම් අංශය
- පරිපාලන හා ගිණුම් අංශය

පරිපාලන හා ගිණුම් අංශයන්, දෙපාර්තමේන්තුව කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සහයක සේවා සපයනු ලැබේ. එම සහයක සේවා යටතේ භෞතික හා මානව සම්පත් සංවර්ධනය හා කළමනාකරණය, සේවාවන් සම්බන්ධ භෞතික සම්පත් සැපයීම කළමනාකරණය කිරීම හා නඩත්තුව සිදුකරන අතර, භාණ්ඩ සමීක්ෂණය පවත්වා භෞතික සම්පත් ලේඛනගත කිරීම සම්පූර්ණ කර ඇත.

2014 වර්ෂය අවසානයේදී දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 30ක ප්‍රතිශතයක් පුරප්පාඩුව පැවති අතර, එම තත්ත්වය 2015 වර්ෂය අවසාන වනතෙක්ම පැවතුණි. එය දෙපාර්තමේන්තුවේ 2015 වාර්ෂික කාර්ය සැලැස්මෙහි සඳහන් වූ ඉලක්කයන් ළඟාකර ගැනීමේදී අභියෝගයක්ව පැවතුණ නමුත් 2015 වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව ඉහළ කාර්යසාධනයක් වාර්තා කිරීමට සමත් විය.

## කාර්ය මණ්ඩල නිපුණතා සංවර්ධනය හා පුහුණු කිරීම

මානව සම්පත් සංවර්ධනය සඳහා දෙපාර්තමේන්තුව 2015 වර්ෂයේ දී විශේෂ කාර්යභාරයක් ඉටු කරන ලදී. දේශීය හා විදේශීය පුහුණු අවස්ථා රාශියක් ලබාදීම මඟින් දෙපාර්තමේන්තුවේ විධායක ශ්‍රේණියේ නිලධාරීන්ගේ සහ සහයක සේවාවන්ට අයත් නිලධාරීන්ගේ කුසලතා වර්ධනය කර ගැනීමට සහ කාර්යක්ෂමතාවය ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා කටයුතු කරන ලදී. ආයතනයේ නිලධාරීන්ට 2015 වර්ෂය තුළදී ලබාදෙන ලද දේශීය පුහුණු ක්ෂේත්‍රයන් සහ පුහුණු කරන ලද කාර්ය මණ්ඩල සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.

**විධායක ශ්‍රේණියේ නිලධාරීන් ලැබූ දේශීය හා විදේශීය පුහුණු අවස්ථා**

| පුහුණු වැඩසටහන | පුහුණු කරන ලද කාර්ය මණ්ඩලය |
|---|---|
| **විදේශීය** | |
| සංවර්ධනය වෙමින් පවතින රටවල රාජ්‍ය උපායමාර්ග සංවර්ධනය හා ප්‍රවර්ධනය පිළිබඳ සමුළුව - චීනය | 1 |
| ඕස්ට්‍රේලියානු ශිෂ්‍යත්වය ප්‍රදානයනයන් | 2 |
| CS-DRMS වැඩසටහන පුහුණු කරන්නන් සඳහා වූ පුහුණු වැඩසටහන (පොදු රාජ්‍ය මණ්ඩලීය ණය සටහන් කිරීම හා කළමනාකරණ පද්ධතිය) | 1 |
| ණය කළමනාකරණ කාර්යසාධනය ඇගයීම පිළිබඳ පුහුණුව - වියට්නාමය | 1 |
| තිරසාර ජාතික තරඟකාරීත්වය සඳහා මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තිය සංවර්ධනය - කොරියාව | 1 |
| ආර්ථික සංවර්ධන උපායමාර්ගය - කොරියාව | 2 |
| ඉගෙනුම් වැඩසටහන ඇගයීම තිරසාර චින්තනය හා වගකීමෙන් කටයුතු කිරීම - පිලිපීනය | 1 |
| මූල්‍ය වෙළඳපොළ විශ්ලේෂණය - සිංගප්පූරුව | 1 |
| IDE – JETRO ශිෂ්‍යත්ව වැඩසටහන - ජපානය | 1 |
| රාජ්‍ය අංශයේ නිලධාරීන් සඳහා වූ ආර්ථික ප්‍රතිපත්ති, පශ්චාත් උපාධි වැඩසටහන - ඇමරිකා එක්සත් ජනපදය | 1 |
| ආර්ථික ප්‍රතිපත්ති හා සංවර්ධනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන - කොරියාව | 2 |
| මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපායමාර්ග පුහුණු වැඩසටහන - වියානා ඔස්ට්‍රියාව | 1 |
| කුඩා රාජ්‍යයන් සඳහා නවීන රාජ්‍යතාන්ත්‍රිකත්වය - මෝල්ටාව | 1 |
| ආසියානු රටවල රාජ්‍යතාන්ත්‍රිකයන් සඳහා වූ සම්මන්ත්‍රණය - චීනය | 3 |
| චීන - ආසියානු ආර්ථික සහ වෙළඳ සබඳතා පිළිබඳ සමුළුව - 2015, චීනය | 1 |
| යුරෝ ආසියානු රටවල් සඳහා චීනයේ ආර්ථික හා සමාජ සංවර්ධන අත්දැකීම් පිළිබඳ සම්මන්ත්‍රණය - චීනය | 1 |
| දියුණුවන රටවල් සඳහා ආර්ථික සංවර්ධනය පිළිබඳ සමුළුව - චීනය | 1 |
| ආර්ථික ගෝලීයකරණය හා චීන නිෂ්පාදන පිළිබඳ දියුණුවන රටවල් සඳහා වූ සමුළුව - චීනය | 1 |
| දියුණුවන රටවල් සඳහා ආර්ථික වර්ධන විධි සහ තිරසාර සංවර්ධනය පිළිබඳ සමුළුව - චීනය | 1 |
| දියුණුවන රටවල් සඳහා හදිසි සන්නිවේදන ජාලය පිළිබඳ සමුළුව - චීනය | 1 |
| දියුණුවන රටවල් සඳහා විදේශ ආධාර නියෝජිතායතන පිළිබඳ සමුළුව - චීනය | 7 |
| දකුණු ආසියානු රටවල් සඳහා ඉන්දියානු සාගර කලාපීය දේශපාලන, ආර්ථික සහයෝගීතා සහ සංවර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණය - චීනය | 1 |
| ශ්‍රී ලංකාව සඳහා යටිතල පහසුකම් ඉදිකිරීම හා සැලසුම් කිරීම පිළිබඳ සමුළුව - චිනය | 1 |
| දියුණුවන රටවල් සඳහා විදේශ විශේෂඥයින් හඳුන්වාදීම සහ සමාජ ආර්ථික සංවර්ධනය හඳුන්වාදීමේ සමුළුව - චීනය | 1 |
| දියුණුවන රටවල් සඳහා දේශීය කලාපවලට විදේශ ප්‍රාග්ධනය හඳුන්වාදීම හා භාවිතය පිළිබඳ සමුළුව - චීනය | 1 |
| රාජ්‍ය ණය කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන - ජපානය | 1 |
| අඩු ආදායම් රටවල් සඳහා ලෝක බැංකු ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඒකාබද්ධ තිරසාර ණය රාමුව - චීනය | 1 |
| තරුණ නායකයින්ගේ වැඩසටහන - රාජ්‍ය පරිපාලනය/ රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ පශ්චාත් උපාධිය - ජපානය | 1 |
| ජපන් ආධාර යටතේ ශ්‍රී ලංකාව සඳහා මානව සම්පත් සංවර්ධන ශිෂ්‍යත්ව - ජපානය | 1 |
| **දේශීය** | |
| රාජ්‍යතාන්ත්‍රික සහ වැඩ කටයුතු පිළිබඳ ඩිප්ලෝමාව - BIDT | **2** |

දෙපාර්තමේන්තුවේ පරිපාලනය කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් සහ කණිෂ්ඨ කාර්ය මණ්ඩලයේ සේවක මහතුන් 2015 වර්ෂයේ දී දේශීය පුහුණු වැඩසටහන් සඳහා සහභාගී කරවීමට කටයුතු කරන ලදී. ඔවුන් පුහුණුව ලැබූ ක්ෂේත්‍ර පහත සඳහන් පරිදි වේ.

| **පුහුණුව ලැබූ ක්ෂේත්‍ර** | **පුහුණු කරන ලද කාර්ය මණ්ඩලය** |
|---|---|
| එළදායි ක්‍රියාවලිය සඳහා සේවකයින් යොමු කිරීම | 1 |
| ගබඩාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 1 |

# විදේශ මූල්‍යයනය

## විදේශ මූල්‍යයන එකඟතා

පසුගිය වසර 10 තුළ විදේශ සංවර්ධන පාර්ශ්වකරුවන් සහ ණය ලබාදෙන නියෝජිතායතන මඟින් සපයන ලද මුළු විදේශ මූල්‍යයන එකඟතා ප්‍රමාණය ඇ.ඩො. බිලියන 27.1[1] ක් වේ. සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් ඇරඹීම සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ මැදිහත් වීමෙන් අත්සන් කල ණය සහ ප්‍රදාන ගිවිසුම් තුළින් ලැබුණු සමස්ත විදේශ මූල්‍යයන එකඟතා ප්‍රමාණය පසුගිය වසර 10 තුළ ඇ.ඩො. මිලියන 2,140 කි. එයින් ණය ප්‍රමාණය ඇ.ඩො. මිලියන 1,950 ක් වන අතර, වාර්ෂික ප්‍රදාන එකඟතා ප්‍රමාණය ඇ.ඩො. මිලියන 190 කි. සංවර්ධන ව්‍යාපෘති ගිවිසුමක් අත්සන් කිරීමෙන් පසුව එය ආරම්භ කිරීමේ ක්‍රියාවලිය සඳහා ඉදිරි අවුරුදු 3 - 5 ත් අතර කාලයක් වැයවේ.

2015 දී විදේශ සංවර්ධන පාර්ශ්වකරුවන්ගෙන් සහ ණය ලබාදෙන නියෝජිතායතන මඟින් සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් ආරම්භ කිරීම සඳහා ලැබුණු සමස්ත මූල්‍යයන එකඟතා ප්‍රමාණය ඇ.ඩො. මිලියන 1,333.6 ක් වේ. එයින් ඇ.ඩො. මිලියන 1,268.4 ක් ගිවිසුම් 23 ක් හරහා ණය ලෙසද ඉතිරි ඇ.ඩො. මිලියන 65.2 ප්‍රදාන ආධාර ගිවිසුම් 10 ක් හරහාද 2015 වර්ෂයේදී ලබා ගෙන ඇත.

2015 වර්ෂයේදී ණය එකඟතා පහත සඳහන් පරිදි ප්‍රධාන ව්‍යාපෘති ඇරඹීම සඳහා ලබා දෙන ලදී. ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාලය සංවර්ධනය හා කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා ඇ.ඩො. මිලියන 200 ක් ජපාන රජය විසින්ද, පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ගය වැඩිදියුණු කිරීම සඳහා ඇ.ඩො. මිලියන 60 ක් සෞදි අරමුදල විසින්ද, බඩල්ගම කිරි ආහාර පිළියෙල කිරීමේ කර්මාන්තශාලාවක් පිහිටුවීම සඳහා ඇ.ඩො. මිලියන 74 ක් HSBC බැංකුව මඟින්ද, මහාමාර්ග සම්බන්ධ කිරීමේ ව්‍යාපෘතිය - අදියර 2 ඇ.ඩො. මිලියන 98 ක් ද, මහාමාර්ග සම්බන්ධ කිරීමේ ව්‍යාපෘතිය - අදියර 3 ඇ.ඩො. මිලියන 175 ක් ද, මහවැලි ජල සංරක්ෂණ ව්‍යාපෘතිය - අදියර 1 ඇ.ඩො. මිලියන 147.8 ක් ද ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබා දෙන ලදී. ජල සම්පාදනය හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා ඇ.ඩො. මිලියන 163.2 ක් සහ මුල් ළමාවිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ඇ.ඩො. මිලියන 50 ක් ද ලෝක බැංකුවේ අන්තර්ජාතික සංවිධාන සංගමය මඟින්ද, බදුල්ල - චෙන්කලාඩි මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ඇ.ඩො. මිලියන 60 ක් ඔපෙක් ආධාර යටතේද ලබා දෙන ලදී. 2015 වර්ෂයේදී අත්සන් කරන ලද ණය ගිවිසුම් ලේඛනය සහ ඒවායේ මූල්‍ය කොන්දේසි ඇමුණුම 1 හි සඳහන් වේ. 2015 වර්ෂයේදී අත්සන් කරන ලද ප්‍රදාන ගිවිසුම් ඇමුණුම 2 හි සඳහන් වේ.

සමස්ත එකඟතා පහත පරිදි ප්‍රස්තාරගත කර ඇත. ව්‍යාපෘති ලේඛන සහ මූල්‍ය කොන්දේසි ඇමුණුම 1 හා 2 හි සඳහන් වේ.

[1] ජාත්‍යන්තර ස්වෛරීත්ව බැදුම්කර මඟින් ලබාගත් ණය අන්තර්ගත වේ. භාණ්ඩාගාර බැඳුම්කර හා බිල්පත් සඳහා වූ විදේශ ආයෝජන අන්තර්ගත නොවේ. විදේශ සංවර්ධන පාර්ශ්වකරුවන් සහ ණයදෙන නියෝජිතායතන මඟින් රජය සතු ව්‍යාපාර වෙත ලබාදුන් මූල්‍ය එකඟතාවයන්ද අන්තර්ගත නොවේ.

**විදේශ මූල්‍යයන එකඟතා 2015 - සංවර්ධන පාර්ශ්වකරු අනුව (ඇ.ඩො. මිලියන)**

| සංවර්ධන පාර්ශ්වකරු | මූල්‍යයන එකඟතා | | |
|---|---|---|---|
| | ණය | ප්‍රදාන | එකතුව |
| **ද්විපාර්ශ්වීය** | **504.9** | **23.4** | **528.3** |
| ජපානය | 199.9 | 4.1 | 204.0 |
| ප්‍රංශය | 58.2 | | 58.2 |
| කොරියාව | 17.3 | 3.2 | 20.5 |
| ස්පාඤ්ඤය | 58.9 | | 58.9 |
| ඉන්දියාව | | 7.6 | 7.6 |
| එක්සත් රාජධානිය | 74.2 | | 74.2 |
| ඇමරිකා එක්සත් ජනපදය | | 2.1 | 2.1 |
| ජර්මනිය | | 6.4 | 6.4 |
| ඕස්ට්‍රේලියාව | 21.3 | | 21.3 |
| ස්වීඩනය | 3.1 | | 3.1 |
| සෞදි අරාබිය | 72 | | 72 |
| **බහුපාර්ශ්වීය** | **763.5** | **41.8** | **805.3** |
| ආසියානු සංවර්ධන බැංකුව | 453.7 | | 453.7 |
| ලෝක බැංකුව (අන්තර්ජාතික සංවර්ධන සමායතනය) | 232.8 | | 232.8 |
| එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන | | 41.8 | 41.8 |
| ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල | 77.0 | | 77.0 |
| **එකතුව** | **1,268.4** | **65.2** | **1,333.6** |

**සටහන:** *මෙම වාර්තාව සඳහා යොදාගත් හුවමාරු අනුපාතික වනුයේ වසරේ අදාළ ගිවිසුම් අත්සන් කල දිනයේ විවිධ මුදල් වර්ග සඳහා පැවති විනිමය අනුපාතික වේ.*

## විදේශ මූල්‍යයන ප්‍රතිලබ්ධීන් හා උපයෝජන

2015 දී සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් තුළින් ණය සහ ප්‍රදාන වශයෙන් විදේශ සංවර්ධන පාර්ශ්වකරුවන් සහ ණය ලබාදෙන නියෝජිතායතන මඟින් ලැබුණු සමස්ත ප්‍රතිලබ්ධීන් ඇ.ඩො. මිලියන 1,515 කි. මෙයින් ඇ.ඩො. මිලියන 1,440.7 ක් ණය ලෙසද ඉතිරි ඇ.ඩො. මිලියන 74.5 ප්‍රදාන ආධාර ලෙසද ලැබී ඇත. මෙම කාලය තුළ එක් එක් සංවර්ධන පාර්ශ්වකරුවන් විසින් සිදු කරනු ලැබූ ප්‍රතිලබ්ධීන් පහත වගුවෙන් පෙන්නුම් කරයි.

| සංවර්ධන පාර්ශ්වකරුවන්/ණයදෙන නියෝජිතායතන | ණය (ඇ.ඩො. මිලියන) | ප්‍රදාන (ඇ.ඩො. මිලියන) | එකතුව (ඇ.ඩො. මිලියන) |
|---|---|---|---|
| **ද්විපාර්ශ්වීය** | **914.4** | **43.8** | **961.2** |
| චීනය | 407.8 | | 407.8 |
| ජපානය | 167.9 | 7.2 | 175.1 |
| ඉන්දියාව | 73.1 | 31.9 | 104.9 |
| නෙදර්ලන්තය | 72.6 | | 72.6 |
| දකුණු කොරියාව | 20.9 | 2.2 | 23.1 |
| ස්වීඩනය | 4.3 | | 4.3 |
| ස්පාඤ්ඤය | 9.8 | | 9.8 |
| ඕස්ට්‍රේලියාව | 9.8 | | 9.8 |
| ඔස්ට්‍රියාව | 6.8 | | 6.8 |
| හංගේරියාව | 7.7 | | 7.7 |
| ප්‍රංශය | 6.9 | | 6.9 |
| බෙල්ජියම | 9.8 | | 9.8 |

| සංවර්ධන පාර්ශ්වකරුවන්/ණයදෙන නියෝජිතායතන | ණය | ප්‍රදාන | එකතුව |
|---|---|---|---|
| | ඇ.ඩො. මිලියන | ඇ.ඩො. මිලියන | ඇ.ඩො. මිලියන |
| ඩෙන්මාර්කය | 24.7 | | 24.7 |
| ජර්මනිය | 7.4 | 2.6 | 10.0 |
| සෞදි අරාබිය | 15.0 | | 15.0 |
| කුවේට් | 9.2 | | 9.2 |
| එක්සත් රාජධානිය | 56.7 | | 56.7 |
| ඇමරිකා එක්සත් ජනපදය | 7.1 | | 7.1 |
| **බහුපාර්ශ්වීය** | **523.3** | **30.7** | **553.9** |
| ආසියානු සංවර්ධන බැංකුව | 288.0 | 1.6 | 289.6 |
| ලෝක බැංකුව | 132.9 | 22.0 | 154.9 |
| කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික අරමුදල | 5.0 | 1.0 | 6.0 |
| ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල | 16.5 | | 16.5 |
| එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන | | 0.2 | 0.2 |
| එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල | | 4.6 | 4.6 |
| ආහාර හා කෘෂිකර්ම සංවිධානය | | 0.3 | 0.3 |
| එක්සත් ජාතීන්ගේ සරණාගතයන් පිළිබඳ කොමිසම | | 1.0 | 1.0 |
| යුරෝපීය ආයෝජන බැංකුව | 80.8 | | 80.8 |
| **එකතුව** | **1,440.7** | **74.5** | **1,515.2** |

**සටහන:** *මෙම වාර්තාව සඳහා යොදාගත් හුවමාරු අනුපාතික වනුයේ වසරේ අදාළ ප්‍රතිලාභීන් සිදුවූ දිනයේ විවිධ මුදල් වර්ග සඳහා පැවති විනිමය අනුපාතික වේ.*

## පළ කරන ලද එකඟතාවයන් මත ඉදිරියට උපයෝජනය වීමට නියමිත ශේෂය සහ උපයෝජන අනුපාතිකය

2015 වර්ෂය අවසාන වන විට එකඟතාවය පළ කරන ලද එහෙත් තවමත් සංවර්ධන ව්‍යාපෘතීන්හි උපයෝජනය වීමට නියමිත විදේශ මූල්‍යයන ප්‍රමාණය ඇ.ඩො. මිලියන 7,867.5 ක් විය. මෙයින් සියයට 40.2 ක් මාර්ග සහ පාලම් සඳහා උපයෝජනය වීමට නියමිත අතර සියයට 11.4 ක් ජල සම්පාදනය සහ විදුලිබල හා බලශක්ති යන අංශ සඳහා උපයෝජනය වීමට නියමිතය.

**2015 දෙසැම්බර් අවසන් වන විට සංවර්ධන පාර්ශ්වකරු අනුව එකඟතාවය පළකරන ලද එහෙත් උපයෝජනය වීමට නියමිත විදේශ මූල්‍යයන ප්‍රමාණය**

| සංවර්ධන පාර්ශ්වකරුවන් | ඇ.ඩො. මිලියන | % |
|---|---|---|
| **ද්විපාර්ශ්වීය** | **5,262.0** | **66.9** |
| චීනය | 2,254.6 | **28.7** |
| ජපානය | 1,273.3 | **16.2** |
| ඉන්දියාව | 326.7 | **4.2** |
| එක්සත් රාජධානිය | 100.1 | **1.3** |
| නෙදර්ලන්තය | 72.8 | **0.9** |
| දකුණු කොරියාව | 85.0 | **1.1** |
| හංගේරියාව | 17.7 | **0.2** |

| සංවර්ධන පාර්ශ්වකරුවන් | ඇ.ඩො. මිලියන | % |
|---|---|---|
| ස්වීඩනය | 5.2 | **0.1** |
| ස්පාඤ්ඤය | 58.7 | **0.7** |
| ප්‍රංශය | 164.2 | **2.1** |
| ඔස්ට්‍රියාව | 7.0 | **0.1** |
| බෙල්ජියම | 6.9 | **0.1** |
| ජර්මනිය | 34.3 | **0.4** |
| ඩෙන්මාර්කය | 49.7 | **0.6** |
| කුවේට් | 61.9 | **0.8** |
| ඕස්ට්‍රේලියාව | 14.1 | **0.2** |
| ඇමරිකා එක්සත් ජනපදය | 44.8 | **0.6** |
| සෞදි අරාබිය | 136.0 | **1.7** |
| ඉරානය | 399.4 | **5.1** |
| පකිස්තානය | 14.9 | **0.2** |
| රුසියාව | 134.7 | **1.7** |
| **බහුපාර්ශ්වීය** | **2,605.5** | **33.1** |
| ආසියානු සංවර්ධන බැංකුව | 1,453.3 | **18.5** |
| ලෝක බැංකුව - අන්තර්ජාතික සංවර්ධන සමායතනය | 727.9 | **9.3** |
| ලෝක බැංකුව - සංවර්ධනය හා ප්‍රතිසංස්කරණය සඳහා වූ අන්තර්ජාතික බැංකුව | 242.9 | **3.1** |
| කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික අරමුදල | 34.1 | **0.4** |
| අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල | 145.4 | **1.8** |
| නෝර්ඩික් සංවර්ධන අරමුදල | 1.9 | **0.0** |
| **එකතුව** | **7,867.5** | **100.0** |

**2015 දෙසැම්බර් අගවන විට පැවති එකඟතා පළකල එහෙත් උපයෝජනය වීමට නියමිත විදේශ මූල්‍යයන උපයෝජනයන් - ආර්ථිකයේ විවිධ අංශ අනුව**

| | ඇ.ඩො. මිලියන | % |
|---|---|---|
| **කෘෂිකර්ම අංශය** | **746.0** | **9.5** |
| කෘෂිකර්මය | 22.5 | **0.3** |
| පශු සම්පත් සංවර්ධනය | 54.3 | **0.7** |
| ඉඩම් හා වාරිමාර්ග | 669.2 | **8.5** |
| **ආර්ථික යටිතල පහසුකම්** | **5,477.1** | **69.6** |
| ප්‍රවාහනය | 380.8 | **4.8** |
| වරාය හා නාවික | 116.5 | **1.5** |
| විදුලිය හා බලශක්ති | 901.9 | **11.5** |
| ජල සම්පාදන හා සනීපාරක්ෂාව | 895.9 | **11.4** |
| මහාමාර්ග සහ පාලම් | 3,182.0 | **40.4** |
| **සමාජ යටිතල පහසුකම්** | **942.6** | **12.0** |
| අධ්‍යාපනය හා වෘත්තීය පුහුණු | 299.7 | **3.8** |
| සෞඛ්‍යය හා සමාජ සුභසාධනය | 181.1 | **2.3** |
| නිවාස හා නාගරික සංවර්ධනය | 263.7 | **3.4** |
| පුනරුත්ථාපනය හා ආපදා කළමනාකරණය | 198.1 | **2.5** |
| **ප්‍රාදේශීය හා ග්‍රාමීය සංවර්ධනය** | **2.9** | **0.0** |
| **මූල්‍ය හා බැංකු** | **11.6** | **0.1** |
| **සංස්ථායික හා කර්මාන්ත සංවර්ධනය** | **43.7** | **0.6** |
| **පරිසරය** | **61.2** | **0.8** |
| **වෙනත්** | **582.4** | **7.4** |
| **එකතුව** | **7,867.5** | **100.0** |

***සටහන:*** *රජය සතු ව්‍යාපාර විසින් ලබාගත් විදේශ ණය එකඟතාවයන් මෙහි අන්තර්ගත නොවේ.*

## විදේශ ණය ස්කන්ධය සහ විදේශ ණය සේවාකරණය

2015 වර්ෂය අවසාන වන විට රජයේ විදේශ ණය ස්කන්ධය ඇ.ඩො. බිලියන 22.5කි[2]. 2015 දී සමස්ත ණය සේවාකරණ ගාස්තුව[3] ඇ.ඩො. මිලියන 1,821.1 ක් විය. ඉන් ඇ.ඩො. මිලියන 1,270.1 ක් මූලික ණය වාර සඳහා ද ඉතිරි ඇ.ඩො. මිලියන 550.9 පොලී ගෙවීම සඳහා ද විය.


වර්ෂ 2010 - 2015 දක්වා ණය සේවාකරණ ගාස්තු සහ 2020 වර්ෂය දක්වා ඇස්තමේන්තු කරන ලද ණය සේවාකරණ ගාස්තු මෙම ප්‍රස්තාරයෙන් පෙන්නුම් කෙරේ.

---

2 *මෙහි සංවර්ධන ව්‍යාපෘති මූල්‍යයනය සඳහා ලබාගත් ණය සහ අන්තර්ජාතික බැඳුම්කර වශයෙන් ලබාගත් ණය ඇතුළත් වන අතර රාජ්‍ය ව්‍යාපාර සඳහා ලබාගත් ණය මෙහි ඇතුළත් කොට නොමැත.*

3 *ණය සේවාකරණ ගාස්තු = ණය වාරික ගෙවීම් + පොලී ගෙවීම්, රාජ්‍ය ව්‍යාපාර ලබාගත් ණය සඳහා සේවාකරණ ගාස්තු මෙහි ඇතුළත් නොවේ.*


**ණය සේවාකරණ ගෙවීම් (ඇ.ඩො. මිලියන)**




# විදේශ ණය කල්පිරීමේ ව්‍යූහය

සංවර්ධන ව්‍යාපෘති මූල්‍යයනය සඳහා ඇ.ඩො. මිලියන 22.5 ක් වූ සමස්ත ණය ස්කන්ධය ආසන්න වශයෙන් සියයට 13ක් පමණ ඉදිරි වසර 5 කාලය තුළ කල්පිරීම සිදුවේ. ඉදිරි වසර 5 - 10 කාලයේදී මුළු ණය ස්කන්ධයෙන් වැඩි ප්‍රමාණයක් (සියයට 28 ක්) කල්පිරීමට නියමිත අතර සියයට 35 ක් වසර 10 - 20 ත් කාලයේදී කල්පිරීම සිදුවන අතර ඉතිරිය වන සියයට 24 වසර 20 කට පසු කල්පිරීම සිදුවේ.

**විදේශ ණය කල්පිරීමේ ව්‍යූහය**




**සටහන:** *මෙම සංඛ්‍යාලේඛන දැනට පවත්නා ණය කළඹ මත පදනම් වේ*

# එක් එක් අංශයන්හි කාර්යසාධනය

# ආසියානු සංවර්ධන බැංකුව

## ශ්‍රී ලංකාවේ සංවර්ධන පාර්ශ්වකරුවෙකු ලෙස ආසියානු සංවර්ධන බැංකුව

ආසියානු සංවර්ධන බැංකුව වසර 49 කටත් වඩා වැඩි කාලයක් පුරා ඵලදායී සංවර්ධන සහයෝගීතාවයක් පවත්වා ගෙන යනු ලබන ශ්‍රී ලංකාවේ ප්‍රධානතම බහුපාර්ශ්වික සංවර්ධන පාර්ශ්වකරුවෙකි. වර්ෂ 1966 දී බැංකුව සංස්ථාපනය කිරීමෙන් අනතුරුව ස්වෛරී සහ ස්වෛරී නොවන ණය පහසුකම් 190 ක් යටතේ ඇ.ඩො. බිලියන 7.23 ක සමුච්චිත ණය පහසුකම් බැංකුව විසින් ශ්‍රී ලංකාව වෙනුවෙන් අනුමත කර ඇත. එයට අමතරව, ව්‍යාපෘති සඳහා බැංකුව විසින් පරිපාලනය කරනු ලබන සහ මූල්‍යයන ප්‍රදානයන් ද ඇතුළත්ව ඇ.ඩො. මිලියන 358 ක ප්‍රදාන හා ඇ.ඩො. මිලියන 129.54 ක ශිල්පීය ආධාර ද ලබා දී ඇත. ආසියානු සංවර්ධන බැංකුව වෙතින් වාර්ෂික ණය ලබා ගැනීම් වර්තමානයේදී වසරකට ඇ.ඩො. මිලියන 400 – 500 ත් අතර නැතහොත් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 0.5 ත් 0.6 ත් අතර වේ.


**ආසියනු සංවර්ධන බැංකුවේ ශ්‍රී ලංකා සහයෝගීතා උපායමාර්ගයන් (2016 – 2018)**

**ශ්‍රී ලංකා රජය සහ ආසියානු සංවර්ධන බැංකුව විසින් 2015 දී සම්පාදනය කරන ලද වර්ෂ 2016 – 2018 සඳහා අදාළ "ආසියානු සංවර්ධන බැංකුවේ ශ්‍රී ලංකා සහයෝගීතා උපායමාර්ගයන් ප්‍රධාන අරමුණු තුනක් වෙත කේන්ද්‍රගත වී ඇත. එනම්, (i) සර්වග්‍රාහී තිරසාර ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය කිරීම (ii) පුද්ගලික ආයෝජන උත්ප්‍රේරණය කිරීම සහ රාජ්‍ය ආයෝජනයන්හි සඵලතාවය වැඩිදියුණු කිරීම (iii) මානව සම්පත් සහ දැනුම් වර්ධනය කිරීමයි. සර්වග්‍රාහී ආර්ථික වර්ධනය සඳහා වූ සංවර්ධන අවශ්‍යතා ආමන්ත්‍රණය කෙරෙන මෙම උපායමාර්ගයන්, 2015 ජනවාරි මස පිහිටුවන ලද නව රජයේ ප්‍රතිපත්තිවලට අනුකූල වන අතර කෘෂිකර්මාන්තය, ස්වභාවික සම්පත් සහ ග්‍රාමීය සංවර්ධනය ආසියානු සංවර්ධන බැංකුවේ ශ්‍රී ලංකා මෙහෙයුම් කටයුතුවලදී ප්‍රමුඛතා අංශ ලෙස හඳුනා ගනී. ඒ අනුව, සහනදායී සහ සහනදායී නොවන නියමයන් යටතේ වසරකට ඇ.ඩො. මිලියන 800 – 1,000 ත් අතර සංවර්ධන සහායන් ශ්‍රී ලංකාවට හිමි වේ. වර්ෂ 2016 – 2018 කාලය සඳහා වෙන්කර ඇති ඇ.ඩො. බිලියන 3න් සැලකිය යුතු කොටසක් ප්‍රවාහන, ජල සම්පාදන සහ සනීපාරක්ෂක, වාරිමාර්ග සහ ජල සම්පත් කළමනාකරණ, බලශක්ති සහ නිපුණතා සංවර්ධන යන අංශයන්හි උපයෝජනය කෙරෙනු ඇත.**

## 2015 වර්ෂයේ එකඟතා හා උපයෝජනයන්

ආසියානු සංවර්ධන බැංකුවේ 2015 වසරේ දී එකඟතාවයන් ඇ.ඩො. මිලියන 478 කි. එයින් මිලියන 150ක් වාරිමාර්ග සහ ජල සම්පත් කළමනාකරණ අංශය සඳහාත්, මිලියන 200ක් මාර්ග හා ප්‍රවාහන අංශ සඳහාත් මිලියන 128ක් ක් ජල සම්පාදන සහ සනීපාරක්ෂක අංශ සඳහාත් වේ. බැංකුවේ වත්මන් ආයෝජන කළඹ, ණය පහසුකම් 39කින් සහ ප්‍රදානයන් 3කින් සමන්විත වේ. මෙම ණය පහසුකම් යටතේ වසර 2015 දී සිදුකර ඇති සමස්ත උපයෝජනයන් ඇ.ඩො. මිලියන 293 කි.


2015 **උපයෝජනයන්හි ආංශික සංයුතිය**




## 2015 වසරේ ආසියානු සංවර්ධන බැංකු ණය කළඹ

ආසියානු සංවර්ධන බැංකුවේ ආයෝජන කළඹ, අංශ 7 ක් ආවරණය කෙරෙන අතර මාර්ග සහ ප්‍රවාහන අංශය ඉන් ප්‍රමුඛතම වේ. බලශක්ති, ජල සම්පාදන සහ සනීපාරක්ෂක, අධ්‍යාපන/ නිපුණතා/ මානව සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ බහු අංශ (ප්‍රාදේශිය සංවර්ධන, මුදල් හා මූල්‍ය කළමනාකරණය) සෙසු අංශ වේ. පහත සටහන 2015 දෙසැම්බර් 31 දිනට බැංකුවේ ආංශික ආයෝජන කළඹ පෙන්නුම් කරයි.

**ආසියානු සංවර්ධන බැංකු ණය පහසුකම්හි ආංශික සංයුතිය / ඇ.ඩො. මිලියන**



# වසර 2015 දී ක්‍රියාත්මක කරන ලද වැදගත් ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | මුදල ඇ.ඩො. මිලියන |
|---|---|
| **මාර්ග හා ප්‍රවාහන අංශය** | |
| මාර්ග පහසුකම් සැකසීමේ ව්‍යාපෘතිය | 15 |
| උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය | 154 |
| ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යයනය 1 | 85 |
| උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යයනය | 98 |
| දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය | 75 |
| ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන - අදියර 1 | 100 |
| ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන - අදියර 2 | 107 |
| **ජල සම්පාදන සහ සනීපාරක්ෂක අංශය** | |
| මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය | 88 |
| වියළි කලාපීය නාගරික ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය | 60 |
| යාපනය සහ කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය | 90 |
| වියළි කලාපීය නාගරික ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යයනය | 40 |
| මහ කොළඹ ජල සම්පාදන සහ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය - අදියර 1 | 84 |
| මහ කොළඹ ජල සම්පාදන සහ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය - අදියර 2 | 88 |
| **විදුලිබල හා බලශක්ති අංශය** | |
| පිවිතුරු බලශක්ති හා ප්‍රවේශ ප්‍රවර්ධන ව්‍යාපෘතිය | 160 |
| ධරණීය බලශක්ති ආංශික සහයෝගීතා ව්‍යාපෘතිය | 120 |
| පිවිතුරු බලශක්ති සහ ජාල කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 130 |
| හරිත බලශක්ති සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන | 150 |
| **මූල්‍ය අංශය** | |
| රාජ්‍ය මූල්‍ය කළමනාකරණ කාර්යක්ෂමතා ව්‍යාපෘතිය | 30.8 |
| **ප්‍රාදේශිය සංවර්ධන අංශය** | |
| "පුර නැගුම" පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 55 |
| **අධ්‍යාපන අංශය** | |
| නිපුණතා ආංශීය සංවර්ධන වැඩසටහන | 100 |
| අධ්‍යාපන ආංශීය සංවර්ධන වැඩසටහන | 200 |
| **වාරිමාර්ග / කෘෂිකර්මාන්ත අංශය** | |
| මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - අදියර 1 | 150 |
| **එකතුව** | **2,179.8** |

## වර්ෂ 2015 දී සාකච්ඡා සම්මුති පවත්වන ලද සහ බලාත්මක කරන ලද ණය පහසුකම්

ව්‍යාපෘති 4ක් මූල්‍යයනය කිරීම සඳහා ඇ.ඩො. මිලියන 578ක් ලබා ගැනීමට ණය සාකච්ඡා සම්මුති අවසාන කරන ලද අතර, ඇ.ඩො. මිලියන 507 ක පිරිවැයකින් යුත් තවත් ව්‍යාපෘති 4කට අදාළ ණය ගිවිසුම් බලාත්මක බව ප්‍රකාශයට පත් කරන ලදී.

**වර්ෂ 2015 දී අනුමත කරන ලද සහ බලාත්මක කරන ලද ණය පහසුකම්**

| **ණය** | **මුදල ඇ.ඩො. මිලියන** |
|---|---|
| **සාකච්ඡා සම්මුති අවසාන කරන ලද** | |
| මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන | 150 |
| ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන - අදියර 3 | 200 |
| මහ කොළඹ ජල සම්පාදන සහ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය - අදියර 3 | 128 |
| සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය යෝජනා ක්‍රමය | 100 |
| **එකතුව** | **578** |
| **බලාත්මක කරන ලද ණය ගිවිසුම්** | |
| හරිත බලශක්ති සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - අදියර 1 | 150 |
| ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන - අදියර 1 | 100 |
| ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන - අදියර 2 | 107 |
| මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - අදියර 1 | 150 |
| **එකතුව** | **507** |

## වර්ෂ 2016 දී ණය සැකසුම්

වර්ෂ 2016 දී ආසියානු සංවර්ධන බැංකුව වෙතින් ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකෙරෙමින් පවතින වැදගත් ව්‍යාපෘති පහත වගුවෙන් පෙන්නුම් කෙරේ.

**වර්ෂ 2016 දී ක්‍රියාත්මක කරනු ලබන වැදගත් ව්‍යාපෘති**

| **ව්‍යාපෘතිය** | **මුදල ඇ.ඩො. මිලියන** |
|---|---|
| හරිත බලශක්ති සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන අදියර 2 | 150 |
| විදුලි සැපයුම් විශ්වාසනීයත්වය වැඩිදියුණු කිරීම සඳහා සහාය සැලසීමේ ව්‍යාපෘතිය | 115 |
| පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (අතිරේක මූල්‍යයනය) | 60 |
| සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය යෝජනා ක්‍රමය | 100 |
| මාර්ග පහසුකම් සැකසීමේ ව්‍යාපෘතිය | 20 |
| මහ කොළඹ ජල සම්පාදන සහ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය - අදියර 3 | 128 |
| ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධන වැඩසටහන | 250 |
| **එකතුව** | 823 |

# වර්ෂ 2015 දී සම්පූර්ණ කරන ලද ආසියානු සංවර්ධන බැංකුවේ සහාය ලද ව්‍යාපෘති

| ව්‍යාපෘතියේ විස්තර | වැදගත් ඉලක්කයන් |
|---|---|
| **ව්‍යාපෘතිය** : මාර්ග පහසුකම් සැකසීමේ ව්‍යාපෘතිය<br><br>**ණය මුදල** : ඇ.ඩො. මිලියන 15.634<br><br>**සමස්ත උපයෝජනය** : ඇ.ඩො. මිලියන 15.489<br><br>**ක්‍රියාත්මක කාලය** : 2004 - 2015 | තාක්ෂණික ආධාර ණය පහසුකමේ අරමුණ වූයේ මාර්ග පද්ධතිය කාර්යක්ෂම ලෙස සංවර්ධනය කිරීම සඳහා රජයට සහාය සැලසීමයි.<br><br>මාර්ග ව්‍යාපෘතියේ පෙර සූදානම් කටයුතු කෙරෙහි අවධානය යොමු කරමින් ව්‍යාපෘතිය යටතේ<br>(i) මාර්ග ව්‍යාපෘතීන්හි පූර්ව ඉදිකිරීම් කටයුතු සඳහා පහසුකම් සැලසීම<br>(ii) ව්‍යාපෘතිය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා වූ සූදානම තහවුරු කිරීම සහ මාර්ග ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරන අධිකාරීන්හි ශක්‍යතාවය වැඩි දියුණු කිරීම අරමුණු කරන ලදී.<br><br>**ණය අරමුදල්**: වසර 11 ක් තුළ දී ඇ.ඩො. මිලියන 15.489 ක් උපයෝජනය කරන ලදී. ඇ.ඩො. මිලියන 0.145 ක ඉතුරුම් 2015 දී අවලංගු කරන ලදී. |

# වර්ෂ 2015 විශේෂ සිද්ධීන්

- **මැයි** – ආසියානු සංවර්ධන බැංකුවේ 47 වන වාර්ෂික රැස්වීම අසර්බයිජානයේ, බාකුහිදී පැවැත්විණි.
- **ණය ගිවිසුම් අත්සන් කිරීම**:
  - **මැයි** - ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන - දෙවන කොටස (ඇ.ඩො. මිලියන 107)
  - **සැප්තැම්බර්** – මහවැලි ජල ආරක්ෂණ ආයෝජන වැඩසටහන - පළමු කොටස (ඇ.ඩො. මිලියන 150)
  - **දෙසැම්බර්** – ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන - තෙවන කොටස (ඇ.ඩො. මිලියන 200)
- **ඉහළ පෙලේ උපදේශන කටයුතු සඳහා පැමිණි දූත කණ්ඩායම්**:
  - **ජනවාරි** - මෞරිසියෝ ගිර්ගා මහතා, ආසියානු සංවර්ධන බැංකුවේ විධායක අධ්‍යක්ෂ (බෙල්ජියම / ප්‍රංශය / ඉතාලිය / පෘතුගාලය / ස්පාඤ්ඤය / ස්විට්සර්ලන්තය)
  - **මාර්තු** – සොන්ග්ජින්ග් වැන්ග් මහතා, ආසියානු සංවර්ධන බැංකුවේ විධායක අධ්‍යක්ෂ (චීනය)
  - **මාර්තු** – හන් කිම් මහතා, අධ්‍යක්ෂ ජනරාල්, දකුණු ආසියා කලාපීය දෙපාර්තමේන්තුව
  - **සැප්තැම්බර්** – වෙන්කායි සැන්ග් මහතා, උප සභාපති (මෙහෙයුම් 1), ආසියානු සංවර්ධන බැංකුව
  - **ඔක්තෝම්බර්** – හැන්ස්-ජෝකිම් ෆවෙල් මහතා, ආසියානු බැංකුවේ ජර්මානු ගවනර්වරයා
  - **දෙසැම්බර්** – ගෝඩෙන්සියෝ සැන්ටිලෝන් හර්නැන්ඩස් (කනිෂ්ඨ) මහතා, විධායක අධ්‍යක්ෂ, ආසියානු සංවර්ධන බැංකුව
- ඉහත ඉහළ පෙළේ උපදේශන ධූත මණ්ඩල ද ඇතුළත්ව ආසියානු සංවර්ධන බැංකු ධූත මණ්ඩල 92 ක් 2015 වසරේදී ශ්‍රී ලංකාවට පැමිණ ඇත.

# ජපානය, කොරියාව, තායිලන්තය, වියට්නාමය, මැලේසියාව හා සිංගප්පූරුව අංශය

# ජපානය

## ජපාන සංවර්ධන සහයෝගීතාවය

ජපාන නිල සංවර්ධන සහයෝගීතාවය, දශක 6 කට වඩා දීර්ඝ කාලයක සිට ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජීය සංවර්ධනයෙහි ප්‍රධාන කාර්යභාර්යක් ඉටුකරනු ලබයි. 1965 වසරේ පටන්, ජපාන නිල සංවර්ධන සහයෝගීතාවය යෙන් ණය පැකේජ හරහා වාර්ෂිකව ලබාදෙන ලදී. මුල් කාලයේදී, ජපානයෙන් පාරිභෝගික භාණ්ඩ සහ පොහොර ආනයනය සඳහා පමණක් යෙන් ණය පැකේජ සීමා වුව ද, 1978 වසරේ පටන් මෙම තත්ත්වය තවදුරටත් පුළුල් වෙමින් විදුලිබල හා බලශක්තිය, ජල සම්පාදනය, වරාය, මහාමාර්ග, ප්‍රවාහනය, ගුවන් සේවා, සෞඛ්‍යය, කෘෂිකර්මය හා වාරිමාර්ග, ආපදා කළමනාකරණය, සන්නිවේදනය, ග්‍රාමීය සංවර්ධනය වැනි ක්ෂේත්‍රයන් ද ආවරණය කරන ලදී.

1965 වසරේ පටන්, ශ්‍රී ලංකා රජය ජපානයෙන් ලබා ගන්නා ලද නිල සංවර්ධන සහයෝගීතාවය ඇ.ඩො. මිලියන 7,994 ක් වන අතර, එය ඉතා සහනදායී පොලී අනුපාතික යටතේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති 113 කින් හා පාරිභෝගික භාණ්ඩ සඳහා වූ ණය ව්‍යාපෘති 15 කින් මෙන්ම ඇ.ඩො. මිලියන 1,326 ක් වූ ප්‍රදාන ආධාරවලින් සමන්විත වේ.

ජපාන රජය තම දායකත්වය, යෙන් ණය පැකේජ, ප්‍රදාන ආධාර, සංවර්ධන/ ශක්‍යතා අධ්‍යයන හා තාක්ෂණික සහයෝගිතා වැඩසටහන් යන විවිධ වූ ආකාරයන්ගෙන් ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය (JICA) හරහා මෙරටට ලබා දේ. ජපාන තාක්ෂණික සහයෝගීත්වය හරහා මෙරට ආර්ථික සංවර්ධනයට දායක වන ජපාන තාක්ෂණික දැනුම, අත්දැකීම් හා නිපුණතාවයන් හුවමාරු කර ගැනීමට අවස්ථාව සැලසෙන අතරම එය ඉතා ප්‍රතිඵල පාදක වන බව හඳුනාගෙන ඇත.

## 2015 වසරේදී ජපාන සංවර්ධන සහයෝගීතාවය


වර්තමාන ජපාන මූල්‍ය ආයෝජන කළඹ මේ වනවිට, ඇ.ඩො. මිලියන 350 - 400 පරාසයේ සිට ඇ.ඩො. මිලියන 500 කට අධික ප්‍රමාණයක් දක්වා වූ සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරනු ලබයි. ඒ අනුව, දැනට පවත්නා ජපාන ආයෝජන කළඹ 2015 වසරේදී අත්සන් කරන ලද ඇ.ඩො. මිලියන 565 ක් වූ සහනදායි ණය ආධාර දෙකකින් සහ ඇ.ඩො. මිලියන 4.1 ක් වූ එක් ප්‍රදාන ආධාරයකින් තවදුරටත් ඉහළ නැංවිණි.

| 45 වන යෙන් ණය පැකේජය | |
|---|---|
| **ජාතික විදුලිබල සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල සංවර්ධනය සහ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය - අදියර 1**<br>**ඇ.ඩො. මිලියන 200**<br><br>මහ කොළඹ හා ඒ ආශ්‍රිත ප්‍රදේශයන්හි ස්ථානගත ජාතික විදුලිබල සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාලයෙහි ධාරිතාවය ඉහළ නැංවීම මෙන්ම මෙරටට වඩා විශ්වාසනීය හා කාර්යක්ෂම වූ විදුලිබල සැපයුමක් ලබාදීම උදෙසා විදුලි රැහැන්, උපපොළවල් සහ විදුලිය බෙදාහැරීමේ රැහැන් ඉදිකිරීම සහ වැඩිදියුණු කිරීම මගින් විදුලි සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ නාස්තිය අවම කිරීමට පියවර ගැනීම ද මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කෙරේ. | **බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ සංවර්ධන ව්‍යාපෘතිය - අදියර 2 (II)**<br>**ඇ.ඩො. මිලියන 365**<br><br>සංචාරක කර්මාන්තයේ ප්‍රගමනය ද සමඟින් මෙරට ආර්ථික වර්ධනය ඉහළ නංවමින් පෙරදිග හා අපරදිග රටවල් සම්බන්ධ කරන කේන්ද්‍රස්ථානයක් බවට ශ්‍රී ලංකාව පත්කිරීමේ අරමුණින්, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළෙහි, ගුවන් මගීන් හැසිරවීමේ ධාරිතාවය ඉහළ නැංවීම හා ගුවන් තොටුපළෙහි යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම මෙම ව්‍යාපෘතිය යටතේ අපේක්ෂා කෙරේ. |

## 2015 වසරේ ඒකගතාවය

2015 වසරේ සමස්ත ඒකගතාවය ගුවන් සේවා, විදුලිබල හා බලශක්තිය, අධ්‍යාපන හා පුහුණු, මාර්ග හා පාලම්, සෞඛ්‍යය හා සුභසාධනය හා ඩිජිටල් මාධ්‍ය විකාශනය යන ප්‍රමුඛතම සංවර්ධන ක්ෂේත්‍රයන් වෙනුවෙන් ලබා ගන්නා ලදී.


**2015 වසරේ සමස්ත ඒකගතාවයෙහි ආංශික ව්‍යාප්තිය**



# 2015 වසරේ උපයෝජනය


2015 වසරේ සමස්ත උපයෝජනය ඇ.ඩො. මිලියන 175.06 කි.

**2015 වසරේ සමස්ත උපයෝජනය**




ඉහත සමස්ත උපයෝජනය, මාර්ග සංවර්ධන ක්ෂේත්‍රය සඳහා ඇ.ඩො. මිලියන 118.08 කින්, ජල සම්පාදනය හා සනීපාරක්ෂාව සඳහා ඇ.ඩො. මිලියන 40.84 කින්, සෞඛ්‍යය හා සුභසාධනය සඳහා ඇ.ඩො. මිලියන 10.18 කින්, විදුලිබල හා බලශක්තිය සඳහා ඇ.ඩො. මිලියන 4.07 කින්, මූල්‍ය හා රක්ෂණය සඳහා ඇ.ඩො. මිලියන 1.04 කින් සහ අධ්‍යාපන හා පුහුණු සේවා සඳහා වෙන් වූ ඇ.ඩො. මිලියන 0.86 කින් ද සමන්විතය.


**ජපාන ණය ආධාරයන්හී ආංශික ව්‍යාප්තිය 2005 – 2015**



## 2015 වසරේ ජපාන ප්‍රදාන ආධාර

2015 වසරේ ජපාන ප්‍රදාන ආධාර එකඟතාවය ඇ.ඩො. මිලියන 4.1 වන අතර, එම එකඟතාවය ජපාන දේශීය නිෂ්පාදන ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට ප්‍රදානය කිරීම සඳහා වූ ව්‍යාපෘති නොවන ප්‍රදාන ආධාර වේ.

**ජපාන ප්‍රදාන ආධාරයන්හී ආංශික ව්‍යාප්තිය 2005 – 2015**




## 45 වන යෙන් ණය පැකේජය යටතේ ලද ජපාන සංවර්ධන සහයෝගීතාවය

### බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ සංවර්ධන ව්‍යාපෘතිය - අදියර 2 (II)

ජපාන රජය විසින් නිල වශයෙන් කරන ලද ප්‍රතිඥාව ප්‍රකාරව, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය අදියර 2 (II) ක්‍රියාවට නැංවීම වෙනුවෙන් ජපන් යෙන් මිලියන 45,428 (ආසන්න වශයෙන් රුපියල් මිලියන 48,969) ක ණය මුදලක් ජපාන ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය (ජයිකා) වෙතින් ලබාදීමට ජපාන රජය විසින් එකඟතාවය පළ කරන ලදී.

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි, ගුවන් මගීන් හැසිරවීමේ ධාරිතාවය ඉහළ නැංවීම සහ එහි යටිතල ව්‍යුහය හා පහසුකම් වැඩිදියුණු කිරීම මඟින් ගුවන් මගීන්ට පහසුකම් සැලසීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධානතම අරමුණයි. ශ්‍රී ලංකාව පෙරදිග හා අපරදිග රටවල් සමඟ ඇතිකරගනු ලබන සහයෝගීතාවය හරහා මෙරට සංචාරක ක්ෂේත්‍රය සංවර්ධනය වන අතරම එමඟින් ආර්ථික වර්ධනය ඉහළ නැංවේ.

තවද මෙරටට පැමිණෙන සංචාරකයන් සංඛ්‍යාවෙහි අපේක්ෂිත වර්ධනය, මෙරට ආර්ථික වර්ධනයට දායක වන අතරම රැකියා අවස්ථා උත්පාදනයට ද හේතු වේ.

ඒ අනුව, රට තුළට පැමිණෙන සංචාරකයින්ගෙන් සියයට 99 ක් පමණ භාවිතා කරනු ලබන ප්‍රවේශ මාර්ගය වන මෙම ගුවන්තොටුපොළ අන්තර්ජාතික ප්‍රමිතීන්ට උචිත වන පරිදි සංවර්ධනය කිරීම සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රගමනය සඳහා මෙන්ම ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට ද මහඟු දායකත්වයක් ලබාදෙනු ඇත.

වසර 2020 වන විට, ගුවන් මගීන්ගේ සංචලනය මිලියන 14.5 ක් පමණ වෙතැයි පුරෝකථනය කර ඇත. එසේ සැළකීමේ දී, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළෙහි මගීන් හැසිරවීමේ ධාරිතාවය වාර්ෂිකව මිලියන 7.4 සිට මිලියන 15 දක්වා ඉහළ නැංවීමට දායක වන අයුරින් එම ගුවන්තොටුපොළ පුළුල් කිරීම උදෙසා අත්‍යාවශ්‍ය වන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ සංවර්ධන ව්‍යාපෘතිය - අදියර 2 (II) මඟින් සිදුකිරීමට අපේක්ෂිතය.

## ජාතික විදුලිබල සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල සංවර්ධනය සහ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය.

ශ්‍රී ලංකාවේ විදුලිබල අවශ්‍යතාවය පසුගිය දශකය තුළ වාර්ෂිකව සියයට 5 - සියයට 7 සාමාන්‍ය අගයකින් ඉහළ යමින් පවත්නා අතරම, මෙරට ආර්ථික සංවර්ධනය හේතුවෙන් මෙම තත්ත්වය ඉදිරියටත් අඛණ්ඩව පවතිනු ඇත. තවද, මෙරට විදුලිබල ඉල්ලුම වාර්ෂිකව සියයට 6.67ක් ලෙස ඉහළ යමින් පවත්නා බව ඇස්තමේන්තු ගත කර ඇති අතරම, ලංකා විදුලිබල මණ්ඩලයේ (2013 – 2032) දිගුකාලීන ජනන සැලැස්මට අනුව, ඉහත ඉල්ලුම සපුරාලීම සඳහා වර්ෂ 2020 වන විට ආසන්න වශයෙන් මෙගාවොට් 1,143 ක අතිරේක ධාරිතාවයක් ස්ථාපිත කළ යුතුය. ඒ අනුව, විදුලිබල සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාලය සංවර්ධනයට සමගාමීව විදුලිබල පද්ධති හානිය අවම කරගනිමින් විදුලිබල උත්පාදනය ඉහළ නැංවීමේ උපායමාර්ගවලට අනුගත වීම වැදගත්ය.

ජපාන රජය විසින් නිල වශයෙන් කරන ලද ප්‍රතිඥාව ප්‍රකාරව, ජාතික විදුලිබල සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල සංවර්ධනය සහ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය වෙතින් ජපන් යෙන් මිලියන 24,930 (ආසන්න වශයෙන් රුපියල් මිලියන 26,873) ක ණය මුදලක් ලබාදීමට ජපාන රජය එකඟ වී ඇත.

මහ කොළඹ හා ඒ ආශ්‍රිත ප්‍රදේශයන්හි ස්ථානගත ජාතික විදුලිබල සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාලයෙහි ධාරිතාවය ඉහළ නැංවීම මඟින් විදුලිබල සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ නාස්තිය අවම කිරීම සඳහා පියවර ගැනීම ද මෙම ව්‍යාපෘතිය මඟින් අපේක්ෂා කෙරේ.

ඉහත ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීම හරහා සම්ප්‍රේෂණ රැහැන්, උපපොළවල් සහ විදුලිය බෙදාහැරීමේ රැහැන් ඉදිකිරීම සහ වැඩිදියුණු කිරීම මඟින් මෙරටට වඩා විශ්වාසනීය වූ හා කාර්යක්ෂම වූ ද විදුලිබල සැපයුමක් ලබාදීමට අපේක්ෂිතය.

# 46 වන යෙන් ණය පැකේජය යටතේ එකඟ වී ඇති ව්‍යාපෘතීන් 2015/ 2016

### ජාතික විදුලිබල සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල සංවර්ධනය සහ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය අදියර II - ඇ.ඩො. මිලියන 121.58

නව හබරණ හා සාම්පූර් - කප්පල්තුරෙයි අතර අධි වෝල්ටීයතාවයකින් යුතු සම්ප්‍රේෂණ රැහැන් ඉදිකිරීම තුළින් විදුලිබල සම්ප්‍රේෂණ හානිය අවම කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. මෙරට විදුලිබල සැපයුම් ජාලයේ කාර්යක්ෂමතාවය සේම විශ්වාසනීයත්වය ද මෙම ව්‍යාපෘතිය හරහා ඉහළ නැංවේ.

### කළු ගඟ ජල සම්පාදනය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය අදියර I - ඇ.ඩො. මිලියන 285.15

මෙම ව්‍යාපෘතිය මඟින් සුරක්ෂිතව, සමානාත්මකව හා නොකඩවා ජලය බෙදාහැරීමට ඉඩ සැලසෙන අතරම නල ජල සම්පාදන පද්ධතිය පුළුල් කිරීම හා වැඩිදියුණු කරන ලද ජලය බෙදාහැරීමේ ජාලයන් සමඟින් ප්‍රාදේශීයව මනු කියවීමේ මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම මඟින් ආදායම් නොඋපදවන ජල ප්‍රමාණය අවම කරනු ලබයි. එමඟින්, ශ්‍රී ලංකාවේ කොළඹ හා කළුතර යන දිස්ත්‍රික්කවල වෙසෙන ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට ද මෙම ව්‍යාපෘතිය දායක වේ.

### අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය අදියර II - ඇ.ඩො. මිලියන 181.75

නිධන්ගත වකුගඩු රෝග සහ දන්තමය හා අස්ථිමය ප්ලෝරොසියාවට හේතු කාරක වන අනාරක්ෂිත භූගත ජල මූලාශ්‍රයන් මත යැපෙන ජනතාව ජීවත්වන අනුරාධපුර උතුර ප්‍රදේශයේ ජල සම්පාදන යෝජනා ක්‍රමයක් ඉදිකිරීම හරහා සෞඛ්‍යාරක්ෂිත පානීය ජල සැපයුමක් ලබාදීම හා ජල සම්පාදන ආවරණ කලාප ඉහළ නැංවීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. මෙම ව්‍යාපෘතිය අවසානයේ දී, ජලය ආශ්‍රිත රෝගාබාධ අවම කරගැනීමට මෙන්ම ප්‍රදේශවාසී ජනතාවගේ සනීපාරක්ෂක තත්ත්වය ඉහළ නැංවීමට ද අපේක්ෂිතය.

### තරඟකාරීත්වය - සංවර්ධන ප්‍රතිපත්තිමය ණය

ශ්‍රී ලංකාවේ ආර්ථික තරඟකාරීත්වය ඉහළ නංවමින්, ඊට අදාළ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමෙහිලා පහසුකම් සැලසීමෙන් ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික තිරසාරත්වය, පාලනය හා පෞද්ගලික ක්ෂේත්‍රයේ තරඟකාරීත්වය ඉහළ නැංවීම සංවර්ධන ප්‍රතිපත්තිමය ණය ලබා ගැනීමෙහි අරමුණකි.

## 2015 වසරේදී නිම කරන ලද ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | ණය මුදල ජපන් යෙන් මිලියන |
|---|---|
| ජල අංශයේ සංවර්ධන ව්‍යාපෘතිය | 13,231 |
| කළු ගඟ ජල සම්පාදන ව්‍යාපෘතිය - අදියර 1 – II | 8,388 |
| මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය - අදියර I | 21,917 |
| පළාත්/ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (මධ්‍යම, සබරගමුව) | 9,156 |
| දිළිඳුකම පිටුදැකීම සඳහා වූ සුළු පරිමාණ ණය ව්‍යාපෘතිය | 2,575 |

# 2015 වසරේ ක්‍රියාත්මක ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | මුදල (ජපන් යෙන් මිලියන) |
|---|---|
| **ණය** | |
| නුවර නගරයේ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය | 14,087 |
| මහකොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය - අදියර II | 31,688 |
| වවුනියා කිලිනොච්චි සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය II | 1,422 |
| හබරණ වේයන්ගොඩ සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය | 9,573 |
| මහකොළඹ සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ නාස්තිය අවම කිරීමේ ව්‍යාපෘතිය | 15,941 |
| ජාතික මාර්ග ජාලයේ ප්‍රධාන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 12,381 |
| නාය යෑම් ආපදා වලින් ජාතික මාර්ග ජාලය ආරක්ෂා කරගැනීමේ ව්‍යාපෘතිය | 7,619 |
| අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය - අදියර I | 5,166 |
| බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ සංවර්ධන ව්‍යාපෘතිය - අදියර 2-I | 28,969 |
| කැළණි ගඟ හරහා නව පාලමක් ඉදි කිරීමේ ව්‍යාපෘතිය | 35,020 |
| භෞමික රූපවාහිනී විකාශන කටයුතු ඩිජිටල්කරණය කිරීමේ ව්‍යාපෘතිය | 13,717 |
| ගාලු වරාය සංවර්ධන ව්‍යාපෘතිය | 14,495 |
| ජාතික විදුලිබල සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල සංවර්ධනය සහ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය | 24,930 |
| **ප්‍රදාන** | |
| කිලිනොච්චි ජල සම්පාදන යෝජනා ක්‍රමය පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය | 8.3 |
| වෛද්‍ය උපකරණ සැපයීම වෙනුවෙන් වූ ව්‍යාපෘති නොවන ප්‍රදාන ආධාර | 11.0 |
| මඩකැණීමේ යන්ත්‍රයක් නිර්මාණය කර සැපයීමේ ව්‍යාපෘතිය | 10.4 |
| කාර්මික උපකරණ සැපයීම | 3.7 |
| ජපාන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන සෙසු රජයන් වෙත ප්‍රදානය කිරීම සඳහා වූ ව්‍යාපෘති නොවන ප්‍රදාන ආධාර | 2.1 |
| ශ්‍රී ලංකාවේ අධිවේගී මාර්ගයන්හි ආරක්ෂිත ප්‍රවාහන පහසුකම් ස්ථාපිත කිරීම වෙනුවෙන් රථවාහන ගමනාගමන තොරතුරු පද්ධතියක් සැපයීමේ ව්‍යාපෘතිය | 9.9 |
| ජපාන දේශීය නිෂ්පාදන සැපයීම වෙනුවෙන් වූ ව්‍යාපෘති නොවන ප්‍රදාන ආධාර | 500.0 |

# කොරියාව

කොරියානු ජනරජයේ සහනදායි ණය ආධාර කොරියානු අපනයන - ආනයන බැංකුවේ ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදල (EDCF) හරහා ලබාදෙන අතර ප්‍රදාන ආධාර කොරියානු අන්තර්ජාතික සහයෝගිතා ආයතනය මඟින් (KOICA) ලබා දේ.

වර්ෂ 1990 සිට ශ්‍රී ලංකාවේ සංවර්ධන ව්‍යාපෘති 27ක් මූල්‍යයනය කිරීම සඳහා ඇ.ඩො. මිලියන 600 ක පමණ ණය ආධාර EDCF මඟින් ශ්‍රී ලංකාව ලබාගෙන ඇත. වර්තමානයේදී සංවර්ධන ව්‍යාපෘති සඳහා වන උපකරණ අවශ්‍යතාව සපුරාලීම සඳහා මෙම කොරියානු අරමුදල විසින් 'සංයුක්ත ණය ආධාර' නමින් නව ක්‍රමවේදයක් හඳුන්වා දී තිබේ.

2012 – 2016 කාලපරිච්ඡේදය සඳහා වූ සහභාගිත්ව ක්‍රමෝපාය සැලැස්ම අනුව හඳුනාගත් ආර්ථික හා සමාජීය යටිතල පහසුකම්, තාක්ෂණික, වෘත්තීය පුහුණු සහ ද්විතියික අධ්‍යාපනය සහ යහපාලනය යන ක්ෂේත්‍රයන් ඉදිරි EDCF කාර්යරාමු එකඟතාවයෙහි ද ප්‍රමුඛ ක්ෂේත්‍රයන් වේ.

රටේ පවතින ඉදිරි යටිතල පහසුකම් අවශ්‍යතාවය සහ යෝජිත නාගරික සංවර්ධන ක්‍රමෝපායන් සලකා බලමින් කොරියානු අපනයන - ආනයන බැංකුව 2016 – 2018 කාලපරිච්ඡේදය සඳහා කාර්යරාමු එකඟතාවයෙහි ණය මුදල ඇ.ඩො. මිලියන 300 – 500 දක්වා වැඩි කිරීමට එකඟ වී ඇත.

**EDCF ණය ආධාර සඳහා වර්තමාන මූල්‍ය නියමයන්**

| මූල්‍ය නියමයන් | සාමාන්‍ය මූල්‍ය නියමය | කොරියානු උපදේශකවරු සහභාගී වීම | පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය |
|---|---|---|---|
| **පොලී අනුපාතිකය** | 0. 20% | 0. 15% | පොලී රහිත |
| **ආපසු ගෙවීම** | වසර 30 | වසර 40 | |
| **සහන කාලය** | වසර 10 | | වසර 10 - 15 |
| **ණය ප්‍රමාණය** | සම්පූර්ණ ව්‍යාපෘති වියදම | | |
| **මුදල් වර්ගය** | කොරියානු වොන් | | |
| **ශක්‍යතා අධ්‍යනය** | ප්‍රමුඛ ව්‍යාපෘති සඳහා ප්‍රදාන ලෙස | | |


## 2015 වර්ෂයේ එකඟ වූ ව්‍යාපෘතීන්

| ව්‍යාපෘතියේ නම | අරමුණ | සංවර්ධන පාර්ශ්වකරු | මුදල (ඇ.ඩො. මිලියන) |
|---|---|---|---|
| හැටන් - නුවරඑළිය මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (පරිපූරක) | මාර්ග තදබදය අඩු කිරීම සහ මාර්ග ආරක්ෂාව වැඩි කිරීම. | EDCF ණය | 17. 1 |
| ශ්‍රී ලංකාවේ අපරාධ පරීක්ෂණ ආයතනයන්හි සහ එම නිලධාරීන්ගේ හැකියාවන් වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඩිජිටල් සාක්ෂි විශ්ලේෂණ පරීක්ෂණ හැකියාවන් දියුණු කිරීම. | KOICA - ප්‍රදාන | 3.2 |

## 2015 වර්ෂයේ සම්මුති සාකච්ඡා පැවැත් වූ ව්‍යාපෘතීන්


| ව්‍යාපෘතිය | ණය වර්ගය | මුදල ඇ.ඩො. මිලියන | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| මහනුවර නගරයේ දී කොළඹ-මහනුවර සහ මහනුවර-මහියංගන මාර්ග සම්බන්ධ කරන උමං මාර්ගය ඉදිකිරීම | EDCF ණය | 150 | EDCF විසින් ශක්‍යතා අධ්‍යයනය සිදු කරමින් පවතී. |
| මාර්ගගත අධ්‍යයන පහසුකම් සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම | EDCF ණය | 50 | EDCF විසින් ශක්‍යතා අධ්‍යයනයක් සිදුකිරීමට නියමිතය. |
| ශ්‍රී ලංකාවේ භූවිද්‍යා තොරතුරු පද්ධතියක් සකස් කිරීම | EDCF ණය | 50 | ව්‍යාපෘති යෝජනාව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් අධ්‍යයනය කරමින් පවතියි. |
| සාගර විශ්වවිද්‍යාලයක් පිහිටුවීම. | EDCF ණය<br>KOICA ප්‍රදාන | 50 | KOICA විසින් මූලික අධ්‍යනයක් සිදු කරමින් පවතී. |
| ශ්‍රී ලංකාවේ විද්‍යුත් බදු ක්‍රමවේදයක් සකස් කිරීම. | EDCF ණය | 40 | EDCF මෙහි අවශ්‍යතාව පෙන්වා ඇත. ව්‍යාපෘති යෝජනාව සකස් කළ යුතුය. |
| උතුරු පළාත් සහා පරිපාලන ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම | EDCF ණය | 34 | නාගරික සංවර්ධන අධිකාරිය විසින් මාන්කුලම් සංවර්ධන සැලැස්ම පිළියෙල කරමින් පවතියි. |
| කුඩා පරිමාණ ජලපිරිපහදු පද්ධති ඉදි කිරීම (මනම්පිටිය, සෝමාවතිය) | EDCF සංයුක්ත ණය | 5 | කොරියානු උපදේශකවරු ශක්‍යතා අධ්‍යයන වාර්තාව සකසමින් පවතියි. |
| අපද්‍රව්‍ය එකතු කිරීමේ රථ ලබා ගැනීම. | EDCF සංයුක්ත ණය | 5 | කොරියානු උපදේශකවරු ශක්‍යතා අධ්‍යයන වාර්තාව සකසමින් පවතියි. |
| මහනුවර නගරයේ ප්‍රවාහන ජාලය වැඩිදියුණු කිරීම සඳහා සැලැස්මක් සැකසීම. | EDCF ප්‍රදාන | - | තාක්ෂණික සහය EDCF ලබාදීමට නියමිතය. |
| තාක්ෂණික විෂයධාරාව සඳහා ගුරු විද්‍යාලයක් ස්ථාපනය කිරීම. | KOICA ප්‍රදාන | 13 | ක්‍රියාකාරී සැලැස්ම සම්පූර්ණ කර ඇත. සම්මුති සාකච්ඡාවන්හී එකඟතාවය පිළියෙල කරමින් පවතියි. |
| කොට්කාවත්ත - මුල්ලේරියාව ප්‍රදේශයේ අපද්‍රව්‍ය දහනය සඳහා කුඩා පරිමාණ භෂ්මකයක් ස්ථාපනය කිරීම. | KOICA ප්‍රදාන | 9.5 | සම්මුති සාකච්ඡාවන්හී එකඟතාවය පිළියෙල කරමින් පවතියි. |
| කොරියා - ශ්‍රී ලංකා මිත්‍රත්ව රෝහල - මාතර අදියර 2 | KOICA ප්‍රදාන | 9.0 | සම්මුති සාකච්ඡාවන්හී එකඟතාවය පිළියෙල කරමින් පවතියි. |

## 2015 වර්ෂයේදී එකඟතා




2015 වර්ෂයේ කොරියානු ආධාර, ණය සහ ප්‍රදාන ලෙස ඇ.ඩො. මිලියන 20.3 මුදලක් ලබාගෙන ඇත. ඒ අතරින් ඇ.ඩො. මිලියන 17.14 ක ණය ආධාරයක් හැටන් - නුවරඑළිය මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (පරිපූරක ණය) මූල්‍යයනය කිරීම සඳහා ලබාගෙන ඇති අතර ශ්‍රී ලංකාවේ අපරාධ පරීක්ෂණ ආයතනයන්හි හා එම නිලධාරීන්ගේ හැකියා වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය මූල්‍යයනය කිරීම සඳහා ඇ.ඩො. මිලියන 3.2 ක් ප්‍රදාන ආධාරයක් ලෙස ලබාගෙන ඇත.

## 2015 වර්ෂයේදී උපයෝජනය




2015 වර්ෂයේ මුළු උපයෝජන ප්‍රමාණය ඇ.ඩො. මිලියන 23 කි. මෙම උපයෝජන ප්‍රධාන වශයෙන් මහාමාර්ග (සියයට 63) සහ ජල සම්පාදන (සියයට 29) අංශ සඳහා වාර්තා වී ඇත.

## ශ්‍රී ලංකා අපරාධ පරීක්ෂණ ආයතනයන්හි හා එම නිලධාරීන්ගේ හැකියා වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ හැකියා වර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් වෙනුවෙන් KOICA, ඇ.ඩො. මිලියන 3.2 ලබාදීමට එකඟ වී ඇත.

මෙම ව්‍යාපෘතිය මඟින් රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඩිජිටල් සාක්ෂි සහ DNA විශ්ලේෂණ සම්බන්ධ පරීක්ෂණ සිදුකිරීමේ හැකියාව වර්ධනය කිරීම උදෙසා, නවීන උපකරණ වලින් සමන්විත ඩිජිටල් සාක්ෂි සහ DNA විශ්ලේෂණ පරීක්ෂණාගාරයක් රජයේ රස පරීක්ෂණ දෙපාර්තමේන්තුව තුළ සහ ඩිජිටල් සාක්ෂි එකතු කිරීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා නවීන පුහුණු මධ්‍යස්ථානයක් අපරාධ පරීක්ෂණ

දෙපාර්තමේන්තුව තුළ ස්ථාපිත කිරීමට නියමිතය. තවද, ව්‍යාපෘතිය යටතේ කොරියානු විශේෂඥයන්ගේ ව්‍යෝහාරික විශ්ලේෂණ අත්දැකීම් හා විශේෂඥ ඥානය හුවමාරු කරගැනීමටද අපේක්ෂිතය.

මෙම ව්‍යාපෘතිය, අධිකරණ අමාත්‍යාංශය යටතේ රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව සහ නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය යටතේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් 2015 සිට 2017 දක්වා වසර තුනක කාලයක් තුළ ක්‍රියාවට නංවයි.

2015 දෙසැම්බර් මස 10 වන දින මෙම ව්‍යාපෘතියට අදාළව පවත්වන ලද සම්මුති සාකච්ඡාවන්හි එකඟතාවයට අධිකරණ අමාත්‍යාංශය, නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ KOICA යන ආයතනයන්හි නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් අත්සන් කරන ලදී.

# ප්‍රාග්ධන වෙළඳපොළ, ලෝක බැංකුව හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් අංශය

## ප්‍රාග්ධන වෙළඳපොළ අංශය

සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා දේශීය බැංකු වෙතින් අරමුදල් සම්පාදනය කිරීම සහ ජාත්‍යන්තර වෙළඳපොළ තුළින් විදේශ විනිමය ණය ලබාගැනීම සඳහා පහසුකම් සැලසීම ප්‍රාග්ධන වෙළඳපොළ අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ.

### දේශීය බැංකුවලින් මූල්‍යයනය සම්පාදනය කිරීම

මාර්ග සංවර්ධන අධිකාරියට, මාර්ග සංවර්ධන ව්‍යාපෘති 64ක් මූල්‍යයනය කිරීම සඳහා රුපියල් බිලියන 151.7 ක් දක්වා දේශිය බැංකුවලින් අරමුදල් සම්පාදනය කරගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. 2015.12.31 දින වන විට මාර්ග සංවර්ධන අධිකාරිය රුපියල් මිලියන 126.6 ක් උපයෝජනය කර ඇති අතර, මාර්ග පුනරුත්ථාපන සහ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති 30 ක් නිම කර ඇත.

තවද, මෙම ප්‍රමුඛතා මාර්ග සංවර්ධන ව්‍යාපෘතිවලට අමතරව, කොළඹ කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ (CKE) වැඩ විෂය පථයෙහි වෙනස්වීම් ක්‍රියාත්මක කිරීම සඳහා මූල්‍ය පහසුකම් සැපයීම, පිටත වටරවුම් අධිවේගී මාර්ගය (OCH) අදියර III කඩවත සිට කෙරවළපිටිය දක්වා වූ කොටස (කොන්ත්‍රාත් සුපරීක්ෂණය සඳහා උපදේශන සේවා සැපයීම සඳහා මූල්‍ය පහසුකම් සැපයීම) ආදී විදේශ අරමුදල්වලින් ක්‍රියාත්මක වන මාර්ග සංවර්ධන ව්‍යාපෘතිවලට අවශ්‍ය හිඟ අරමුදල් දේශීය බැංකු වෙතින් සම්පාදනය කරගැනීම සඳහා පහසුකම් සලසන ලදී.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වර්ෂ 2013 දී ජල සම්පාදන ව්‍යාපෘතිවල ආයෝජනය කිරීමට රුපියල් බිලියන 29.1ක් දක්වා ද, වර්ෂ 2014 ජූනි මාසයේදී අතිරේක ජල සම්පාදන ව්‍යාපෘති 04ක් ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් බිලියන 10ක් දක්වා ද දේශීය බැංකුවලින් අරමුදල් සම්පාදනය කරගැනීමට අනුමැතිය ලබා ගෙන ඇත. රට තුළ සුරක්ෂිත පානීය ජල පහසුකම් සැපයීම වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් නව රජයේ වැඩි අවධානයක් යොමු වී ඇති බැවින්, දේශීය කොන්ත්‍රාත්කරුවන් මඟින් ජල සම්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා දේශිය බැංකුවලින් අරමුදල් සම්පාදනය කිරීම කඩිනම් කර ඇත. ඒ අනුව, 2015 වර්ෂය තුළදී, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට, ජල සම්පාදන ව්‍යාපෘති 09 ක් ක්‍රියාත්මක කිරීම සඳහා දේශීය බැංකු සමඟ රුපියල් බිලියන 34.1ක් පමණ වූ ණය ගිවිසුම්වලට එළඹීමට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබාදෙන ලදී.

**දේශීය බැංකු විසින් මූල්‍යයනය කරනු ලබන ජල සම්පාදන ව්‍යාපෘති පිළිබඳ විස්තර**

(රුපියල් මිලියන)

| ජල සම්පාදන ව්‍යාපෘතිය | කොන්ත්‍රාත්කරු | බැංකුව | වටිනාකම |
|---|---|---|---|
| කොළඹ නගරයේ ජල සම්පාදනය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - අදියර 1 | V.V. Karunaratne & Company | ලංකා බැංකුව | 2,792.07 |
| කොළඹ නගරයට නැගෙනහිරින් පිහිටි නගර - 1 වන පැකේජය සඳහා වන ජල සම්පාදන ව්‍යාපෘතිය | Access Engineering PLC | ලංකා බැංකුව | 4,700.00 (හදිසි අවස්ථා අරමුදල් 470 සමඟ) |
| බෙන්තොට ජල සම්පාදන ව්‍යාපෘතිය | K.D.A.Weerasinghe & Co (Pvt) Ltd | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 1,000.00 (මතුපිට ඇතිරීමේ ගාස්තු 239.47 සමඟ) |
| රුහුණුපුර බෙදාහැරීමේ ජල සම්පාදන ව්‍යාපෘතිය | K.D.A.Weerasinghe & Company (pvt) Ltd | කොමර්ෂල් බැංකුව | 1,929.61 |
| අම්පාර බෙදාහැරීමේ ජල සම්පාදන ව්‍යාපෘතිය | Sunpower Construction (pvt) Ltd | ජාතික සංවර්ධන බැංකුව, ලංකා බැංකුව සහ ඩීඑෆ්සීසී බැංකුව | 6,848.06 |
| අම්පාර බෙදාහැරීමේ ජල සම්පාදන ව්‍යාපෘතිය | Sunpower Construction (pvt) Ltd | ජාතික සංවර්ධන බැංකුව, ලංකා බැංකුව සහ ඩීඑෆ්සීසී බැංකුව | 6,848.06 |
| ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් ආවරණය කරන නළ ජල සැපයුම් සේවා ප්‍රදේශය පුළුල් කිරීම සඳහා ජල සම්පාදන ව්‍යාපෘති 22 ක් ක්‍රියාත්මක කිරීම | National Water Supply & Drainage Board | ලංකා බැංකුව | 3,499.00 |
| ලග්ගල ජල සම්පාදන ව්‍යාපෘතිය | Hovael, CML-MTD Joint Venture | හැටන් නැෂනල් බැංකුව | 3,670.97 ( තාවකාලික මුදල් 824.90 සමඟ) |
| විල්ගමුව ජල සම්පාදන ව්‍යාපෘතිය | Hovael, CML-MTD Joint Venture | හැටන් නැෂනල් බැංකුව, ජාතික සංවර්ධන බැංකුව | 3,113.41 ( 10% ක හදිසි අවස්ථා අනිශ්චිත මුදල් වන 311.34 සහ 5% ක මිළ ඉහළ යාම වන 155.67 සමඟ) |
| කොළඹ දිස්ත්‍රික්කයේ නැගෙනහිර නගර සඳහා වන ජල සම්පාදන ව්‍යාපෘතිය - III වන පැකේජය වන හෝමාගම, පාදුක්ක සහ සීතාවක ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයන්හි බෙදාහැරීමේ ජාලය සඳහා HDPE/DI නල සපයා ඇතිරීමේ ව්‍යාපෘතිය | Sierra Construction (Pvt) Ltd | ලංකා බැංකුව | 8,716.97 (තාවකාලික මුදල් 460.75 සහ 10% ක හදිසි අවස්ථා අනිශ්චිත මුදල් වන 871.69 සමඟ) |
| ඌරගස්මන්හංදිය, ගෝනාපීනුවල, දික්කුඹුර, වැලිගම ජල සම්පාදන ව්‍යාපෘතිය | Squire Mech Engineering (Pvt) Ltd | ලංකා බැංකුව, මහජන බැංකුව | 1,595.26 (10% ක හදිසි අවස්ථා අනිශ්චිත මුදල් වන 159.52 සමඟ) |
| කොළඹ දිස්ත්‍රික්කයේ නැගෙනහිර නගර සඳහා වන ජල සම්පාදන ව්‍යාපෘතිය - II වන පැකේජය | Maga Engineering Ltd | ලංකා බැංකුව | 3,663.61 (තාවකාලික මුදල් 793.00 සහ 10% ක හදිසි අවස්ථා අනිශ්චිත මුදල් වන 366.36 සමඟ) |
| ගලගෙදර / මාවතගම ජලසම්පාදන ව්‍යාපෘතිය | Maga Engineering (Pvt) Ltd | ඩීඑෆ්සීසී බැංකුව | 2,564.12 (තාවකාලික මුදල් 220.58 සහ හදිසි අවස්ථා අනිශ්චිත මුදල් වන 278.47 සහ රේගු බදු වන 63.06 ක් සමඟ) |
| කොස්ගම, අවිස්සාවේල්ල ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය | International Construction Consortium (Pvt) Ltd | ලංකා බැංකුව | 1,062.39 තාවකාලික මුදල් 213.80 සහ 10% ක හදිසි අවස්ථා අනිශ්චිත මුදල් වන 106.23 සමඟ) |
| මැදිරිගිරිය ජල සම්පාදන ව්‍යාපෘතිය | Sanken Construction (Pvt) Ltd | ලංකා බැංකුව | 1,363.66 (10% ක හදිසි අවස්ථා අනිශ්චිත මුදල් වන 136.37 සමඟ) |

මෙම ව්‍යාපෘතිවලින් බහුතරයක් මූල්‍යයනය කිරීම සඳහා සාමාන්‍ය බර තැබූ ප්‍රමුඛ ණයදීමේ අනුපාතය (AWPLR) ට එකතු කළ සියයට 2. 25 ක වාර්ෂික පොලී අනුපාතිකයක් මත, වසර 2½ ක සහන කාලයක්ද ඇතුළුව වසර 14½ ක දී ගෙවා නිම් කාලයක් සහිතව දේශීය බැංකු විසින් අරමුදල් සම්පාදනය කර ඇත. මෙම ව්‍යාපෘතිවලින් සමහරක් නිදන්ගත වකුගඩු රෝගය සහිත ප්‍රදේශ ආවරණය කරයි.

**යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රාජ්‍ය ව්‍යවසායන්වලට දේශිය බැංකු ණය සපයා දීම**

| රාජ්‍ය ව්‍යවසායේ නම / ව්‍යාපෘතිය | බැංකුව | 31.12.2015 දිනට ගිවිසුම්ගත මුදල (රු.බි.) | 31.12.2015 දිනට උපයෝජනය වූ මුදල (රු.බි.) |
|---|---|---|---|
| මාර්ග සංවර්ධන අධිකාරිය - ප්‍රමුඛතා මාර්ග සංවර්ධන ව්‍යාපෘති | ලංකා බැංකුව | 36.70 | 29.80 |
| | මහජන බැංකුව | 14.60 | 13.96 |
| | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 55.40 | 54.33 |
| | හැටන් නැෂනල් බැංකුව | 28.26 | 15.41 |
| | කොමර්ෂල් බැංකුව | 7.20 | 6.04 |
| | ඩීඑෆ්සිසී බැංකුව | 1.30 | 1.04 |
| | ජාතික සංවර්ධන බැංකුව | 8.35 | 5.98 |
| මාර්ග සංවර්ධන අධිකාරිය - කොළඹ කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘතිය | මහජන බැංකුව | ඇ.ඩො.මි. 44.7 | ඇ.ඩො.මි. 43.56 |
| මාර්ග සංවර්ධන අධිකාරිය - පිටත වටරවුම් අධිවේගී මාර්ගය (කොන්ත්‍රාත් සුපරීක්ෂණය සඳහා උපදේශන සේවා සැපයීම සඳහා මූල්‍ය පහසුකම් සැපයීම) | ලංකා බැංකුව | 1.8 | රු.මි. 297.02 |
| ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධන සංස්ථාව - වේරස් ගඟ වැසි ජල අපවහන හා පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 14.2 | 2.79 |
| ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | ජාතික ඉතිරිකිරීමේ බැංකුව, ලංකා බැංකුව, මහජන බැංකුව, හැටන් නැෂනල් බැංකුව, ජාතික සංවර්ධන බැංකුව, කොමර්ෂල් බැංකුව | 52.13 | 9.38 |
| ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව විද්‍යායතනය (NSBM) - යෝජිත ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව විද්‍යායතනයේ විශ්වවිද්‍යාල සංකීර්ණය හෝමාගම ඉදිකිරීම | ලංකා බැංකුව | 8.6 | 4.9 |
| කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (KDU) | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | ඇ.ඩො.මි. 201.6 | 3.16<br>ඇ.ඩො.මි. 104.43 |
| සීමාසහිත ලංකා නැව් සංස්ථාව- නෞකා දෙකක් මිළදී ගැනීම (පැනමැක්ස් භාණ්ඩ ප්‍රවාහන නෞකා 02ක්) | මහජන බැංකුව | ඇ.ඩො.මි. 80.0 | ඇ.ඩො.මි. 51.81 |
| උසස් අධ්‍යාපන අමාත්‍යාංශය - මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනය සංවර්ධනය කිරීම හා ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය | කොමර්ෂල් බැංකුව, හැටන් නැෂනල් බැංකුව | 10.3 | 3.71 |

## ජාත්‍යන්තර වෙළඳපොළ තුළින් විදේශ කාලීන ණය පහසුකම් ලබාගැනීම

2015 මැයි මස, ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනු කමිටුව විසින් මූලික වශයෙන් විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකමක් ලබාගැනීම සඳහා ප්‍රධාන ජාත්‍යන්තර බැංකු වෙත ප්‍රවේශ වීම අනුමත කරන ලදී. ඒ අනුව, යෝජනා කැඳවීමක් ප්‍රසිද්ධ කරන ලද අතර, ඒ සඳහා ලද ප්‍රතිචාර ලැයිස්තුගත කරන ලදී. මේ සම්බන්ධයෙන් අදාළ සාකච්ඡා කටයුතු සිදු කරමින් පවතින අතර, 2016 වර්ෂයේ මැද භාගයේදී අදාළ ණය මුදල ලබාගැනීමට අපේක්ෂා කෙරේ.

## දේශීය ණය ප්‍රාග්ධන වෙළඳපොළ උපදේශනය හා ශ්‍රී ලංකා ජාත්‍යන්තර බැඳුම්කර නිකුත් කිරීම සඳහා පහසුකම් සැලසීම

ශ්‍රී ලංකාව වර්ෂ 2007 දී වසර 5ක කල් පිරීමේ කාලයක් සහිත ඇ.ඩො. මිලියන 500ක් වටිනා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සියයට 8.75 ක පොලී අනුපාතිකයකට නිකුත් කරමින් ජාත්‍යන්තර ණය ප්‍රාග්ධන වෙළඳපොළ වෙත ප්‍රවේශ වන ලදී. ඉන්පසු පිළිවෙළින් 2009, 2010, 2011, 2012 සහ 2014 යන වර්ෂවලදී ද, ශ්‍රී ලංකාව ණය ප්‍රාග්ධන වෙළඳපොළ භාවිත කරන ලදී.

2015 වර්ෂය තුළ 2015 මැයි මාසයේදී ඇ.ඩො. මිලියන 650ක සහ 2015 ඔක්තෝම්බර් මාසයේදී ඇ.ඩො. මිලියන 1,500ක ජාත්‍යන්තර බැඳුම්කර නිකුත් කරන ලදී. මෙම බැඳුම්කර දෙක කල්පිරීමේ කාලය වසර 10ක් සහිතව පිළිවෙලින් සියයට 6.125 සහ සියයට 6.850 ක පොලී අනුපාතිකයකට මිල කරන ලදී.

**ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම**

| නම | නිකුත් කළ දිනය | ශ්‍රේණිගත කිරීම (Moody's/S &P/Fitch) | වටිනාකම (ඇ.ඩො.මි.) | කූපන් අගය (%) | කල්පිරීමේ කාලය (අවුරුදු) | කල්පිරීමේ දිනය | 31.12.2015 දිනට මිල | 31.12.2015 දිනට එලදාව (%) |
|---|---|---|---|---|---|---|---|---|
| SL'12 | 17/10/2007 | --/B+/BB- | 500 | 8.250 | 5 | 17/10/12 | *Retired* | *Retired* |
| SL'15 | 22/01/2009 | --/B+/BB- | 500 | 7.400 | 6 | 22/01/15 | *Retired** | *Retired** |
| SL'19 | 06/01/2014 | B1/B+/BB- | 1,000 | 6.000 | 5 | 14/01/19 | 98.07 | 6.712 |
| SL'19 | 07/04/2014 | B1/B+/BB- | 500 | 5.125 | 5 | 07/04/19 | 95.25 | 6.758 |
| SL'20 | 30/10/2010 | B1/B+/BB- | 1,000 | 6.250 | 10 | 30/10/20 | 96.76 | 7.059 |
| SL'21 | 27/07/2011 | B1/B+/BB- | 1,000 | 6.250 | 10 | 27/07/21 | 95.29 | 7.291 |
| SL'22 | 25/07/2012 | B1/B+/BB- | 1,000 | 5.875 | 10 | 25/07/22 | 91.31 | 7.577 |
| SL'25 | 28/05/2015 | B1/B+/BB- | 650 | 6.125 | 10 | 28/05/25 | 88.98 | 7.797 |
| SL'25 | 27/10/2015 | B1/B+/BB- | 1,500 | 6.850 | 10 | 27/10/25 | - | - |

*මූලාශ්‍රය : Barclays Bank, HSBC and Citi Bank (Joint Lead Managers for the issuances)*
**2015 ජනවාරි මාසයේදී කල්පිර ගෙවා පියවන ලදී.*

**සංස්ථානික ජාත්‍යන්තර බැඳුම්කර නිකුත්කිරීම**

| නම | නිකුත් කළ දිනය | ශ්‍රේණිගත කිරීම * | වටිනාකම (ඇ.ඩො.මි) | කූපන් අගය (%) | කල්පිරීමේ කාලය (අවුරුදු) | කල්පිරීමේ දිනය | 31.12.2015 දිනට මිල | 31.12.2015 දිනට එලදාව (%) |
|---|---|---|---|---|---|---|---|---|
| BoC'17 | 03/05/2012 | --/--/BB- | 500 | 6.875 | 05 | 03/05/17 | 100.63 | 6.373 |
| BoC'18 | 16/04/2013 | --/--/BB- | 500 | 5.325 | 05 | 16/04/18 | 96.88 | 6.811 |
| NSB'18 | 18/09/2013 | --/B+/BB- | 750 | 8.875 | 05 | 18/09/18 | 102.25 | 7.930 |
| DFCC'18 | 31/10/2013 | --/B/B+ | 100 | 9.625 | 05 | 31/10/18 | N/A | N/A |
| NSB'19 | 10/09/2014 | --/B+/BB- | 250 | 5.150 | 05 | 10/09/19 | 92.50 | 7.507 |
| Airlines | 23/06/2014 | --/B+/BB- | 175 | 5.300 | 05 | 23/06/19 | 93.50 | 7.445 |

***මූලාශ්‍රය : Barclays Bank,***

# ලෝක බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් අංශය

## ලෝක බැංකු සමූහය සමඟ සංවර්ධන සබැඳියාව

සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා ලෝක බැංකු අරමුදල් යොදා ගැනීම අතින් දිගුකාලීන සබැඳියාවක් ශ්‍රී ලංකාව හා ලෝක බැංකුව අතර පවතී. මෙකී අරමුදල් ණය හෝ ප්‍රදාන ලෙස ලබාදෙන අතර, ඒවා ලබාදීමේ යාන්ත්‍රණය ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සමායතනය (IDA) සහ ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා අන්තර්ජාතික බැංකුව (IBRD) හරහා සිදු කෙරෙන අතර, අරමුදල් සම්පාදනය කරන ක්‍රමවේදය ක්‍රියාත්මක වන්නේ ශ්‍රී ලංකාවටම අනන්‍ය "දේශීය සහභාගිත්ව උපායමාර්ග" නම් වූ සංවර්ධන ප්‍රතිපත්ති රාමුවකට අනුකූලවය. 2013 සිට 2016 කාලසීමාව දක්වා මෙම සංවර්ධන ප්‍රතිපත්ති රාමුව ක්‍රියාත්මක වෙමින් පවතී. IBRD බැංකුවේ අරමුදල් ලබා ගැනීමේදී සහනදායී හා සහනදායී නොවන යන දෙයාකාරයෙන්ම සම්මිශ්‍රණය වූ කොන්දේසිවලට අනුව ණය ලබාගැනීමට සිදුවන මුත්, 2015 වසරේදී සහනදායී ණය ලබාදෙන IDA ආයතනයෙන් ණය හෝ ප්‍රදාන ලෙස අරමුදල් ලබාගැනීමට රජය විසින් හැකි සෑම පරිශ්‍රමයක්ම දැරීය. වර්තමාන දේශීය සහයෝගීත්ව උපායමාර්ග යටතේ සක්‍රීය ආයෝජන ප්‍රමාණය ඇ.ඩො. මිලියන 1,819.5ක් වේ.

**2015 වසරේ ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති**

(ඇ.ඩො. මිලියන)

| වැඩසටහන/ව්‍යාපෘතිය | මුදල |
|---|---|
| නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය | 101.5 |
| වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය | 65.3 |
| උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය | 147.0 |
| හදිසි දේශගුණික ආපදා සඳහා වන විශේෂ ණය ව්‍යාපෘතිය | 102.0 |
| දේශගුණික අවබලපෑම් අවම කිරීමේ වැඩසටහන | 110.0 |
| ආපදා අවදානම් කළමනාකරණ ව්‍යාපෘතිය | 0.4 |
| අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව හා වැඩසටහන | 128.3 |
| උතුරු නැගෙනහිර පළාත් පාලන සේවාවන් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 70.8 |
| සෞඛ්‍යය අංශයේ සංවර්ධන ව්‍යාපෘතිය | 196.0 |
| කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය | 213.9 |
| මළාපවහන සේවාව සඳහා ගෘහස්ථ ප්‍රවේශතාවය වැඩිදියුණු කිරීම | 5.1 |
| විසිඑක්වන ශතවර්ෂය සඳහා වූ උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය | 40.0 |
| පළාත්බඳ මාර්ග ව්‍යාපෘතිය | 105.0 |
| සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන ව්‍යාපෘතිය | 57.4 |
| ගුදම් කුවිතාන්සි මූල්‍යකරණ ව්‍යාපෘතිය | 6.9 |
| මාර්ග අංශ සහාය ව්‍යාපෘතිය | 100.0 |
| දිරි සවිය ව්‍යාපෘතිය | 2.5 |
| අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව හා වැඩසටහන (ප්‍රදාන) | 28.0 |
| වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණය (අතිරේක මූල්‍යයනය) | 83.0 |
| උතුරු නැගෙනහිර පළාත් පාලන සේවාවන් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - ප්‍රදාන | 20.5 |
| කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය - ප්‍රදාන | 0.9 |

| වැඩසටහන/ව්‍යාපෘතිය | මුදල |
|---|---|
| පූර්ව ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය | 50.0 |
| ජල සැපයුම් හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (අතිරේක මූල්‍යයනය) | 165.0 |
| උතුරු නැගෙනහිර පළාත් පාලන සේවාවන් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (අතිරේක මූල්‍යයනය) | 20.0 |
| **එකතුව** | **1,819.5** |

# එකඟතාවයන්

ණය හා ප්‍රදාන වශයෙන් ලෝක බැංකුවෙන් ඇ.ඩො. මිලියන 235ක ප්‍රමාණය ලබාගැනිමට ශ්‍රී ලංකාවට 2015 වර්ෂයේදී හැකි විය. මෙහිදී දිස්ත්‍රික්ක 7ක නලජල හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ඇ.ඩො. මිලියන 165ක මුදලක් උපයෝජනය කිරීමට හැකිවිය. මෙවැනි ක්ෂේත්‍රයන්හි වැඩි ආයෝජනයන් මඟින් පිළිඹිබුවන්නේ ජල හා පූර්ව ළමාවිය සංවර්ධනය වැනි ප්‍රතිලාභ ලැබීමට කාලයක් ගතවන ආයෝජන ක්ෂේත්‍ර සඳහා ලෝක බැංකුව වැනි සහනදායී මූල්‍ය ප්‍රභව වලින් ණය ලබා ගැනීම රජයේ අරමුණ බවයි.


**2015 වසරේදී ලෝක බැංකුව සමඟ අත්සන් කළ මූල්‍ය ගිවිසුම්**

| ව්‍යාපෘතිය | ණය මුදල (ඇ.ඩො. මිලියන) | අරමුණ |
|---|---|---|
| ජල සැපයුම් හා සනීපාරක්ෂාව දියුණු කිරීමේ ව්‍යාපෘතිය | 165.0 | මෙම ව්‍යාපෘති මඟින් මුලතිව්, කිලිනොච්චි, නුවරඑළිය, බදුල්ල, කෑගල්ල, මොණරාගල හා රත්නපුර යන තෝරාගත් දිස්ත්‍රික්ක තුළ ජල සැපයුම හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමත්, සිදු කරනු ලබයි. |
| පූර්ව ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය | 50.0 | අවුරුදු 5ට අඩු දරුවන්ගේ සෞඛ්‍යය සනීපාරක්ෂාව හා පෝෂණය වැඩිදියුණු කිරීම තුළින් ඔවුන් සඳහා සුරක්ෂිත පරිසරයක් තහවුරු කිරීම. |
| උතුරු නැගෙනහිර පළාත් පාලන සේවාවන් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා වූ අතිරේක මූල්‍යයනය | 20.0 | උතුරු හා නැගෙනහිර පළාත් පාලන ආයතනවලින් ලබාදෙන සේවාවන් වැඩිදියුණු කිරීම සඳහා සහය ලබාදීමත් පළාත් පාලන ප්‍රදේශවල ඇති අවශ්‍යතාවයන් හඳුනාගනිමින් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමෙන් සිදුකරනු ලබයි. මෙහි දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘතිය මඟින් ප්‍රාදේශීය සභා 65ක් නගර සභා 12ක් හා මහ නගර සභා 3ක් ආවරණය කරනු ලබයි. මුල් ව්‍යාපෘතිය අදාළ රජය විසින් සැපයීම නියමිත වූ දේශීය අරමුදල් වල හිඟවූ ප්‍රමාණය (ඇ.ඩො. මිලියන 34ක මුදලින්, ඇ.ඩො. මිලියන 20ක මුදල් ප්‍රමාණයක්) මෙම අතිරේක මූල්‍යයනය මඟින් මූල්‍යයනය කෙරේ. |

# උපයෝජන

වර්තමාන ලෝක බැංකු ආයෝජන යටතේ 2015 වසර සඳහා උපයෝජන ප්‍රමාණය ඇ.ඩො. මිලියන 155 ක් වේ. ඉන් වැඩිම උපයෝජන ප්‍රමාණයක් සෞඛ්‍යය අංශය සඳහා වෙන්විය.

2015 වසරේ උපයෝජනයන්හි ආංශීය ව්‍යාප්තිය




## ඉදිරි පියවරයන්

- ආංශීය ප්‍රතිසංස්කරණ අරමුණු කරගත් සංවර්ධන ප්‍රතිපත්ති ණය ලබාගැනීම සඳහා අදාළ සියළු පාර්ශ්ව සමඟ සාකච්ඡා හා උපදේශන පැවැත්වීමට රජයට හැකිවූ අතර, මේ පිළිබඳව අවසන් තීරණයකට එළඹීම සඳහා වූ සාකච්ඡා ඉදිරියේදී පැවැත්වීමට සැලසුම් කර ඇත.

- අදාළ සියළු අමාත්‍යාංශ සහ පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වයෙන් මෙරට අවශ්‍යතාවයන් හඳුනාගැනීමේ ක්‍රමවේදය (Systematic Country Diagnostic) ලෝක බැංකුව විසින් පැවැත්වූ අතර, මෙහි සොයා ගැනීම්වලට අනුකූලව මීළඟ දේශීය සහයෝගිත්ව උපායමාර්ග (2017 -2020) සකස් කිරීම සිදු කෙරෙනු ඇත.

- 2016 වසරේ ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් ව්‍යාපෘති සඳහා සාකච්ඡාවන් රජය විසින් පවත්වන ලදී.
  - පරිසර පද්ධති ආරක්ෂණ කළමනාකරණ ව්‍යාපෘතිය - ඇ.ඩො. මිලියන 45
  - උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය (අතිරේක මූල්‍යයනය) - ඇ.ඩො. මිලියන 55
  - කෘෂිකාර්මික අංශය නවීකරණ ව්‍යාපෘතිය - ඇ.ඩො. මිලියන 125
  - මූල්‍ය ආංශීය තක්සේරුකරණ ව්‍යාපෘතිය - ඇ.ඩො. මිලියන 100
  - ප්‍රවාහන සම්බන්ධතා හා වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය - ඇ.ඩො. මිලියන 125


# චීනය

චීනය යනු ප්‍රදාන හා ණය ස්වරූපයෙන් මූල්‍ය ආධාර සපයන ප්‍රධාන සංවර්ධන පාර්ශ්වකරුවෙකි. ප්‍රදාන මෙන්ම පොලී රහිත ණය චීන රජය වෙතින් දෙනු ලබන අතර චීන ආනයන-අපනයන බැංකුව (EXIM), චීන සංවර්ධන බැංකුව (CDB) සහ චීන කර්මාන්ත හා වාණිජ බැංකුව (ICBC) වෙතින් ණය ලබා දේ.

2011 - 2015 දක්වා වූ පසුගිය වසර 5 තුළ චීනයෙන් කරන ලද මුළු එකඟතාවය ඇ.ඩො. මිලියන 4,977ක් විය. පසුගිය වසර 5ක කාලය තුළ සිදුකරන ලද මුළු එකඟතාවයෙන් ඉහළම එකඟතාවය 2014 වසරේදී සිදුකර ඇත. එය ඇ.ඩො. මිලියන 2,612ක් වූ අතර එයට සමගාමීව පිළිවෙලින් 2012 සහ 2010 වර්ෂවලදී ඇ.ඩො. මිලියන 1,056 හා 829ක එකඟතාවයන් සිදුකර ඇත. 2014 වසරේ චීන ආනයන අපනයන බැංකුව සමඟ පිටත වටරවුම් අධිවේගී මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතිය අදියර 111 සඳහා ද දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය (අදියර 1 සහ 4) සඳහා ද හම්බන්තොට ජාත්‍යන්තර කේන්ද්‍රයේ මාර්ග සහ ගුවන් පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ද එකඟතාවයන් සිදුකර ඇති අතර, චීන සංවර්ධන බැංකුව සමඟ ප්‍රමුඛතා මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය 111 (අදියර 1 සහ 11) සඳහා එකඟතාවයක් ද සිදු කරන ලදී.

චීනයෙන් ලද මූල්‍ය ආධාර මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන් මඟින් පසුගිය වර්ෂ පහක කාලයේදී වාර්තා කරන ලද සමස්ත උපයෝජනය ඇ.ඩො. මිලියන 3,370ක් විය. චීන ආනයන අපනයන බැංකුව හා චීන සංවර්ධන බැංකුවේ එකතුවෙන් 2015 සඳහා වන මූල්‍ය දායකත්වයන්ගේ ඉහළම උපයෝජනය වන ඇ.ඩො. මිලියන 488ක් 2015 වසරේ වාර්තා කර ඇත.

## 2011 සිට 2015 දක්වා එකඟතා සහ උපයෝජනයන් (ඇ.ඩො. මිලියන)





*රාජ්‍ය ව්‍යාපාර ලබාගත් ණය මුදල්වල උපයෝජනයන් අන්තර්ගත කර ඇත.

# ආංශික ව්‍යාප්තිය

පසුගිය වසර පහක කාලය තුළ චීනයේ සහය ප්‍රධාන වශයෙන්ම ලබා ගන්නා ලද්දේ මාර්ග හා පාලම්, විදුලිබල හා බලශක්ති සහ වරාය හා ගුවන්සේවා යන අංශයන් සංවර්ධනය කිරීම සඳහාය.

**උපයෝජනයන්හි ආංශික ව්‍යාප්තිය - 2015**




* රාජ්‍ය ව්‍යාපාර ලබාගත් ණය මුදල්වල උපයෝජනයන් අන්තර්ගත කර ඇත.

මෙහි ඉහළම අගය මාර්ග සංවර්ධන අංශය තුළ වාර්තා වන අතර ඉහළම උපයෝජනය සඳහා වන අගය වූ ඇ.ඩො. මිලියන 109ක් ප්‍රමුඛතා ව්‍යාපෘති අදියර 111-1 කොටස යටතේ වාර්තා වී ඇත.

චීන අරමුදල් යටතේ 2015 වසර තුළ පහත සඳහන් ව්‍යාපෘති නිම කරන ලදී.

- පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය - අදියර 11
- හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතියේ පළමු අදියරෙහි අතිරේක වැඩ කොටස් හා ඒ වෙනුවෙන් වූ අවශ්‍ය උපකරණ සැපයීම
- පුත්තලම - මරිච්චිකඩේ - මන්නාරම මාර්ගයන්හි කිලෝමීටර් 113ක් ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීම
- නවත්කුලි - කරයිතිව් - මන්නාරම මාර්ගයන්හි කිලෝමීටර් 67ක් ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීම

ඉහත ව්‍යාපෘතීන්හි කාර්ය සාධනයට අමතරව ඒකාබද්ධ කමිටුව යටතේ ක්‍රියාත්මක වන ආර්ථික සහයෝගීතාවය පිළිබඳ වූ ක්‍රියාකාරී කණ්ඩායම 2016 ජනවාරි 06 දින රැස්විය. මෙම රැස්වීම විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආර්.එම්.පී. රත්නායක මහතා සහ චීන වාණිජ අමාත්‍යාංශයේ උපදේශක යැන්ග් වෙයිකුන් මහතාගේ සම සභාපතීත්වයෙන් පැවැත්විණි.

මෙම ඒකාබද්ධ කමිටුවෙහි පරමාර්ථය වන්නේ රටවල් දෙක අතර පවතින ආර්ථික හා වෙළඳ සහයෝගීතාවය හා මිත්‍රශීලී සම්බන්ධතාවය තවදුරටත් දියුණු කිරීම හා ශක්තිමත් කිරීමයි. මෙය රටවල් දෙක අතර පවතින ආර්ථික හා වෙළඳ සම්බන්ධතාවයට බාධා වන විවිධ බාධක හා ප්‍රශ්න විසඳන ඵලදායී වේදිකාවක් වී තිබේ.

ආර්ථික සහයෝගීතාවය හා වෙළඳ සහයෝගීතාවය යටතේ යෝජනා සහ නිර්දේශ ඉදිරිපත් කිරීමට ඒකාබද්ධ කමිටුව යටතේ ක්‍රියාකාරී තාක්ෂණික කණ්ඩායම් දෙක ක්‍රියාකරයි. ආර්ථික සහයෝගීතාවය පිළිබඳ වූ කමිටුව ආයෝජන ප්‍රවර්ධනය, යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ චීන ආධාර වෙත අවධානය දක්වන අතරතුර වෙළඳ සහයෝගීතාවය සඳහා වන කමිටුව වෙළඳ ප්‍රවර්ධනය හා නිදහස් වෙළඳ ගිවිසුම් සඳහා වන එකඟතාවයන් මත වැඩකරනු ඇත. 2016 වර්ෂයේ මැද භාගයේදී ඒකාබද්ධ කමිටුවෙහි 7 වන සභා වාරය සඳහා ශ්‍රී ලංකාව සත්කාරකත්වය දැරීමට නියමිතව ඇති අතර එය ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ රාජ්‍ය අමාත්‍යවරයාගේ මඟ පෙන්වීම යටතේ පැවැත්වෙනු ඇත.

මෙයට අමතරව ආසියානු යටිතල පහසුකම් සංවර්ධන බැංකුවෙහි ප්‍රාරම්භක සාමාජිකයෙක් වන ලෙසට චීන රජය විසින් ශ්‍රී ලංකාවට නිල වශයෙන් ඇරයුම් කර ඇත. චීන මුදල් අමාත්‍යාංශය මඟින් කරන ලද ඇරයුම ශ්‍රී ලංකාවේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් පිළිගෙන ඇති අතර ආසියානු යටිතල පහසුකම් සංවර්ධන බැංකුව පිහිටුවීමට අදාළ බහුපාර්ශ්වීය සාකච්ඡා වට සඳහා සහභාගී වී ඇත.

ආසියානු යටිතල පහසුකම් සංවර්ධන බැංකුව ස්ථාපිත කිරීම, ආසියාව තුළත් පිටතත් ඇති අමතර සම්පත් එකතු කර ගැනීමට, ආසියාව තුළ ඇති තනි ආර්ථිකයක් මුහුණ දෙන දුෂ්කරතා මඟහැර ගැනීමට හා ආසියාව තුළ තිරසාර වර්ධනයක් ඇති කිරීමට පවතින බහුපාර්ශ්වීය සංවර්ධන බැංකු මඟින් ඌනපූර්ණ සැපයීමට ඉවහල් වේ. කැබිනට් අමාත්‍යවරුන්ගේ අනුමැතියට යටත්ව ශ්‍රී ලංකා රජය විසින් රටවල් 22 සමඟ අවබෝධතා ගිවිසුමකට ඇතුළත් වී ඇත.

එකඟතාවන් පිළිබඳ ගිවිසුම අත්සන් කිරීමේ නිල උත්සවය 2015 ජූනි මස 29 දින චීනයේ බීජිං නුවරදී පැවැත්වුණු අතර රජය වෙනුවෙන් ගරු මුදල් අමාත්‍යතුමා එකඟතාවන් පිළිබඳ ගිවිසුම අත්සන් කරන ලදී. ආසියානු යටිතල පහසුකම් සංවර්ධන බැංකුව ශ්‍රී ලංකාව තුළ ක්‍රියාකාරීත්වයේ පවතින අතර වලංගු කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කරමින් සිටියි.

# මැද පෙරදිග හා දකුණු ආසියානු රටවල්


## මැද පෙරදිග රටවල්

ශ්‍රී ලංකාවේ සමාජයීය හා ආර්ථික සංවර්ධනය කෙරෙහි මැද පෙරදිග සංවර්ධන පාර්ශ්වකරුවන් විසින් කැපී පෙනෙන මෙහෙයක් සිදු කරනු ලබයි. 1970 දශකයේ මැද භාගයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ සංවර්ධන ප්‍රමුඛතාවයන් ඉලක්ක කරගනිමින් මෙම පාර්ශ්වකරුවන් විසින් ඇ.ඩො. මිලියන 1,177ක් පමණ ලබා දී ඇත.


මැද පෙරදිග ද්වීපාර්ශ්වීය සංවර්ධන පාර්ශ්වකරුවන් වන සංවර්ධනය සඳහා වන සෞදි අරමුදල, අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වන කුවේට් අරමුදල හා ඉස්ලාමීය ඉරාන ජනරජය මෙන්ම බහුපාර්ශ්වීය ආයතන වන අන්තර්ජාතික සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල සහනදායී ණය හා අපනයන ණය පහසුකම් හරහා ශ්‍රී ලංකාව වෙත සිය මහඟු දායකත්වය ලබා දෙයි. එමෙන්ම බහරේන් රජය, කසකස්ථාන රජය සහ ඕමාන රජය විසින් ශ්‍රී ලංකාවේ සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රදාන ද ලබා දී ඇත. මෙවැනි සංවර්ධන පාර්ශ්වකරුවන් සමඟ ද්වීපාර්ශ්වීය සබඳතා තව දුරටත් පුළුල් කිරීමේ අරමුණු පෙරදැරිව ඊශ්‍රායලය හා අබුඩාබි යන රටවල ආයතන සමඟ මූලික සාකච්ඡා ආරම්භ කර ඇත.

මෙම ණය අරමුදල් බොහොමයක් වාරිමාර්ග, මාර්ග හා පාලම්, බලශක්ති හා සෞඛ්‍යය ක්ෂේත්‍ර සඳහා ආයෝජනය කර ඇත. මෙම ණය පහසුකම්වලට අදාළ ප්‍රසම්පාදන නිර්දේශයන් වැනි මැදපෙරදිග සංවර්ධන පාර්ශ්වකරුවන්ගේ නම්‍යශීලී කොන්දේසි මෙන්ම සහනදායී පොලී අනුපාතික සහ දීර්ඝ නැවත පියවීමේ කාලය ශ්‍රී ලංකාව වෙත වඩා වාසිදායක වේ.

**මැදපෙරදිග සංවර්ධන පාර්ශ්වකරුවන් සමඟ ඇතිකරගත් එකඟතා 2007 - 2015 (ඇ.ඩො. මිලියන)**



# ඒකඟතා සහ උපයෝජනය





පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා 2015 වර්ෂයේ දී සෞදි අරමුදල සහ අන්තර්ජාතික සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල සමඟ ණය ගිවිසුම් අත්සන් කරන ලදී. පසුගිය වර්ෂයන් හා සැසඳීමේදී මෙම වර්ෂය තුළ මැද පෙරදිග සංවර්ධන පාර්ශ්වකරුවන්ගෙන් ලැබුණු ඒකඟතාවයන් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබේ. මෙම ඒකඟතාවයන්ගෙන් වැඩිකොටසක් මාර්ග හා පාලම් අංශයන්හි ව්‍යාපෘති සඳහා ලැබී ඇත.

**2015 වසරේදී ගිවිසුම් ගතවූ මූල්‍ය පහසුකම් (ඇ.ඩො. මිලියන)**

| | ණය මුදල |
|---|---|
| **සංවර්ධනය සඳහා වන සෞදි අරමුදල** | |
| - බදුල්ල - චෙන්කලාඩි මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 60.0 |
| - අපස්මාර රෝහල හා සෞඛ්‍යය මධ්‍යස්ථාන ව්‍යාපෘතිය (අතිරේක මූල්‍යයනය) | 12.0 |
| **ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල** | |
| - බදුල්ල - චෙන්කලාඩි A 5 මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 60.0 |
| - බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | 17.0 |

**ආංශික ඒකඟතා - 2015**




ඉහත සඳහන් ණය ගිවිසුම්වලට අමතරව අරාබි ආර්ථිකය සඳහා වන කුවේට් අරමුදල විසින් නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍යය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම උදෙසා ඇ.ඩො. මිලියන 34ක ණය පහසුකමක් ලබාදීමට ඒකඟතාවය පළ කරන ලදී. ඊට අදාළ ණය සම්මුති සාකච්ඡා 2015 වසර තුළදී අවසන් කරන ලදී.

# 2015 වසරේදී ක්‍රියාත්මක වූ ව්‍යාපෘති

**ක්‍රියාත්මක වන ව්‍යාපෘති**

(ඇ.ඩො. මිලියන)

| | | ණය මුදල |
|---|---|---|
| **සංවර්ධනය සඳහා වන සෞදි අරමුදල** | | |
| - | අපස්මාර රෝහල හා සෞඛ්‍යය මධ්‍යස්ථාන ව්‍යාපෘතිය | 20.0 |
| - | කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය | 46.0 |
| - | මාර්ග ජාලා සංවර්ධන ව්‍යාපෘතිය | 60.0 |
| - | තට්ටුත්තුරෙයි පාලම ඉදි කිරීම | 0.6 |
| **අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වන කුවේට් අරමුදල** | | |
| - | අග්නිදිග විශ්වවිද්‍යාල සංවර්ධන ව්‍යාපෘතිය (B –I අදියර) | 10.5 |
| - | කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය | 37.0 |
| - | පාලම් 25ක් ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය | 35.0 |
| **අන්තර් ජාතික සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල** | | |
| - | කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය | 16.0 |
| - | ජාතික මහාමාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | 8.0 |
| - | මාර්ග ජාලා සංවර්ධන ව්‍යාපෘතිය | 40.0 |
| - | කොළඹ ජාතික මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | 50.0 |
| **ඉරාන අපනයන සංවර්ධන බැංකුව** | | |
| - | උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය* | 450.0 |
| - | ග්‍රාමීය විදුලියන ව්‍යාපෘතිය - 8** | 83.4 |


*සටහන :*

**ඉරානය වෙත ඇමෙරිකා එක්සත් ජනපදය හා යුරෝපීය සංගමය විසින් පනවන ලද ආර්ථික සම්බාධක හේතුවෙන් විදේශ අරමුදල් නොලැබී යාම හේතුවෙන් තාවකාලික පිළියමක් ලෙස ශ්‍රී ලංකා රජය විසින් දේශීය අරමුදල් භාවිතා කරමින් නැවත විදේශීය අරමුදල් ලැබෙන තුරු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි.*

***විදේශීය අරමුදල් නොලැබීම හේතුවෙන් ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය විසින් තාවකාලිකව දේශීය අරමුදල් මගින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි*

2015 වසර තුළ මැදපෙරදිග පාර්ශ්වකරුවන් වෙතින් උපයෝජනය කරන ලද සමස්ත මුදල ඇ.ඩො. මිලියන 40.7ක් වන අතර මෙයින් සියයට 55ක් මාර්ග හා පාලම් අංශය සඳහා වැය කරන ලදී.

**ආංශික උපයෝජනය 2015**



# 2015 වසරේදී අවසන් කරන ලද ව්‍යාපෘති

2015 වසරේදී පහත දැක්වෙන ව්‍යාපෘතිවල වැඩ අවසන් කරන ලදී.

| ව්‍යාපෘති | | සංවර්ධන පාර්ශ්වකරු | මුදල ඇ.ඩො. මිලියන |
|---|---|---|---|
| **ණය** | | | |
| - | සුනාමි ව්‍යසනයෙන් හානි වූ ප්‍රදේශවල තෘතියික අධ්‍යාපනය හා පරිපාලන යටිතල පහසුකම් සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය | KFAED | 20.5 |
| - | පාලම් ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | KFAED | 17.0 |
| - | ග්‍රාමීය විදුලියන ව්‍යාපෘතිය | EDBI | 83.4 |
| **ප්‍රදාන** | | | |
| - | අභ්‍යන්තර අවතැන්වූවන් සඳහා බහරේන් ව්‍යාපෘතිය | බහරේන් රජය | 1.1 |
| - | පාරිසරික ව්‍යසනයන්ට ඔරොත්තුදෙන නිවාස ව්‍යාපෘතිය | ඕමාන් රජය | 1.0 |
| - | කසකස්ථාන නිවාස ව්‍යාපෘතිය | කසකස්ථාන රජය | 0.2 |

# ඉදිරි පියවර

2016 වසර තුළදී පහත දැක්වෙන ව්‍යාපෘති මූල්‍යයනය කිරීම සඳහා මැදපෙරදිග සංවර්ධන පාර්ශ්වකරුවන් සමඟ ණය ගිවිසුම් වෙත එළඹීමට අපේක්ෂා කරනු ලැබේ. සංවර්ධනය සඳහා වන සෞදි අරමුදල මෙම ව්‍යාපෘති අනුමත කිරීම සඳහා මූලික අධ්‍යයනයක් සිදුකර අවසන් කර ඇත. තවද සංවර්ධනය සඳහා වන අබුඩාබි අරමුදල සමඟ පැවති සබඳතා නැවත ප්‍රතිස්ථාපනය කිරීම පිණිස සාකච්ඡා ආරම්භ කර ඇත.

**මැදපෙරදිග සංවර්ධන පාර්ශ්වකරුවන් සමඟ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති**

*(ඇ.ඩො. මිලියන)*

| | | |
|---|---|---|
| **සංවර්ධනය සඳහා වන සෞදි අරමුදල** | | |
| - | වයඹ විශ්වවිද්‍යාල නගර සංවර්ධන ව්‍යාපෘතිය | 20.0 |
| - | මහවැලි වම් ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය | 60.0 |
| - | ගම්පහ සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල අපනයන කෘෂිකාර්මික සහ කිරි නිෂ්පාදන ක්ෂේත්‍ර වැඩිදියුණු කිරීම මගින් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය | 25.0 |
| **අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වන කුවේට් අරමුදල** | | |
| - | නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍යය ආරක්ෂණ විද්‍යා පීඨ ගොඩනැගිලි සංකීර්ණය ඉදි කිරීම. | 34.0 |
| - | කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය (අතිරේක මූල්‍යයනය) | 26.0 |
| **සංවර්ධනය සඳහා වන අබු - ඩාබි අරමුදල** | | |
| - | ජාතික ඉ-ඉගෙනුම් පද්ධතිය ස්ථාපනය කිරීම (ආර්ථික සංවර්ධන සහයෝගීතා අරමුදල - කොරියානු අපනයන ආනයන බැංකුව සමඟ සම-මූල්‍යයනය) | 25.0 |

# දකුණු ආසියානු රටවල්

## ඉන්දියාව

පසුගිය වර්ෂ 40 කට අධික කාලය තුළ දකුණු ආසියානු කලාපයෙහි ශ්‍රී ලංකාවේ ප්‍රධානතම සංවර්ධන පාර්ශ්වකරු වන්නේ ඉන්දියානු රජයයි. පසුගිය අවුරුදු කිහිපය තුළ ශ්‍රී ලංකාවේ ඉන්දියානු සෘජු ආයෝජන සාතීය ලෙස ව්‍යාප්ත වී ඇත. ඉන්දියානු සංවර්ධන සහයෝගීතාවය ණය, ප්‍රදාන සහ තාක්ෂණික සහාය යන ක්‍රම ඔස්සේ අප රටට ගලා එයි. මෙම සංවර්ධන සහාය ප්‍රධාන වශයෙන් ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය, ජීවනෝපාය සංවර්ධනය, අධ්‍යාපනය, සෞඛ්‍යය, කුසලතා ගොඩනැංවීම සහ ආර්ථික නව්‍යකරණය ඉලක්ක කරයි.

වර්තමානයේ ඉන්දියානු ආනයන - අපනයන බැංකුව විසින් ණය පහසුකම් ලබා දෙන අතර, විශේෂ සංවර්ධන ව්‍යාපෘති සහ කුඩා සංවර්ධන ව්‍යාපෘති යන යෝජනා ක්‍රම තුළින් ඉන්දියානු රජය විසින් ප්‍රදානයන් ලබාදෙනු ලැබේ.

2015 මාර්තු මාසයේ ගරු ඉන්දීය අග්‍රාමාත්‍ය, නරේන්ද්‍ර මෝඩි මහතා ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වූ අතර, එය වසර 27කට පසු ඉන්දියානු අගමැතිවරයෙක් ශ්‍රී ලංකාවේ සිදු කළ ප්‍රථම නිල සංචාරයයි. මෙම නිල සංචාරය අතරතුර ඔහු විසින් ශ්‍රී ලංකාවේ දුම්රිය ක්ෂේත්‍රය වැඩි දියුණු කිරීම සඳහා ඇ.ඩො. මිලියන 318 ක නව ඉන්දියානු ණය මාලාවක් ලබාදෙන බවට නිවේදනය කළේය. මෙම ණය පහසුකම දැනට පවතින දුම්රිය මාර්ග වැඩි දියුණු කිරීම සඳහා ද දුම්රිය මැදිරි හා එන්ජින් මිලදී ගැනීම සඳහා ද භාවිත කිරීම රජයේ අපේක්ෂාවයි. තවද, ඉන්දියානු ආනයන - අපනයන බැංකුව විසින් ශ්‍රී ලංකාවේ දුම්රිය සේවය වැඩිදියුණු කිරීම සඳහා 2008 වර්ෂයේ සිට මේ දක්වා ණය මාලා හතරක් ලබාදෙමින් දැනටමත් ඇ.ඩො. මිලියන 967 කට ආසන්න මූල්‍ය පහසුකම් සහනදායී කොන්දේසි යටතේ ලබාදී ඇත.

ඉන්දියානු රජය විසින් ශ්‍රී ලංකාවේ බොහෝ සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් ප්‍රදානයන් ලබාදී ඇත. ඇ.ඩො. මිලියන 267 ක් වන නිවාස 50,000 ව්‍යාපෘතිය, යාපනය සංස්කෘතික මධ්‍යස්ථානය නවීකරණය කිරීම, වව්නියාව දිස්ත්‍රික් රෝහල වෙනුවෙන් ඇඳන් 200 ක වාට්ටු සංකීර්ණයක් ඉදිකිරීම හා ඒ සඳහා වෛද්‍ය උපකරණ ලබාදීම සහ රුහුණු විශ්වවිද්‍යාලයෙහි නවීන පහසුකම්වලින් සමන්විත නව ශ්‍රවණාගාරයක් ඉදිකිරීම මෑත වකවානුව තුළ ඉන්දියානු රජයේ ප්‍රදානයන් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති කිහිපයකි.

### 2015 වර්ෂයේ එකඟතාවයන්

රුහුණු විශ්වවිද්‍යාලයෙහි නවීන පහසුකම්වලින් සමන්විත නව ශ්‍රවණාගාරයක් ඉදිකිරීම සඳහා රු. මිලියන 300 ක ප්‍රදානයක් ලබා දීමට ඉන්දියානු රජය එකඟ වූ අතර ඒ වෙනුවෙන් වන අවබෝධතා ගිවිසුමට 2015 දී වර්ෂයේ අත්සන් තැබිණි.


ගරු ඉන්දීය අග්‍රාමාත්‍යතුමාගේ නිල සංචාරය අතරතුර ඉන්දියානු රජය විසින් ශ්‍රී ලංකාව තුළ හදිසි පූර්ව රෝහල් ප්‍රතිකාර ජංගම ගිලන්රථ සේවාවක් ආරම්භ කිරීම සඳහා ඇ.ඩො. මිලියන 7.6 (රු. මිලියන 1,000 ) ක ප්‍රදානයක් ලබාදීමට එකඟතාවය පළ කරන ලදී. 2015 සැප්තැම්බර් මාසයේ යෙදුණු ගරු ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යතුමාගේ ඉන්දීය නිල සංචාරය අතරතුරේදී මෙම ව්‍යාපෘතිය සඳහා ලිපි හුවමාරු කරගැනීමක් සිදුවිය. මීට අමතරව වව්නියාව දිස්ත්‍රික් රෝහලෙහි ඉදිකරන ලද ඇඳන් 200 කින් සමන්විත වාට්ටු සංකීර්ණය සඳහා වෛද්‍ය උපකරණ ලබාදීම සඳහා රු. මිලියන 100 ක ප්‍රදානයක් ලබාගැනීම වෙනුවෙන් වූ අවබෝධතා ගිවිසුමට අත්සන් තැබීම ද මෙම නිල සංචාරය තුළ දී සිදුවිය.

**ශ්‍රී ලංකාව තුළ හදිසි පූර්ව රෝහල් ප්‍රතිකාර ගිලන් රථ සේවාවක් ස්ථාපිත කිරීම**

ශ්‍රී ලංකාව තුළ මාර්ග අනතුරු, හෘද රෝග, විෂ ශරීරගතවීම්, හදිසි ආපදා තත්ත්වයන්, ක්ෂතිය ආදී විවිධ හේතූන් නිසා හදිසි වෛද්‍ය ප්‍රතිකාර සඳහා වන අවශ්‍යතාවය වේගයෙන් ඉහළ යමින් පවතී. එවැනි තත්ත්වයන්ට ගොදුරුවූවන්ගේ ජීවිත රැකගැනීම සඳහා වහාම වෛද්‍ය ප්‍රතිකාර ලබාදීම අත්‍යවශ්‍ය කරුණකි. මෙම අවශ්‍යතාවය හඳුනාගත් ශ්‍රී ලංකා රජය, ශ්‍රී ලංකාව තුළ හදිසි පූර්ව රෝහල් ප්‍රතිකාර ගිලන් රථ සේවාවක් ස්ථාපනය කිරීම සඳහා මූලික අඩිතාලම දමා තිබේ.

මෙම ව්‍යාපෘතිය දිවයින පුරා ගිලන්රථ 297 ක් සේවයෙහි යොදවමින් අදියර හතරක් යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. ගරු ඉන්දීය අග්‍රාමාත්‍යතුමාගේ ශ්‍රී ලංකාවේ නිල සංචාරය අතරතුර මෙම ව්‍යපෘතියේ පළමු අදියර සඳහා ඇ.ඩො. මිලියන 7.6 (රු. මිලියන 1 ,000 ) ක ප්‍රදානයන් ලබාදීමට එකඟ විය. ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ බස්නාහිර හා දකුණු පළාත් ආවරණය කරනු ලබන අතර, ඒ සඳහා ගිලන් රථ 88ක් සේවයෙහි යෙදවීමට නියමිතය. මෙම ව්‍යාපෘතියේ පළමු අදියරෙහි සාර්ථකත්වය මත ඉදිරි අදියරයන් ක්‍රියාත්මක කරනු ඇත.


## ආංශික එකඟතාවයන් 2008-2015



## 2015 වර්ෂයේ උපයෝජනයන්

2015 වර්ෂය සඳහා සමස්ත උපයෝජනය ඇ.ඩො. මිලියන 105ක් වන අතර, එයින් ඇ.ඩො. මිලියන 73ක් රජයට ලැබුණු ණය පහසුකම් තුළින් උපයෝජනය වී ඇති අතර, ඇ.ඩො. මිලියන 32ක් ප්‍රදානයන්ගෙන් උපයෝජනය වී ඇත.

**උපයෝජනයන් (ඇ.ඩො. මිලියන)**




# පකිස්තානය

පාකිස්තානය හා ශ්‍රී ලංකාව දකුණු ආසියානු කලාපයේ පිහිටි රටවල් දෙකක් වශයෙන් ශ්‍රී ලංකාව පාකිස්තානය වෙතින් ණය හා ප්‍රදාන ලෙස සංවර්ධන සහාය ලබාගෙන තිබේ. ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙනුවෙන් දුම්රිය මැදිරි මිලදී ගැනීම සඳහා 1991 වර්ෂයේ පාකිස්තානයෙන් ලැබුණු ඇ.ඩො. මිලියන 5 ක ණය මුදල ශ්‍රී ලංකාව පාකිස්තානය වෙතින් ලබාගත් ප්‍රථම ණය ආධාරයයි. තවද, 2006 වර්ෂයේ ඇ.ඩො. මිලියන 50 ක ණය මාලාවක් පාකිස්තානු රජය විසින් ලබාදී ඇත. 2014 වර්ෂයේ මන්නාරම සහ වව්නියා දිස්ත්‍රික්කවල අභ්‍යන්තර අවතැන්වූවන් සඳහා වන නිවාස වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා ඇ.ඩො. මිලියන 1 ක ප්‍රදානයක් ලබාදෙන ලදී. මීට අමතරව, 2014 වර්ෂය වනවිට සංවර්ධන ව්‍යාපෘති 6ක් වෙනුවෙන් ඇ.ඩො. 350,000 ක් පාකිස්තානු රජය විසින් ප්‍රදානයන් වශයෙන් ලබාදී තිබේ.

තව ද, පාකිස්තානු රජය විසින් ශ්‍රී ලංකා රජය වෙත ඇ.ඩො. මිලියන 200 ක ණය මුදලක් ලබාදීමට එකඟ වී ඇති අතර, මේ වනවිට මෙම ණය මුදලෙහි කොන්දේසි සම්බන්ධයෙන් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව පාකිස්තානු බලධාරීන් සමග සම්මුති සාකච්ඡා පවත්වයි.

# රුසියාව, ඕස්ට්‍රේලියාව සහ බටහිර අංශය


බටහිර අර්ධ ගෝලීය රටවලින් ශ්‍රී ලංකාව හඳුනාගත් සංවර්ධන අභිමතාර්ථ මුදුන් පමුණුවා ගැනීම උදෙසා නිල සංවර්ධන සහායයන් එක් රැස් කිරීම විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ දියුණු ආර්ථික අංශය (රුසියාව, ඕස්ට්‍රේලියාව සහ බටහිර අංශය) මඟින් සිදු කෙරේ. ශ්‍රී ලංකාවට මූල්‍ය ආධාර ලබාදෙන ප්‍රධානතම දායකයින් වන්නේ ජර්මනිය, නෙදර්ලන්තය, ස්වීඩනය, යුරෝපා සංගමය, ඇමරිකා එක්සත් ජනපදය, ප්‍රංශය, ස්පාඤ්ඤය, ඔස්ට්‍රියාව, බෙල්ජියම, රුසියාව, ඕස්ට්‍රේලියාව, එක්සත් රාජධානිය හා හංගේරියාවයි.

2010 වසරේදී ශ්‍රී ලංකාව මැදි ආදායම් ආර්ථිකයක් දක්වා ක්‍රමයෙන් වෙනස්වීමත් සමඟ බටහිර රටවලින් හා ණය නියෝජිතායතන වලින් ලැබෙන මූල්‍යයන්හි සංයුතිය හා ස්වරූපය සැලකිය යුතු පරිදි වෙනස් වී ඇත. අඩු පොලී අනුපාතිකයන් සමඟ ලැබෙන සහනදායී මූල්‍යයන්හි අඩු වීම හේතු කොටගෙන මෙකී රටවලින් හා ආයතනවලින් ලබාගන්නා සංවර්ධන සහය සහනදායී නොවන හා සහනදායී ණය පහසුකම්හි සංකලනයක් සහ අපනයන ණය දක්වා විතැන් වීමට ලක්වී ඇත.

මෙකී මූල්‍යයනයන් ප්‍රධාන වශයෙන් i) අපනයන ණය ii) වාණිජ ණය iii) සම්ප්‍රදායික ණය ආධාර iv) ප්‍රදාන ආධාර යන ස්වරූපයන්ගෙන් ලබාගන්නා ලදී. අපනයන ණය යටතේ ලැබෙන විදේශ මූල්‍යයනයන් මූලිකවම ණය ආපසු ගෙවීම ආවරණය කිරීම උදෙසා ප්‍රමාණවත් ආර්ථික ප්‍රතිලාභ හෝ ආදායම් මාර්ගයන් උත්පාදනයන් කළ හැකි වාණිජමය වශයෙන් සාධනීය ව්‍යාපෘතීන්හි ආයෝජනය කර ඇත. ඒ අනුව, බටහිර රටවලින් ලැබෙන වාණිජ ණය වලින් වැඩි ප්‍රමාණයක් මාර්ග, පාලම් හා ජල සම්පාදන වැනි කඩිනම් හා පූර්වතා සංවර්ධන ව්‍යාපෘති සහ ජනතාව සඳහා ගුණාත්මක, උසස් තාක්ෂණික හා විශ්වාසනීය සෞඛ්‍යාරක්ෂණ පහසුකම් සලසාදීමේ අරමුණින් යුතුව රෝහල් සංවර්ධනය සහ සෞඛ්‍යාරක්ෂණ පහසුකම් වැඩි දියුණු කිරීම වැනි සමාජ යටිතල පහසුකම් ව්‍යාපෘති සම්පූර්ණ කිරීම සඳහා භාවිතා කරනු ලැබ ඇත.

## එකඟතා හා උපයෝජන

**දියුණු ආර්ථිකයන්ගෙන් 2006 - 2015 කාලපරිච්ඡේදය තුළ ලැබූ මූල්‍ය එකඟතා සහ උපයෝජනයන් (ඇ.ඩො. මිලියන)**



| | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | Total |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| එකඟතා | 398 | 337 | 439 | 138 | 547 | 124 | 234 | 488 | 370 | 224 | **3,299** |
| උපයෝජන | 283 | 264 | 313 | 295 | 361 | 202 | 223 | 312 | 246 | 307 | **2,806** |

## 2015 වසරේදී සිදුකරන ලද විදේශීය මූල්‍ය එකඟතාවයන්

2015 වසරේදී දියුණු ආර්ථිකයන්ගෙන් අපනයන ණය, සහනදායී ණය සහ ප්‍රදාන ආධාර යටතේ පිරිනමන ලද පහත සඳහන් ව්‍යාපෘති වලට අදාළ මූල්‍ය පහසුකම් ඇති කිරීමට අදාළ පියවරයන් ගනු ලැබීය.

| සංවර්ධන පාර්ශ්වකරු | ව්‍යාපෘතිය | මුදල (ඇ.ඩො. මිලියන) |
|---|---|---|
| **ණය ආධාර** | | |
| ප්‍රංශ සංවර්ධන ආයතනය (AFD) | ග්‍රිඩ් උපපොළ 04 ක් හා අදාළ සම්ප්‍රේෂණ පද්ධතිය ඉදිකිරීම | 33.6 |
| | හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (ආ.ස.බැ. සම මූල්‍ය සහයෝගිතාවය) | 24.6 |
| ස්පාඤ්ඤ රජය | රාජගිරිය, ගනේමුල්ල හා පොල්ගහවෙල ගුවන් පාලම් තුනක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය (ද්විපාර්ශ්වීය කොටස) | 41.2 |
| ඒබී ස්වේන්ස්ක් අපනයන ණය ආයතනය | රත්මලාන සහ ජා-ඇල අපජල පිරිපහදු ව්‍යාපෘතිය (ස්වීඩනය) -ණය මුදල වැඩිකිරීමකි | 3.1 |
| ඕස්ට්‍රේලියාවේ, ඕස්ට්‍රේලියා සහ නවසීලන්ත බැංකුව, ඕස්ට්‍රේලියාවේ අපනයන මූල්‍ය රක්ෂණ සමාගම (EFIC) | අම්පාර ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය - අදියර III – (ණය මුදල වැඩිකිරීමකි) | 7.5 |
| බී. බී. වී. ඒ. බැංකුව - ස්පාඤ්ඤය | රාජගිරිය, ගනේමුල්ල හා පොල්ගහවෙල ගුවන් පාලම් තුනක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය (ද්විපාර්ශ්වීය කොටස) | 17.7 |
| ඕස්ට්‍රේලියාවේ අපනයන මූල්‍ය සහ රක්ෂණ සමාගම (EFIC) | තෝරාගත් රෝහල්හි සායනික අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධති පිහිටුවීමේ ව්‍යාපෘතිය (අපනයන ණය) | 13.8 |
| එච්එස්බීසී බැංකුව (ඩෙන්මාර්ක් රජයේ EKF ණය ඇපකරය යටතේ) | බඩල්ගම කිරිසැකසුම් මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම | 74.5 |
| | **උප එකතුව (ණය)** | **216.0** |
| **ප්‍රදාන ආධාර** | | |
| ජර්මනිය | විල්පත්තු ජාතික උද්‍යානය සහ ස්වාරක්ෂිත කලාප කළමනාකරණ ව්‍යාපෘතිය | 2.2 |
| | සමාජ ඒකාබද්ධතාවය සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘතිය | 4.2 |
| ඇමරිකා එක්සත් ජනපදය | සමාජ ඒකාබද්ධතාවය උදෙසාවූ සහයෝගීතාවය ශක්තිමත් කිරීම | 2.1 |
| | **උප එකතුව (ප්‍රදාන)** | **8.5** |
| | **මුළු එකඟතා** | **224.5** |

# 2015 වසරේදී ණය සම්මුති නිම කරන ලද ව්‍යාපෘතීන්

2015 වසරේදී පහත සඳහන් ප්‍රධාන ව්‍යාපෘතීන්ගෙන් ණය සම්මුති සාකච්ඡා නිම කරන ලදී.

| සංවර්ධන පාර්ශ්වකරු | ව්‍යාපෘතිය | මුදල (ඇ.ඩො. මිලියන) |
|---|---|---|
| ස්පාඤ්ඤ රජය | ආණමඩුව ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය | 32.20 |
| ඔස්ට්‍රියානු රෙයිෆෙයිසන් බැංකුව | කොච්චිකඩේ පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 9.70 |
| නෙදර්ලන්තයේ රාබෝ බැංකුව | කළුතර මහ රෝහල විශේෂිත, මාතෘ හා ළමා රෝහලක් ලෙස සංවර්ධනය කිරීම | 32.14 |
| ඔස්ට්‍රියාවේ යුනික්‍රෙඩිට් බැංකුව, | කිරම - කටුවන ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය | 11.60 |
| නෙදර්ලන්තයේ, රාබෝ බැංකුව හා ඕස්ට්‍රේලියානු අපනයන මූල්‍ය රක්ෂණ සමාගම (EFIC) | කිරිගවයින් 20,000 ක් ආනයනය කිරීමේ ව්‍යාපෘතිය | 73.90 |
| බී. බී. වී. ඒ. බැංකුව - ස්පාඤ්ඤය සහ සොසයිටේ ජනරාල් බැංකුව | අනුරාධපුර දකුණ ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය - දෙවන අදියර | 109.00 |
| ප්‍රංශ සංවර්ධන ආයතනය (AFD) | අනුරාධපුර ඒකාබද්ධ නගර සංවර්ධන ව්‍යාපෘතිය | 58.00 |
| ප්‍රංශ සංවර්ධන ආයතනය (AFD) | නාගරික සෞඛ්‍යාරක්ෂණ හා සනීපාරක්ෂණ මුලපිරීමේ ව්‍යාපෘතියේ පළමු අදියර | 85.00 |
| ප්‍රංශයේ ක්‍රෙඩිට් ඇග්‍රිකෝල් කෝපරේට් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට් බැංකුව, නැටික්ස් බැංකුව, බී. එන්. පී. පැරිබාස් බැංකුව සහ යුනි ක්‍රෙඩිට් බැංකුව | විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතිය | 139.00 |
| ප්‍රංශයේ ක්‍රෙඩිට් ඇග්‍රිකෝල් කෝපරේට් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට් බැංකුව, නැටික්ස් බැංකුව, බී. එන්. පී. පැරිබාස් බැංකුව සහ යුනි ක්‍රෙඩිට් බැංකුව | කැළණිය දකුණු ඉවුර ජල සම්පාදන ව්‍යාපෘතිය - අදියර II | 107.30 |
| | **එකතුව** | **657.84** |

# 2015 වසරේදී ක්‍රියාවට නංවමින් පැවති ප්‍රධාන ව්‍යාපෘති

## අඹතලේ ජල සම්පාදන පද්ධතිය වැඩිදියුණු කිරීමේ සහ බලශක්ති ඉතුරුම් ව්‍යාපෘතිය

කොළඹ නගරය ඉතා උසස් තත්ත්වයේ නගරයක් බවට පරිවර්තනය කිරීමේ අරමුණ පෙරදැරිව, නගරවාසීන්ට අඛණ්ඩ ජල සම්පාදන හා සනීපාරක්ෂක පහසුකම් සැලසීම පිණිස ශ්‍රී ලංකා රජය විසින් මහ කොළඹ ජල සහ අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන ක්‍රියාවට නංවමින් සිටිනු ලැබේ. මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘතීන් මාලාවක් හඳුනාගෙන ඇති අතර, අවශ්‍ය මූල්‍යමය සහයෝගීතාවය ආසියානු සංවර්ධන බැංකුව (ADB) සහ ප්‍රංශ සංවර්ධන ආයතනය (AFD) වෙතින් අපේක්ෂා කරන ලදී. ඉහත වැඩසටහනෙහි ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යයනය කරනු ලැබීමට එකඟවන ලද සංරචකයන්ට

අමතරව අඹතලේ ජල සම්පාදන පද්ධති වැඩිදියුණු කිරීමේ සහ බලශක්ති ඉතුරුම් ව්‍යාපෘතිය සඳහා එහි ඇස්තමේන්තුගත පිරිවැය වන ඇ.ඩො. මිලියන 70 ක මුදල, ප්‍රංශ සංවර්ධන ආයතනය විසින් ලබාදෙනු ඇත.

අඹතලේ ජල පිරිපහදු පද්ධතිය සම්පූර්ණයෙන්ම අළුත්වැඩියා කිරීම, ගොතටුව ප්‍රදේශයෙහි ඝන මීටර 15,000 ක ධාරිතාවයක් සහිත භූගත ජලාශයක් ඉදිකිරීම සහ කි.මී. 14.2 ක දිගින් යුතු නව ජල සම්පාදන මාර්ගයක් ස්ථාපිත කිරීමද, මෙම ව්‍යාපෘතිය යටතේ සැලසුම් කොට ඇත. 2040 වසර වන විට ජල අවශ්‍යතාවය වෙනුවෙන් වන ඉල්ලුම සම්පූර්ණ කිරීමට හැකි වන පරිදි අඹතලේ ප්‍රධාන ජල පිරිපහදුවේ වසර 30 ක් පමණ පැරණි සහ අකාර්යක්ෂම ජල පොම්ප සහ වෙනත් යල්පැනගිය යටිතල පහසුකම් මේ යටතේ සම්පූර්ණයෙන්ම නවීකරණය කරනු ලබනු ඇත. එසේම නල පද්ධතිය නවීකරණය කිරීම අඹතලේ ජල පොම්පගාරයෙහි කාර්යක්ෂමතාවය වාර්ෂිකව සියයට 4 - 6 අතර ප්‍රමාණයකින් ඉහළ යාමටද හේතු වනු ඇත. ජල සම්පාදන පද්ධතියෙහි සුමට ක්‍රියාකාරීත්වය වෙනුවෙන් ස්ථාපනය කරනු ලබන, පද්ධතිය නිරීක්ෂණය හා පාලනය කරනු ලබන, පරිගණකය මඟින් පාලනය කරනු ලබන ස්වයංක්‍රීය පද්ධතිය (SCADA) මෙහිදී ඉතා වැදගත් වනු ඇත.

## බඩල්ගම කිරිසැකසුම් මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම

කිරි නිෂ්පාදන සැකසීම වැඩි දියුණු කිරීම හරහා ධනාත්මක සමාජ ආර්ථික ප්‍රතිලාභයන් ව්‍යුත්පන්න කරගැනීම අපේක්ෂා කරන අතර, කිරි නිෂ්පාදිතයන්ගෙන් ස්වයංපෝෂිත වීම සඳහා එය රටට උපකාරී වේ. කෙසේ වුවද මෙරට කිරි සැකසීම් අංශයන්හි පවත්නා නවීන තාක්ෂණයන්හි ඌනතාවයන් නිසා ශ්‍රී ලංකාවේ කිරි කර්මාන්තයෙහි දියුණුවට බාධාවන් පවතී.

මිල්කෝ (පෞද්ගලික) සමාගම සතුව දැනට පවතින කිරි සැකසුම් කර්මාන්තශාලාව, අතිශයින් ජනාකීර්ණ වූ නාරාහේන්පිට ප්‍රදේශයේ සිට ගම්පහ දිස්ත්‍රික්කයේ බඩල්ගම ප්‍රදේශයෙහි යලි ස්ථානගත කිරීම තුළින් දිනකට කිරි ලීටර් 200,000 ක් සැකසීම සහ ගුණත්වයෙන් යුත් කිරි හා කිරි නිෂ්පාදිතයන් දේශීය වෙළඳපොළට ඉදිරිපත් කිරීම තහවුරු කෙරේ. ඇ.ඩො. මිලියන 74.5 ක් වන මෙම ව්‍යාපෘතියෙහි පිරිවැය සීමාසහිත හොංකොං සහ ෂැංහයි බැංකු සමාගම විසින් සපයනු ලබන අපනයන ණය පහසුකමක් මඟින් ආවරණය කෙරේ.

පාස්චරිත කිරි, යෝගට්, අයිස් ක්‍රීම්, චීස් යනාදිය නිෂ්පාදනය කිරීම සඳහා යටිතල පහසුකම් සහ අනෙකුත් අවශ්‍ය පහසුකම් වලින් යුත් කිරි සැකසීමේ යන්ත්‍රාගාරයක් බඩල්ගම නව කර්මාන්තශාලාව තුළ ස්ථාපිත කිරීමද, මෙම ව්‍යාපෘතිය යටතේ අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතිය ස්ථාපිත කිරීමත් සමඟ වාර්ෂික කිරි නිෂ්පාදනය ඉහළ නංවා ගැනීමට අපේක්ෂා කරන අතර, විදේශ විනිමය ඉතිරි කර ගැනීමටද හැකියාව ලැබේ. යෝජිත ව්‍යාපෘතිය මඟින් රටෙහි ග්‍රාමීය දුප්පත්කම සහ මන්දපෝෂණය අඩු කිරීම සඳහා විශාල දායකත්වයක් ලබාදෙනු ඇත.

## උතුරු පළාතේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියේ ප්‍රාරම්භක අදියර, උතුරු පළාතේ තාක්ෂණික හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක වර්ධනය ඇති කිරීමේ අරමුණ පෙරදැරිව 2012 සිට 2015 ක්‍රියාත්මක කරන ලදි. මෙම ව්‍යාපෘතිය යටතේ ඇ.ඩො. මිලියන 4.4 ක ජර්මානු රජය විසින් පිරිනමන ලද ප්‍රදාන ආධාර සහ ජර්මනියේ KFW බැංකුවෙන් සපයන ලද ඇ.ඩො. මිලියන 3.3 ක ප්‍රදාන ආධාර මත ගොඩනැගිලි, උපකරණ, යන්ත්‍ර සූත්‍ර, පුහුණු ද්‍රව්‍ය යනාදියෙන් සමන්විත අංග සම්පූර්ණ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් කිලිනොච්චියෙහි ස්ථාපිත කරන ලදි.

ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද පුහුණු මධ්‍යස්ථානය මඟින් ශිෂ්‍යයින් 400 කට පමණ පුහුණුව ලැබීමේ හැකියාව ඇති අතර, එමඟින් ලෝහ තාක්ෂණය, ඉලෙක්ට්‍රොනික විද්‍යාව, රථවාහන අංශය, තොරතුරු තාක්ෂණය, කෘෂිකර්මය සහ ආහාර සුරක්ෂිතතාවය යන ක්ෂේත්‍රයන්හි කෙටිකාලීන හා දිගුකාලීන පුහුණු වැඩසටහන් යටතේ පුහුණුවීම් අවස්ථා උදා කර දී ඇත.

මෙම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය සඳහා උප - මධ්‍යස්ථාන 08 ක් උතුරු පළාත තුළ ස්ථාපනය කිරීම උදෙසා යුරෝ මිලියන 4.84 ක අතිරේක ප්‍රදානයක් ජර්මනියේ KFW බැංකුව මඟින් වර්ෂ 2014 ලබාදීම තුළින් ජර්මානු රජය විසින් ව්‍යාපෘතිය සඳහා වූ සිය මූල්‍ය සහයෝගය ඉහළ නංවා ඇත. මුලතිවු, යාපනය, කිලිනොච්චිය, වව්නියාව සහ මන්නාරම යන දිස්ත්‍රික්කයන්හි ස්ථාපිත කොට ඇති මෙම උප - මධ්‍යස්ථාන 08 මඟින් වැඩි පිරිසකට පුහුණු අවස්ථාව සලසා දී ඇති අතර, එමඟින් වර්තමාන ජාතික වෘත්තීය සුදුසුකම් සහතික (NVQ – 04, 05 සහ 06) පුහුණු පාඨමාලා හැදෑරීම සඳහා වූ ප්‍රවේශ අවස්ථා පහසුකර ඇත.

තවදුරටත් ජර්මානු රජය විසින් 2015 වසරේදී මෙම ව්‍යාපෘති යටතේ පවතින පර්යේෂණාගාර වල සහ උප මධ්‍යස්ථාන වල සම්පත් වැඩි දියුණු කිරීමේ අරමුණ පෙරදැරිව ඇ.ඩො. මිලියන 4.4 ක අතිරේක ප්‍රදාන ආධාර සම්පාදනය කරන ලදි.

# එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන, ශිල්පීය ආධාර සහ රාජ්‍ය නොවන සංවිධාන අංශය

# එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන

1952 වසරේ සිට ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP), ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO), එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF), ලෝක ආහාර වැඩසටහන (WFP), එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල (UNFPA), සරණාගතයින් සඳහා වන එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය (UNHCR), ලෝක සෞඛ්‍යය සංවිධානය (WHO), එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහන (UN-HABITAT), අන්තර්ජාතික කම්කරු සංවිධානය (ILO) සහ කෘෂිකර්ම සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල (IFAD) වැනි එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන වෙතින් ප්‍රධාන වශයෙන් ධීවර, පරිසර, සෞඛ්‍යය, අධ්‍යාපන, ජීවනෝපාය සංවර්ධනය, ආපදා සහන වැනි ක්ෂේත්‍රයන්හි විවිධ ව්‍යාපෘතීන් හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සැලකිය යුතු ප්‍රමාණයක මූල්‍ය හා තාක්ෂණික ආධාර ලබා ගනී. ජාතික ප්‍රමුඛතාවන්ට අනුකූලව ශ්‍රී ලංකා රජය සහ එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන විසින් ඒකාබද්ධව එකඟවූ එක්සත් ජාතීන්ගේ සංවර්ධන සහයෝගීතා රාමුව (UNDAF) මත පදනම්ව එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන විසින් මෙම ආධාර ලබා දේ. වර්තමාන සහයෝගීතා රාමුව යටතේ එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන 2013 වසරේ සිට වසර 05ක කාලයක් සඳහා ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 405ක් පමණ ලබා දීමට එකඟ වී ඇත. එක්සත් ජාතීන්ගේ ආධාර ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවට ලැබෙන්නේ ප්‍රදාන ලෙස වන නමුත් කෘෂිකර්ම සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල මඟින් ප්‍රදාන වශයෙන් මෙන්ම සහනදායි ණය ලෙසද තම සහයෝගය ලබා දේ.


## එකඟතා

2015 වසරේදී ශ්‍රී ලංකා රජය සහ එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන විසින් පහත සඳහන් ප්‍රධාන ව්‍යාපෘතීන් සඳහා අත්සන් තබා ඇත.

| ආයතනය | ව්‍යාපෘතිය | ඇ.ඩො. මිලියන |
|---|---|---|
| FAO | කෘෂි ආර්ථික ව්‍යාපෘතිය | 2.41 |
| WFP | දිගු කාලීන සහන සහ ප්‍රතිෂ්ඨාපන වැඩසටහන | 29.34 |
| UNDP | ජෛව විවිධත්ව සංරක්ෂණය හා පාරිසරික අධි සංවේදී ප්‍රදේශ තුළ පරිසර පද්ධති සේවා පෝෂණය ඉහළ නැංවීම. | 9.13 |
| | බලශක්ති උත්පාදනයෙහි සහ ශ්‍රී ලංකා දත්ත ව්‍යාපෘතියෙහි අවසන් පරිශීලක අංශයෙහි උචිත සීමා කිරීම් | 2.04 |
| | ශ්‍රී ලංකාවේ කඩිනම් සංවර්ධිත ක්‍රියාවලිය තුළ ගෝලීය පරිසර අවශ්‍යතා සහ මනා ප්‍රමාණගත කිරීම පිළිබඳ සහතික කිරීම | 0.96 |

මීට අමතරව එක්සත් ජාතීන්ගේ සංවර්ධන සහයෝගීතා රාමුවට අනුකූලව 2013 වසරේදී ශ්‍රී ලංකා රජය හා අදාළ ආයතන විසින් 2013-2017 කාලපරිච්ඡේදයට අදාළව අත්සන් කරන ලද දේශීය වැඩසටහන් යටතේ 2015 වර්ෂය සඳහා එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල සහ එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල විසින් වාර්ෂික වැඩ සැලසුම් අත්සන් කරන ලදී.


**2016 - 2017 වර්ෂයන් සඳහා එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල විසින් මූල්‍යයනය කරන ලද වැඩසටහන්වල ආංශික ව්‍යාප්තිය**




## උපයෝජනයන්

පහත ප්‍රස්තාරයේ පෙන්නුම් කෙරෙන ආකාරයට නියෝජිතායතනයන්ගේ මුළු උපයෝජනයන්ගේ විශාලතම කොටස වැව්ලි ක්ෂේත්‍රය, අධ්‍යාපනය, සෞඛ්‍යය, ජලය සහ ළමා ආරක්ෂාව වැනි අංශයන්හි ව්‍යාපෘති සහ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද කෘෂිකර්ම සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල සහ එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල වෙතින් වාර්තා වී ඇත.

**2015 වසරේ උපයෝජන ප්‍රතිශතය**




## 2015 වසරේ අවසන් කරන ලද ප්‍රධාන ව්‍යාපෘති

කෘෂිකර්මය, ධාරිතා සංවර්ධනය හා මානුෂීය ආධාර යන ක්ෂේත්‍රයන්හි එක්සත් ජාතීන්ගේ නියෝජිතායතනයන්ගේ ආධාර මත ක්‍රියාත්මක වූ පහත සඳහන් ප්‍රධාන ව්‍යාපෘතීන් 2015 වසරේදී සම්පූර්ණ කරන ලදී.

| ආයතනය | ව්‍යාපෘතිය | ඇ.ඩො. මිලියන |
|---|---|---|
| WFP | දිගුකාලීන සහන සහ ප්‍රතිෂ්ඨාපන වැඩසටහන | 29.34 |
| FAO | ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ පළිබෝධ නාශක භාවිතය සම්බන්ධ අවදානම කළමනාකරණය කිරීම | 0.27 |
| UNDP | ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ උපායශීලි ස්ථානගත කිරීම | 0.22 |

## 2016 වසරේදී ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘතීන් / වැඩසටහන්

### රජයේ ක්‍රියාකාරී වැඩ සැලැස්මට ලෝක ආහාර සංවිධානයේ ආධාර

2016 - 2017 රජයේ ක්‍රියාකාරී වැඩ සැලැස්මට අනුගතව ශ්‍රී ලංකාවට ආහාර අධාර ලබාදීමේ වැඩපිළිවෙල තවදුරටත් දීර්ඝ කිරීමට එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර වැඩසටහන එකඟතාවය පළකර ඇත. ආහාර හා පෝෂණ සුරක්ෂිතතාව වැඩිදියුණු කිරීම සහ දේශගුණික කම්පන හේතුවෙන් අනාරක්ෂිත තත්ත්වයට පත්වන ජනතාව කඩිනමින් යළි ප්‍රකෘති තත්ත්වයට පත්කිරීම රජයේ දෙවසරක ක්‍රියාකාරී වැඩ සැලැස්මේ මූලික ඉලක්ක වේ. මේ සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය ඇ.ඩො. 19,705,165කි.

ඒ අනුව, වයස අවුරුදු 5ට අඩු ළමුන් සඳහා දිවා ආහාරය ලබාදීම, ගර්භනී හා කිරිදෙන මව්වරුන්ට පෝෂණ ආධාර ලබාදීම, අපදාවන්ට ලක්වූවන් යථා තත්ත්වයට පත්කිරීම වැනි මූලික ක්ෂේත්‍ර යටතේ සැකසුන 2016 - 2017 රජයේ ක්‍රියාකාරී වැඩ සැලැස්මට ලෝක ආහාර සංවිධානයේ ආධාර ශ්‍රී ලංකාවට හිමිවෙනු ඇත.

ජනාධිපති ලේකම් කාර්යාලය, සෞඛ්‍යය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය, උතුරු පළාත් සභාව සහ දිවයිනේ අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරෙනු ඇත.

### සුළු පරිමාණ තේ හා රබර් වගාහිමියන්ගේ පුනර්ජීවන වැඩසටහන ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදලෙන් මූල්‍ය සහය ලබා ගැනීම

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කිරීමට නියමිත කුඩා පරිමාණ තේ හා රබර් වගාහිමියන්ගේ පුනර්ජීවන වැඩසටහන මූල්‍යයනයට කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික අරමුදල සහාය පළ කර ඇත.

මෙම වැඩසටහනෙහි ප්‍රධාන අරමුණ වන්නේ තිරසාර හා ලාභදායී වූ ගොවි ව්‍යවසායන් ගොඩ නැඟීම තුළින් සුළු පරිමාණ තේ හා රබර් වගාහිමියන්ගේ ආදායම වැඩිකිරීම හා කෘෂි වගා කර්මාන්තය තුළ ඔවුන්ගේ ස්ථාවරත්වය තහවුරු කරගැනීම සඳහා එම වගාකරුවන්ට සහාය වීමයි. එමෙන්ම මෙම ව්‍යාපෘතිය මඟින්, ජාතික තේ හා රබර් නිෂ්පාදනය වැඩි කරනු ඇති අතර, තෝරාගත් දිස්ත්‍රික්කවල එලදායිතා හා වෙළඳපළ සම්බන්ධ ගැටළු නිරාකරණය කිරීමට ද දායක වනු ඇත. උක්ත වැඩසටහනෙහි ප්‍රධාන සංරචකයන් තුනකි. ඒවා නම්, අ.) සුළු පරිමාණ තේ වගාහිමියන්ගේ සංවර්ධනය ආ.) සුළු පරිමාණ රබර් වගාහිමියන්ගේ සංවර්ධනය ඇ.) ග්‍රාමීය මූල්‍ය පහසුකම් සැපයීම.

මෙම වැඩසටහන සඳහා මුළු ආයෝජනය ඇ.ඩො. මිලියන 65.401 වන අතර ඉන් ඇ.ඩො. මිලියන 25.764 ක් කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල (IFAD) විසින් සපයනු ලැබේ. ව්‍යාපෘති කාලය අවුරුදු 6ක් වනු ඇති අතර පවුල් 32,000කට පමණ ඉන් ප්‍රතිලාභ සැලසීමට අපේක්ෂිතය (පුද්ගලයන් 144,000ක් පමණ).

ඒ අනුව ශ්‍රී ලංකා රජය හා කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල අතර ණය ගිවිසුම් සාකච්ඡා කිරීම 2015 නොවැම්බර් මස 26 වන දින කොළඹ දී පැවැත්විණි.

# ශිල්පීය ආධාර

රාජ්‍ය සේවයෙහි ධාරිතාවය ඉහළ නැංවීම හා මානව සම්පත් සංවර්ධනය උදෙසා එම අවශ්‍යතාවයන්ට ගැළපෙන පුහුණු වැඩසටහන් අත්කර ගැනීමට චීනය, ජපානය, කොරියාව, ඉන්දියාව, සිංගප්පූරුව, තායිලන්තය, මැලේසියාව, ඉන්දුනීසියාව වැනි ද්විපාර්ශ්වික සංවර්ධන පාර්ශ්වකරුවන් සහ කොළඹ ක්‍රමය, ආසියානු සංවර්ධන බැංකුව හා පොදු රාජ්‍ය මණ්ඩල මහලේකම් කාර්යාලය වැනි බහුපාර්ශ්වීය සංවර්ධන පාර්ශ්වකරුවන් සමඟ කාලීන සාකච්ඡා පැවැත්වීම තුළින් විදේශ පුහුණු අවස්ථා සේවයෙහි යෙදවීම විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත කේන්ද්‍රගතව ඇත.


වසරකට ශ්‍රී ලංකාව වෙත 15කට වැඩි සංවර්ධන පාර්ශ්වකරුවන් වෙතින් 600ක පමණ දිගු කාලීන (මාස 08කට වැඩි) හා කෙටි කාලීන විදේශ පුහුණු අවස්ථා ලැබේ. ඒ අනුව 2015 වර්ෂය තුළ විදේශ පුහුණු අවස්ථා 1,243 ක් ලැබී ඇති අතර, ඉන් 69ක් දිගු කාලීන පුහුණු අවස්ථාවන් වන අතර, ඉතිරිය කෙටි කාලීන පුහුණු අවස්ථා වේ. 2015 ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දක්වා ශ්‍රී ලංකා රජය වෙත ලැබුණු පුහුණු අවස්ථා ගණන පහත වගුවෙන් දැක්වේ.

**සංවර්ධන පාර්ශ්වකරුවන් විසින් 2015 වසර සඳහා ප්‍රදානය කල විදේශ පුහුණු අවස්ථා**

| සංවර්ධන පාර්ශ්වකරු | කෙටි කාලීන | දිගු කාලීන |
|---|---|---|
| ආසියානු සංවර්ධන බැංකුව (ADB) | 85 | |
| කොළඹ ක්‍රමය | 7 | |
| තාක්ෂණික සහයෝගීතාවය සඳහා පොදු රාජ්‍ය මණ්ඩල අරමුදල (CFTC) | 4 | |
| ඕස්ට්‍රේලියානු රජය | | 35 |
| චීන රජය | 699 | 2 |
| මැලේසියානු රජය | 18 | |
| සිංගප්පූරු රජය | 42 | |
| තායිලන්ත රජය | 19 | 2 |
| කොරියානු රජය | 104 | 13 |
| ඉන්දියානු රජය | 43 | |
| ජපාන රජය | 149 | 17 |
| සාක් මහ ලේකම් කාර්යාලය | 4 | |
| **එකතුව** | **1,174** | **69** |

පසුගිය වසර කිහිපය තුළ පුහුණු අවස්ථාවන් තුළ අනපේක්ෂිත හා පෙර නොදුටුවිරූ වර්ධනයක් දක්නට ලැබුණි. උදාහරණ ලෙස 2015 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් අවසානය දක්වා නිලධාරීන් 701 දෙනෙකු චීන විදේශ පුහුණු අවස්ථාවන් සඳහා තේරී ඇති අතර උපරිම වශයෙන් 8 දෙනෙකු එක් වැඩසටහනක් සඳහා තේරී පත්විය. මෙය 2015 වසරේ ශ්‍රී ලංකාව ලැබූ මුළු විදේශ පුහුණු අවස්ථාවන්ගෙන් සියයට 56ක ප්‍රතිශතයක් පෙන්නුම් කරයි. චීන රජය විසින් මෙම වැඩසටහන් සඳහා නිර්දේශ වූවන් සියල්ලන්ම වැඩසටහන් වලට තෝරා ගැනීමට උපරිම උත්සාහ දරා ඇත. ඕස්ට්‍රේලියානු සංවර්ධන ශිෂ්‍යත්වද 2015 වසර සඳහා සෞඛ්‍යය, අධ්‍යාපනය හා තිරසාර ආර්ථික සංවර්ධනය යන අංශ සඳහා වන ඇතුලත්වීම වැඩිකර ඇති අතර අවසාන සම්මුඛ පරීක්ෂණයෙන් මෙම වැඩසටහන සඳහා නිලධාරීන් 35 දෙනෙකු තේරී පත්ව ඇත.

**2014 සහ 2015 වර්ෂයන්හිදී ලද කෙටිකාලීන පුහුණු අවස්ථා සංසන්දනය**




කොරියානු රජය විසින්, කොරියානු ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය හරහා කෙටි කාලීන පුහුණු අවස්ථා 104ක් සහ දිගු කාලීන පුහුණු අවස්ථා 13 ක් ලබා දී ඇත.

ශ්‍රී ලංකාව වෙත සංවර්ධන පාර්ශ්වකරුවන් විසින් ලබාදුන් සමස්ත පුහුණු අවස්ථාවන්ගෙන් සියයට 09ක ප්‍රතිශතයක් මින් පෙන්නුම් කරයි. ජපාන රජය විසින්ද කෙටි හා දිගු කාලීන පුහුණු අවස්ථා ඇතුලත්ව සමස්ත පුහුණු අවස්ථා 166ක් ලබා දී ඇති අතර එය සමස්ත පුහුණු අවස්ථාවන්ගේ සියයට 13ක ප්‍රතිශතයක් පෙන්නුම් කරයි. එසේම ඉන්දියානු හා සිංගප්පූරු රජයන් විසින් සහ ආසියානු සංවර්ධන බැංකුව විසින් ද සැලකිය යුතු ප්‍රමාණයක පුහුණු අවස්ථාවන් 2015 වර්ෂය තුළදී ලබා දී ඇත.

ශ්‍රී ලංකා රජය විසින් ලබා ගෙන ඇති දිගු කාලීන පුහුණු අවස්ථාවන් පිළිබඳව සැලකීමේදී පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහ ආචාර්ය උපාධි අවස්ථාවන් වැඩි වශයෙන් ප්‍රදානය කර ඇත්තේ කණිෂ්ඨ සහ මැදි මට්ටමේ නිලධාරීන් හට ඔවුන්ගේ අනාගත වෘත්තීමය සංවර්ධනය සඳහා අවශ්‍ය අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් වර්ධනය කර ගැනීමටය. එසේම මැදි හා ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය නිලධාරීන්ගේ පවතින දැනුම හා හැකියාවන් වර්ධනය කර ගැනීම සඳහා කෙටි කාලීන පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ, සමුළු සහ වැඩමුළු ප්‍රදානය කර ඇත. මෙම පුහුණු වැඩසටහන් පවත්වනු ලබන්නේ ලෝකයේ ප්‍රමුඛතම ආයතන හා විශ්වවිද්‍යාලයන්හිදීය. මෙම පුහුණු වැඩසටහන් ප්‍රධාන වශයෙන්ම යොමුවී ඇති අංශ වන්නේ කෘෂිකර්මය, පශු සම්පත්, මත්ස්‍ය හා වාරිමාර්ග, මහාමාර්ග සහ ප්‍රවාහනය, සෞඛ්‍යය, ව්‍යාපාර සංවර්ධනය, පරිසරය අධ්‍යාපනය, රාජ්‍ය පරිපාලනය, පාලනය සහ සංවර්ධනය හා රාජ්‍ය ප්‍රතිපත්ති වේ. තනි පුද්ගල පුහුණු වැඩසටහන් වලට අමතරව කණ්ඩායම් පුහුණු වැඩසටහන් හා වැඩමුළු සංවර්ධන පාර්ශ්වකරුවන් විසින් ලබා දී ඇත.

# ස්වේච්ඡා සේවය

පුහුණු වැඩසටහන් වලට අමතරව, ශිල්පීය ආධාර අංශය මඟින් විශේෂඥයන් හා ස්වේච්ඡා සේවකයන්ගේ වැඩසටහන් සංවර්ධන පාර්ශ්වකරුවන් හා රේඛීය අමාත්‍යාංශ සමඟ සම්බන්ධීකරණය කරනු ලබයි. රේඛීය අමාත්‍යාංශ මඟින් කරන ඉල්ලීම් මත පදනම්ව සුදුසු විශේෂඥයන්, ස්වේච්ඡා සේවකයන් හඳුනාගන්නා අතර ඔවුන් බඳවා ගැනීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. 2015 වසර තුළ ශ්‍රී ලංකා රජය වෙත සෞඛ්‍යය, සමාජ හා ප්‍රජා සංවර්ධන, ක්‍රීඩා, අධ්‍යාපන, භාෂාව, රෙදිපිළි, තොරතුරු තාක්ෂණ වැනි අංශ සඳහා කොරියාව, ජපානය හා ඕස්ට්‍රේලියාව යන රට වලින් ස්වේච්ඡා සේවකයන් පිළිවෙලින් 51, 40, හා 01 ලැබී ඇත.

# විශේෂ අවස්ථා

### ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ කේන්ද්‍රස්ථානයේ ප්‍රථම සමුළුව නොවැ. 26 - 27, 2015 (හිල්ටන් හෝටලය, කොළඹ)

කොළඹ ක්‍රමය මහලේකම් කාර්යාලය වනාහී 1951 සිට රටවල් 7 ක සාමාජිකත්වයක් සහිතව ශ්‍රී ලංකාව තුළ පිහිටුවා ඇති එකම ජාත්‍යන්තර සංවිධානය වන අතර එය උපදේශක කමිටුව සහ සභාව සඳහා ලේකම් කාර්යාලය වශයෙන් ක්‍රියාත්මක වේ.

ස්ත්‍රී පුරුෂ භාවය පදනම් වූ වැඩසටහන් කොළඹ ක්‍රමය තුළ වූ ප්‍රධාන වැඩසටහනක් වන බැවින්, ඔවුන් විසින් ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ වූ කේන්ද්‍රස්ථානයක් වර්තමානයේ ස්ථාපිත කර ඇති අතර, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, විදේශ කටයුතු අමාත්‍යාංශය සහ කාන්තා කටයුතු අමාත්‍යාංශය මෙම කේන්ද්‍රස්ථානයේ සාමාජිකයන් ලෙස නම් කර ඇත.

ඒ අනුව කොළඹ ක්‍රමයෙහි සාමාජික රටවල් 27කගේ සහභාගීත්වයෙන් ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ කේන්ද්‍රස්ථානයේ ප්‍රථම සමුළුව නොවැම්බර් 26, 27 දිනයන්හිදී කොළඹ හිල්ටන් හෝටලයේදී පැවැත්විණි. කොළඹ ක්‍රමයෙහි වැඩසටහන් සඳහා කේන්ද්‍රස්ථානය මෙන්ම ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ වූ කේන්ද්‍රස්ථානයෙහි සාමාජිකයෙක් වන විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් මෙම සමුළුවෙහි සමාරම්භක රාත්‍රී භෝජන සංග්‍රහය සඳහා සත්කාරකත්වය දැරීය.

# ණය කළමනාකරණ අංශය

## ණය කළමනාකරණ අංශයේ කාර්යභාර්ය

- පොදු රාජ්‍ය මණ්ඩලීය ණය වාර්තා කිරීමේ හා කළමනාකරණ පද්ධතිය (CS-DRMS) තුළ නව එකඟතාවයන්හි දත්ත සටහන් කිරීම, අවලංගු කිරීමේ සහ ණය/ ප්‍රදාන එකඟතාවයන්හි ගැනීම් කාල සීමාවන්ගේ වර්ධනය පිළිබඳ උප ඇමුණුම්වල දත්ත සටහන් කිරීම

- පොදු රාජ්‍ය මණ්ඩලීය ණය වාර්තා කිරීමේ හා කළමනාකරණ පද්ධතිය (CS-DRMS) අනුව ගෙවීම සඳහා පුරෝකතන අගයන් ණය ලබාදෙන නියෝජිතායතන අගයන් සමඟ සංසන්දනය කිරීම සහ ශ්‍රී ලංකා මහ බැංකුවට මුදල් ගෙවීම් පිළිබඳව උපදේශ ඉදිරිපත් කිරීම.

- ණය එකඟතාවයන්ට අනුව පොදු රාජ්‍ය මණ්ඩලීය ණය වාර්තා කිරීමේ හා කළමනාකරණ පද්ධතිය (CS-DRMS) මඟින් ගෙවීම් සඳහා පුරෝකතනය කරන ලද අගයන් ණය ලබාදෙන නියෝජිතායතනයන්හි එම අගයන් සමඟ සංසන්දනය කිරීමේදී වෙනසක් සිදුවේ නම් ඒ පිළිබඳ අදාළ අංශය මඟින් තහවුරු කරගැනීමට කටයුතු කිරීම.

- ප්‍රතිලබ්ධීන්, ණය වාරික ගෙවීම්, ණය නැවත ගෙවීම් සහ වෙනත් ගෙවීම් පොදු රාජ්‍ය මණ්ඩලීය ණය වාර්තා කිරීමේ හා කළමනාකරණ පද්ධතියට (CS-DRMS) ඇතුලත් කිරීම.

- නව ණය එකඟතාවයන්හි අදාළ එකඟතා සහ කොන්දේසීන්ගේ සාරාංශයක් සහ අදාළ එකඟතා ගිවිසුම්වල පිටපත් ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික විශ්ලේෂණ දෙපාර්තමේන්තුවට භාරදීම.

- ණය සංඛ්‍යානයන් භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව සහ අදාළ නියෝජිතායතන වෙත නිකුත් කිරීම සහ පොදු රාජ්‍ය මණ්ඩලීය ණය සටහන් කිරීමේ හා කළමනාකරණ පද්ධතිය (CS-DRMS) මඟින් ලබාගන්නා 814 වාර්තාව විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පළකිරීම.

- විදේශ අධාර විමසුම, කාර්යසාධන වාර්තාව, අයවැයට අදාළ දෙපාර්තමේන්තු ප්‍රකාශය සහ වෙනත් ප්‍රකාශන සඳහා අවශ්‍ය පිළියෙල කිරීම් හා සම්බන්ධීකරණය කිරීම.

- විදේශ ණය ප්‍රදානයන්ට අදාළ විශ්ලේෂණ වාර්තා නියමිත කාලයන්හි අදාළ අංශ වෙත ලබාදීම.

- පාර්ලිමේන්තුව මඟින් ණය සම්බන්ධව අසන ප්‍රශ්න සඳහා රජය වෙනුවෙන් විදේශ ණය සම්බන්ධ පිළිතුරු සැපයීම.

- පොදු රාජ්‍ය මණ්ඩලය විසින් නිර්මාණය කරන ලද "Horizon" නම් ණය කළමනාකරණ හා විශ්ලේෂණ පද්ධතියේ ශ්‍රී ලංකා මහ බැංකුව වෙනුවෙන් විදේශ ණය ඇතුළත් කිරීම.

- විදේශ ණය සම්බන්ධ පැන නගින ගැටළු සඳහා මනා සම්බන්ධීකරණයක් ඇති කර ගැනීමට එම නියෝජිතායතන සහ දෙපාර්තමේන්තුවේ අදාළ අංශ සමඟ නිරන්තරයෙන් කටයුතු කිරීම.

- විදේශ මූල්‍යයනය සහ ණය සම්බන්ධයෙන් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, මුදල් අමාත්‍යාංශ ලේකම් වෙතින් විවිධ ආයතන මඟින් සිදු කරනු ලබන ඉල්ලීම් සඳහා කටයුතු සිදු කිරීම.

- රටේ ණය කළමනාකරණ ධාරිතාව වැඩිදියුණු කර ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සහ පොදු රාජ්‍ය මණ්ඩලීය කණ්ඩායම සමඟ නිරන්තර ක්‍රියාදාමයන්හි නිරත වීම.

- ලෝක බැංකුව, අන්තර්ජාතික මූල්‍ය අරමුදල මඟින් විදේශ ණය සංඛ්‍යානයන්ට අදාළ දත්ත කාර්තුමය වශයෙන් ඉදිරිපත් කිරීම සහ ප්‍රකාශ කිරීම.

## 2015 වසරේ කාර්යසාධනය

- 2015 වසරේ සිදු වූ නව එකඟතාවයන්ට අදාළ උප ඇමුණුම් පොදු රාජ්‍ය මණ්ඩලීය ණය සටහන් කිරීමේ හා කළමනාකරණ පද්ධතියට (CS-DRMS) ඇතුළත් කිරීම.

- 2015 වසර තුළ ණය ගිවිසුම් අනුව නියමිතව තිබූ නැවත ගෙවීම් වාරික ඇතුළු අනෙකුත් ගෙවීම් සිදු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත උපදේශ ඉදිරිපත් කෙරිණි.

- පොදු රාජ්‍ය මණ්ඩලීය ණය සටහන් කිරීමේ හා කළමනාකරණ පද්ධතිය (CS-DRMS) මඟින් ගෙවීම් සඳහා පුරෝකතනය කරන ලද අගයන් ණය ලබාදෙන නියෝජිතායතනයන්හි එම අගයන් සමඟ සංසන්දනය කිරීමේදී වෙනසක් සිදුවූ අවස්ථාවන්හි ණය එකඟතාවයන්ට අනුව ඒ පිළිබඳ අදාළ අංශය මඟින් තහවුරු කරගැනීමට කටයුතු කිරීම.

- 2015 වසරේ සිදුවූ ප්‍රතිලබ්ධීන්, ණය වාරික ගෙවීම්, ණය නැවත ගෙවීම් සහ වෙනත් ගෙවීම් පොදු රාජ්‍ය මණ්ඩලීය ණය සටහන් කිරීමේ හා කළමනාකරණ පද්ධතිය (CS-DRMS) ඇතුළත් කිරීම.

- 2015 වසරේ සිදු වූ නව එකඟතාවයන්හි අදාළ එකඟතා සහ කොන්දේසි සකස්කොට පළ කිරීම.

- 2015 වසර සඳහා ණය සංඛ්‍යානයන් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සහ අදාළ නියෝජිතායතන වෙත නිකුත් කිරීම සහ පොදු රාජ්‍ය මණ්ඩලීය ණය සටහන් කිරීමේ හා කළමනාකරණ පද්ධතිය (CS-DRMS) මඟින් ලබාගන්නා 814 වාර්තාව විදේශ සම්පත් දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කිරීම.

- 2014 වසර සඳහා විදේශ ආධාර විමසුම, කාර්යසාධන වාර්තාව, අයවැයට අදාළ දෙපාර්තමේන්තු ප්‍රකාශය සහ වෙනත් ප්‍රකාශන සඳහා අවශ්‍ය පිළියෙල කිරීම හා සම්බන්ධීකරණය කිරීම.

- විදේශ මූල්‍යයනය සහ ණය සම්බන්ධයෙන් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, මුදල් අමාත්‍යාංශ ලේකම් වෙතින් විවිධ ආයතන මඟින් සිදු කරනු ලබන ඉල්ලීම් සඳහා අවශ්‍යතාව අනුව කාලානුරූපව කටයුතු සිදු කිරීම

- 2015 වසරේ පාර්ලිමේන්තුව මඟින් ණය සම්බන්ධව අසන ප්‍රශ්න 5ක් සඳහා රජය වෙනුවෙන් විදේශ ණය සම්බන්ධ පිළිතුරු සැපයීම.

- විදේශ ණය සම්බන්ධ පැන නඟින ගැටළු සඳහා මනා සම්බන්ධීකරණයක් ඇති කර ගැනීම සඳහා එම නියෝජිතායතන සහ දෙපාර්තමේන්තුවේ අදාළ අංශ සමඟ නිරන්තරයෙන් කටයුතු කිරීම.

# ප්‍රතිපත්ති සැලසුම් අංශය

## ප්‍රතිපත්ති සැලසුම් අංශයේ කාර්යභාර්ය

ශ්‍රී ලංකා රජය විසින් ප්‍රකාශ කර ඇති සංවර්ධන ප්‍රතිපත්ති ප්‍රකාශනය මඟින් ප්‍රමුඛතා පදනම මත හඳුනා ගන්නා ලද සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා වන විදේශ මූල්‍ය ප්‍රභවයන් ආකර්ශනය කර ගැනීම, නිල සංවර්ධන ආධාර උපයෝජනය හා කළමනාකරණය, විදේශ ආධාර සම්බන්ධීකරණ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම යනාදී කාර්යයන් ඉටු කිරීම මෙම අංශයේ මූලික වගකීමයි.

ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම අංශය මඟින් පහත සඳහන් කාර්යයන් ඉටු කරනු ලැබේ.

- රටේ සංවර්ධනය අරමුණු කරගනිමින් රජය විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත සංවර්ධන ව්‍යාපෘතීන් හා වැඩසටහන් සඳහා මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා රේඛීය අමාත්‍යාංශ හා සංවර්ධන පාර්ශ්වකරුවන් සම්බන්ධීකරණය කිරීම.
- රේඛීය අමාත්‍යාංශ මඟින් සකස් කර මෙම දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරනු ලබන ව්‍යාපෘති යෝජනා සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීම.
- ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලත් ව්‍යාපෘති යෝජනා සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබාගැනීමට දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ උපදෙස් පරිදි සුදුසු ආධාර ආයතනයක් වෙත යොමු කිරීම.
- විදේශ ආධාර මඟින් ක්‍රියාත්මක කිරීමට නියමිත නව ව්‍යාපෘති යෝජනා මාලාව පිළියෙල කොට එය යාවත්කාලීන කිරීම.
- ප්‍රකාශන පිළියෙල කිරීම හා සම්බන්ධීකරණය කිරීම, කාර්යසාධන වාර්තාව අයවැයට අදාළ දෙපාර්තමේන්තු ප්‍රකාශනය සකස් කිරීම.
- ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව සඳහා විදේශාධාර පරිච්ඡේදය සකස් කිරීම.
- විදේශ ආධාර උපයෝජනය සම්බන්ධ අදාළ චක්‍රලේඛ නිකුත් කිරීම.
- මුදල් අමාත්‍යාංශය සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයට අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සඳහා දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ නියමිත වේලාවට ඉදිරිපත් කිරීම හා සම්බන්ධීකරණය කිරීම.
- 2016 වසර සඳහා ක්‍රියාත්මක හා නව ව්‍යාපෘති යෝජනා ඇතුලත් විදේශ මූල්‍යයන අයවැය ඇස්තමේන්තුව පිළියෙල කිරීම හා සම්බන්ධීකරණය කිරීම.
- විදේශ මූල්‍යයනය සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශ ලේකම්, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙතින් විවිධ ආයතන මඟින් සිදු කරනු ලබන ඉල්ලීම් සඳහා අවශ්‍යතාව අනුව කාලානුරූපව කටයුතු සිදු කිරීම.
- විදේශ මූල්‍යයනයට අදාළ විශ්ලේෂණ වාර්තා නියමිත කාලයන්හි සතුටුදායක ලෙස සකස් කිරීම.
- සංවර්ධන ආධාර කණ්ඩායම් සාකච්ඡා හා විදේශ ආධාර රැස්වීම් සම්බන්ධීකරණය කිරීම.

## 2015 වසරේ කාර්යසාධනය

- 2014 වර්ෂය සඳහා කාර්යසාධන වාර්තාව පිළියෙල කිරීම හා ප්‍රකාශයට පත්කිරීම.
- මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ 2014 වසර සඳහා වූ වාර්ෂික වාර්තාව සඳහා විදේශාධාර යන පරිච්ඡේදය පිළියෙල කිරීම.
- ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ "2015 ප්‍රගතිය සහ 2016 සංවර්ධන වැඩසටහන්" ප්‍රකාශනය සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තු පරිච්ඡේදය පිළියෙල කිරීම.
- රේඛීය අමාත්‍යාංශ මඟින් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා 41ක් අදාළ විදේශ ආධාර ප්‍රදාන අංශ වෙත යොමු කිරීම.
- අවබෝධතා ගිවිසුම් 3ක් අත්සන් කිරීම සඳහා අනුමැතිය ලබාදීම.
- 2016 වසර සඳහා ක්‍රියාත්මක හා නව ව්‍යාපෘති යෝජනා ඇතුලත් විදේශ මූල්‍යයනය අයවැය ඇස්තමේන්තුව පිළියෙල කිරීම හා සම්බන්ධීකරණය කිරීම.
- විදේශ මූල්‍යයනය සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශ ලේකම්, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙතින් විවිධ ආයතන මඟින් සිදු කරනු ලබන ඉල්ලීම් සඳහා අවශ්‍යතාව අනුව කාලානුරූපව කටයුතු සිදු කිරීම.
- ඉහළ අධිකාරීන් විසින් විමසන විදේශ මූල්‍යයනයට අදාළ විශ්ලේෂණ වාර්තා නියමිත කාලයට සකස් කිරීම.

# මූල්‍ය විග්‍රහය

## වියදම් පිළිබඳ මූල්‍ය තොරතුරු

විදේශ සම්පත් දෙපාර්තමේන්තුව රජයට ආදායම් උපයා දෙන දෙපාර්තමේන්තුවක් නොවන නිසා එය මුදල් එක්රැස් කිරීමේ ආයතනයක් ලෙස නොසැලකේ. 2015 වර්ෂයේ අයවැය ශීර්ෂ අංක 239 යටතේ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල පුද්ගල පඩිනඩි, ප්‍රාග්ධන වියදම්, අත්තිකාරම් ගිණුම්, පුනරාවර්ථන හා වෙනත් වියදම් සඳහා මෙහෙයවීම් වලට අදාළ මූල්‍ය ප්‍රතිපාදන පහත වගුවෙන් දැක්වේ.

**පුද්ගල පඩිනඩි සඳහා ප්‍රතිපාදන**

| | රුපියල් |
|---|---|
| මුදල් ප්‍රතිපාදන | 59,600,000 |
| **එකතු කලා** | |
| පරිපූරක ප්‍රතිපාදන | - |
| මු.රෙ.66 යටතේ මාරු කිරීම් | 56,000 |
| **අඩු කලා** | |
| මු.රෙ.66 යටතේ මාරු කිරීම් | - |
| **මුළු ප්‍රතිපාදන** | 59,656,000 |
| වසර තුළ වියදම් | 57,454,199 |

**වෙනත් පුනරාවර්ථන වියදම්**

| | රුපියල් |
|---|---|
| මුදල් ප්‍රතිපාදන | 281,930,000 |
| **එකතු කලා** | |
| පරිපූරක ප්‍රතිපාදන | - |
| මු.රෙ.66 යටතේ මාරු කිරීම් | - |
| **අඩු කලා** | |
| මු.රෙ.66 යටතේ මාරු කිරීම් | (8,344,375) |
| **මුළු ප්‍රතිපාදන** | 273,585,625 |
| වසර තුළ වියදම් | 139,513,302 |

**ප්‍රාග්ධන වියදම්**

| වැය සංකේතය | වැය ශීර්ෂය | 2015 ඇස්තමේන්තුව (රු) | 2015 ශුද්ධ ප්‍රතිපාදන (රු) | වියදම් (රු) |
|---|---|---|---|---|
| 2002 | යන්ත්‍ර හා උපකරණ පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 700,000 | 700,000 | 440,110 |
| 2003 | වාහන පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 1,000,000 | 1,000,000 | 427,449 |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ අත්පත් කර ගැනීම | 1,200,000 | 1,200,000 | 13,027 |
| 2103 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 5,000,000 | 5,000,000 | 2,963,801 |
| 2204(21) | ආසියානු සංවර්ධන බැංකුව සාමාන්‍ය ප්‍රාග්ධනය මානව සම්පත් සංවර්ධනය | 547,000,000 | 550,094,900 | 550,094,900 |
| 2204-3- (11) | විදේශීය මාරු කිරීම්-උගන්ඩාවෙහි තාක්ෂණික පුහුණු මධ්‍යස්ථානයක් ඉදි කිරීම | 97,000,000 | 105,199,500 | 105,199,088 |
| 2204-5- (11) | විදේශීය මාරු කිරීම්- ලෝක ආහාර සංවිධානයේ සහල් ආධාර සැපයීම | 2,000,000,000 | 2,000,000,000 | 13,008,172 |
| 2401 | පුහුණු කිරීම් හා හැකියා වර්ධනය | 2,200,000 | 4,920,375 | 4,920,373 |
| 2502 (17) | බදු ප්‍රතිපූර්ණය කිරීම්-විදේශීය නේවාසික නියෝජිත ආයතන | 3,500,000 | 868,500 | 868,127 |
| 2502-4-(13) | විදේශීය මාරු කිරීම් (ආයෝජන) | 5,630,000 | 5,630,000 | 0 |
| | **එකතුව** | **2,663,230,000** | **2,674,613,275** | **677,855,047** |

**අයවැය ප්‍රතිපාදනයන් උපයෝජනයේ සාරාංශය**

| වියදම් විස්තරය | 2015 ඇස්තමේන්තුව රු. | 2015 ශුද්ධ ප්‍රතිපාදන රු. | 2015 සත්‍ය වියදම රු. |
|---|---|---|---|
| පුනරාවර්ථන වියදම් | 341,530,000 | 333,241,625 | 196,967,501 |
| ප්‍රාග්ධන වියදම් | 2,663,230,000 | 2,674,613,275 | 677,855,047 |
| **එකතුව** | **3,004,760,000** | **3,007,854,900** | **874,822,548** |

# අත්තිකාරම් ගිණුම

රාජ්‍ය සේවකයන්ට ණය දීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ එක් අත්තිකාරම් ගිණුමක් ඇත. සමාලෝචිත වර්ෂය තුළ අත්තිකාරම් ගිණුමේ නිශ්චිත සීමාවන් පිළිපැද ඇති අතර එම ගිණුමේ මෙහෙයුම් පහත පරිදි වේ.

| විස්තරය | අනුමත සීමාව රු | සත්‍ය වියදම රු |
|---|---|---|
| වියදම් කිරීමේ උපරිම සීමාව | 4,500,000 | 4,495,686 |
| ලැබීමේ අවම සීමාව | 2,500,000 | 3,715,158 |
| හර ශේෂයේ උපරිම සීමාව | 27,000,000 | 16,845,541 |

## විගණන විමසුම

2015 වර්ෂය තුළ  මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ හා විගණන දෙපාර්තමේන්තුවෙන් විමසුම් 02 ක් ද විගණකාධිපති  දෙපාර්තමේන්තුවෙන් විගණන විමසුම් 06 ක් ද  ලැබී ඇති අතර, සියළුම  විමසුම් සඳහා පිළිතුරු යවා ඇත.

## විසර්ජන ගිණුම

2015 වර්ෂයට අදාළ විසර්ජන ගිණුම  2016  මාර්තු මස 24 වන දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.

## 2015 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා අත්සන් කරන ලද විදේශ ණය මූල්‍යයන එකඟතා

| සංවර්ධන පාර්ශ්වකරු | ගිවිසුම්ගත දිනය | ව්‍යාපෘතිය | ගිවිසුම්ගත විදේශ මුදල් ප්‍රමාණය | | | | වාර්ෂික පොලී අනුපාතිකය | | | පොරොන්දු ගාස්තු | වෙනත් ගාස්තු | සහන කාලය (අවුරුදු) | පරිණත කාලය (අවුරුදු) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ව්‍යවහාරික විනිමය | ප්‍රමාණය (මිලියන | රුපියල් (මිලියන) | ඇ.ඩො. (මිලියන) | පොලී වර්ගය | අනුපාතිකය | අන්තිකය (100 පදනම් අංක | | | | |
| **ද්විපාර්ශ්වීය** | | | | | | | | | | | | | |
| **ජපානය** | 11/8/2015 | ජාතික විදුලිබල හා බෙදාහැරීමේ ජාල සංවර්ධන සහ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය | යෙන් | 23,900 | 26,729.90 | 199.9 | ස්ථාවර | කොටස 1 - 0.3%<br>කොටස 2 - 0.01% | අදාල නොවේ | _ | Front-End- Fee - යෙන් 49,860,000 | 10 | 40 |
| **ප්‍රංශය** | 2/10/2015 | මාලිබොඩ, නාවලපිටිය, වේවැල්වත්ත සහ රාගල උප විදුලි පද්ධති 4 ක් ඉදිකිරීම | යූරෝ | 30 | 4,742.90 | 33.6 | විචල්‍ය | EURIBOR 6 Months | 1.31% | 0.50% | ඇගයීම් ගාස්තු - යූරෝ 150,000 | 5 | 20 |
| | 2/10/2015 | හරිත බලශක්ති සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන | යූරෝ | 22 | 3,478.10 | 24.6 | විචල්‍ය | EURIBOR 6 Months | 1.31% | 0.50% | ඇගයීම් ගාස්තු - යූරෝ 110,000 | 5 | 20 |
| **කොරියාව** | 22/6/2015 | හැටන් - නුවරඑළිය මාර්ගය වැඩිදියුණු කිරීම | වොන් | 19,166.00 | 2,317.20 | 17.3 | ස්ථාවර | 0.15% | අදාල නොවේ | _ | _ | 10 | 40 |
| **ස්පාඤ්ඤය** | 14/12/2015 | ගනේමුල්ල, පොල්ගහවෙල සහ රාජගිරිය ගුවන් පාලම් 3ක් සැපයීම (ද්විපාර්ශ්වික කොටස) | යූරෝ | 37.60 | 5,908.40 | 41.2 | ස්ථාවර | 0.15% | අදාල නොවේ | 0.10% | කළමනාකරණ ගාස්තු - යූරෝ 18,798.32 | 5 | 40 |
| **සෞදි ආධාර** | 30/10/2015 | පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ect | සෞදි අරාබි රියාල් | 225.00 | 8,450.00 | 60 | ස්ථාවර | 2.00% | අදාල නොවේ | _ | _ | 5 | 25 |
| | 30/10/2015 | අපස්මාර රෝග ඒකකය සහ සෞඛ්‍යය මධ්‍යස්ථාන ව්‍යාපෘතිය (අතිරේක මූල්‍ය) | සෞදි අරාබි රියාල් | 45 | 1,690.00 | 12 | ස්ථාවර | 2.00% | අදාල නොවේ | _ | _ | 5 | 20 |
| **අපනයන ණය** | | | | | | | | | | | | | |
| **AB Svensk Export Credit** | 25/5/2015 | රත්මලාන සහ ජා ඇල අපජල පවිත්‍රාගාර පහසුකම් ව්‍යාපෘතිය (ස්වීඩනය)- වැඩිදියුණුව | ඇ.ඩො. | 3.1 | 420.00 | 3.1 | ස්ථාවර | 0.92% | අදාල නොවේ | 0.15% | පරිපාලන ගාස්තු - 0.03% (ණය මුදලින්), කළමනාකරණ ගාස්තු ඇ.ඩො. 91,918.97, සැකසුම් ගාස්තු - ඇ.ඩො. 3,141.69,පොරොන්දු ගාස්තු - ඇ.ඩො. 5260.93 | 10 | 25 |
| **ANZ බැංකුව ඕස්ට්‍රේලියාව** | 29/05/2015 | අම්පාර දිස්ත්‍රික්කයේ ප්‍රදේශ සඳහා වූ ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය | ඇ.ඩො. | 7.5 | 1,007.20 | 7.5 | විචල්‍ය | LIBOR 6 Months for US$ | 1% | – | සහතික ගාස්තු - ඇ.ඩො. - 14,495,000 | 3 | 14 |

## 2015 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා අත්සන් කරන ලද විදේශ ණය මූල්‍යයන එකඟතා, ඉතිරිය....

| සංවර්ධන පාර්ශ්වකරු | ගිවිසුම්ගත දිනය | ව්‍යාපෘතිය | ගිවිසුම්ගත විදේශ මුදල් ප්‍රමාණය | | | වාර්ෂික පොලී අනුපාතිකය | | අන්තිකය (100 පදනම් අංක | පොරොන්දු ගාස්තු | වෙනත් ගාස්තු | සහන කාලය (අවුරුදු) | පරිණත කාලය (අවුරුදු) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ව්‍යවහාරික විනිමය | ප්‍රමාණය (මිලියන | ඇ.ඩො. (මිලියන) | පොලී වර්ගය | අනුපාතිකය | | | | | |
| **Banco Bilbao Vizcaya Argentaria ආයතනය** | 14/12/2015 | ගනේමුල්ල, පොල්ගහවෙල සහ රාජගිරිය ගුවන් පාලම් 3ක් සම්පාදනය කිරීම (අපනයන ණය) | යූරෝ | 16.10 | 17.7 | විචල්‍ය | EURIBOR 6 Months | 1.95% | – | කළමනාකරණ ගාස්තු - යූරෝ 80,564.24 | 3 | 13 |
| **Export Finance & Insurance Corporation** | 17/12/2015 | සායනික අපද්‍රව්‍ය බැහැර කිරීමේ පද්ධතියක් හා එයට අදාළ උපකරණ මිලදී ගැනීම් සම්පාදනය කිරීම | ඇ.ඩො. | 13.80 | 13.8 | විචල්‍ය | LIBOR 6 Months for US$ | 1% | – | වෙනත් - ඇ.ඩො. 243,106 සහ ඇ.ඩො. 100,00 | 2 | 11 |
| **HSBC බැංකුව (ඩෙන්මාර්ක් EKF වගකීම සහිතව)** | 14/8/2015 | බඩල්ගම කිරි සැකසුම් මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම | යූරෝ | 66.60 | 74.20 | විචල්‍ය | LIBOR 6 Months for US$ | කොටස 1 - 5%<br>කොටස 2 - 1.9% | –<br>0.50% | ගොඩනැගීමේ ගාස්තු - යූරෝ 9,975,863<br>ගොඩනැගීමේ ගාස්තු - යූරෝ 285,759, බදුවලින් ඇති ගාස්තු - 2,234,919 | 3 | 13 |
| **බහුපාර්ශ්වීය** | | | | | | | | | | | | |
| **ආසියානු සංවර්ධන බැංකුව** | 28/5/2015 | ඒකාබද්ධ මාර්ග සංවර්ධන වැඩසටහන දෙවන අදියර | වි.ගැ.හි. | 6.1 | 8.6 | ස්ථාවර | 2% | අදාල නොවේ | _ | - | 5 | 25 |
| | 28/5/2015 | ඒකාබද්ධ මාර්ග සංවර්ධන වැඩසටහන දෙවන අදියර | ඇ.ඩො. | 98 | 98 | විචල්‍ය | LIBOR 6 Months for US$ | 0.50% | 0.15% | පරිණත වාරික 0.1% | 5 | 25 |
| | 17/9/2015 | මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - 1 කොටස | වි.ගැ.හි. | 53.6 | 71.8 | ස්ථාවර | 2% | අදාල නොවේ | _ | - | 5 | 25 |
| | 17/9/2015 | මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - 1 කොටස | ඇ.ඩො. | 76 | 76 | විචල්‍ය | LIBOR 6 Months for US$ | 0.50% | 0.15% | පරිණත වාරික 0.1% | 5 | 25 |
| | 11/12/2015 | ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන - ණය වාරිකය 3 | ඇ.ඩො. | 175 | 175 | විචල්‍ය | LIBOR 6 Months for US$ | 0.50% | 0.15% | - | 5 | 25 |
| | 11/12/2015 | ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන - ණය වාරිකය 3 | වි.ගැ.හි. | 17.7 | 24.3 | ස්ථාවර | 2.00% | අදාල නොවේ | _ | _ | 5 | 25 |

## 2015 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා අත්සන් කරන ලද විදේශ ණය මූල්‍යයන එකඟතා, ඉතිරිය....

| සංවර්ධන පාර්ශ්වකරු | ගිවිසුම්ගත දිනය | ව්‍යාපෘතිය | ගිවිසුම්ගත විදේශ මුදල් ප්‍රමාණය | | | වාර්ෂික පොලී අනුපාතිකය | | අන්තිකය (100 පදනම් අංක | පොරොන්දු ගාස්තු | වෙනත් ගාස්තු | සහන කාලය (අවුරුදු) | පරිණත කාලය (අවුරුදු) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ව්‍යවහාරික විනිමය | ප්‍රමාණය (මිලියන | ඇ.ඩො. (මිලියන) | පොලී වර්ගය | අනුපාතිකය | | | | | |
| ලෝක බැංකුව - අන්තර්ජාතික සංවර්ධන සංගමය | 06/11/2015 | ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | වි.ගැ.හි. | 117.4 | 163.2 | ස්ථාවර | 1.26% | අදාල නොවේ | 0.50% | සේවා ගාස්තු (0.75%) | 5 | 25 |
| | 23/10/2015 | මුල් ළමාවිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | වි.ගැ.හි. | 35.6 | 50 | ස්ථාවර | 1.25% | අදාල නොවේ | 0.50% | සේවා ගාස්තු (0.75%) | 5 | 25 |
| | 09/12/2015 | උතුරු නැගෙනහිර පළාත් සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය | වි.ගැ.හි. | 14.3 | 19.6 | ස්ථාවර | 1.25% | අදාල නොවේ | 0.50% | සේවා ගාස්තු (0.75%) | 5 | 25 |
| අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල | 26/6/2015 | බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | ඇ.ඩො. | 17 | 17 | ස්ථාවර | 2.60% | අදාල නොවේ | _ | සේවා ගාස්තු (1%) | 5 | 20 |
| | 26/6/2015 | බදුල්ල සිට චෙන්කලාඩි දක්වා මාර්ගයේ ප්‍රතිසංස්කරණය | ඇ.ඩො. | 60 | 60 | ස්ථාවර | 2.50% | අදාල නොවේ | _ | සේවා ගාස්තු (1%) | 5 | 20 |
| | | | එකතුව | | 1,268.40 | | | | | | | |

*සටහන :* 1. LIBOR - ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතිකය

2. EURIBOR - යුරෝපීය අන්තර් බැංකු අර්පණ අනුපාතිකය

3. ඒ ඒ විදේශ මුදල් විනිමය ඒකකයෙන් අත්සන් කරන ලද මුදල් ප්‍රමාණයන්ට අදාළ ඇ.ඩො. හා රුපියල් ප්‍රමාණයන් ගණනය කිරීමේදී ඒ ඒ ගිවිසුම් අත්සන් කළ දිනයේ පැවති විනිමය අනුපාතිකයන් භාවිත කර ඇත.

4. රාජ්‍ය ව්‍යාපාරයන් මඟින් ඇතිකරගත් එකඟතාවයන් මෙහි අන්තර්ගත නොවේ

## 2015 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා අත්සන් කරන ලද විදේශ ප්‍රදාන ආධාර ගිවිසුම් ලැයිස්තුව

| සංවර්ධන පාර්ශ්වකරුවන්/ණයදෙන නියෝජිතායතන | අත්සන් කල දිනය | ව්‍යාපෘතිය | ගිවිසුම්ගත විදේශ මුදල් ප්‍රමාණය | | |
|---|---|---|---|---|---|
| | | | ව්‍යවහාරික විනිමය | ප්‍රමාණය (මිලියන) | ඇ.ඩො. (මිලියන) |
| **ද්විපාර්ශ්වීය** | | | | | |
| ඉන්දියාව | 11/27/2015 | පුළුල් හදිසි ප්‍රතිචාර සේවා - අදියර 1 | ඇ.ඩො. | 7.6 | 7.6 |
| ජපානය | 8/14/2015 | ජපන් දේශීය නිෂ්පාදන සැපයීම සඳහා ජපාන ව්‍යාපෘති නොවන ආධාර 2014 | යෙන් | 500.0 | 4.1 |
| කොරියාව | 6/22/2015 | ශ්‍රී ලංකාවේ අධිකරණ විද්‍යා ආයතන හා නිලධාරීන් සඳහා ධාරිතාවය නැංවීමේ ව්‍යාපෘතිය | ඇ.ඩො. | 3.2 | 3.2 |
| ජර්මනිය | 11/26/2015 | සමාජ ඒකාබද්ධතා (ESC) සඳහා වූ අධ්‍යාපනය | යූරෝ | 4.0 | 4.2 |
| | 4/24/2015 | විල්පත්තු ජාතික වනෝද්‍යානය හා ස්වාරක්ෂක කලාප කළමනාකරණය | යූරෝ | 2.0 | 2.2 |
| ඇමරිකා එක්සත් ජනපදය | 8/20/2015 | ශක්තිමත් හවුලක් සඳහා වූ සමාජ ඒකාබද්ධතාවය | ඇ.ඩො. | 2.1 | 2.1 |
| **බහුපාර්ශ්වීය** | | | | | |
| ආහාර හා කෘෂිකර්ම සංවිධානය | 2/25/2015 | කෘෂි ආර්ථික සංවර්ධන ව්‍යාපෘතිය | කැනේඩියානු ඩොලර් | 3.0 | 2.4 |
| එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන | 9/23/2015 | ජෛව විවිධත්ව සංරක්ෂණය හා පාරිසරික අධි සංවේදී ප්‍රදේශ තුළ පරිසර පද්ධති සේවා පෝෂණය ඉහළ නැංවීම | ඇ.ඩො. | 9.1 | 9.1 |
| | 11/4/2015 | ශ්‍රී ලංකාවේ කඩිනම් සංවර්ධන ක්‍රියාවලිය තුළ ගෝලීය පරිසර අවශ්‍යතා සහ මනා ප්‍රතිපත්ති ප්‍රවාහගත කිරීම පිළිබඳ සහතික කිරීම | ඇ.ඩො. | 1.0 | 1.0 |
| ලෝක ආහාර වැඩසටහන | 4/10/2015 | දිගුකාලීන සහන සහ ප්‍රතිෂ්ඨාපන වැඩසටහන | ඇ.ඩො. | 29.3 | 29.3 |
| **එකතුව** | | | | | **65.2** |